ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය



වාර්ෂික වාර්තාව

2020

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව – 2020

දැක්ම



“අණුක ජීවන විද්‍යාවන්හි
අන්තර්ජාතික
විශිෂ්ට කේන්ද්‍රස්ථානයක්
බවට පත් වීම”

මෙහෙවර



2020 ACHIEVEMENTS

NEW APPOINTMENTS



Prof. O.V.D.S.J. Weerasena
Professor (Merit)
2019.01.31



Ms. Sudeni Peiris
Deputy Bursar
2020.12.01



Dr. Kanishka Senathilake
Post- Doctoral Research Fellow
2020.12.15



Dr. Dilusha Fernando
Scientific Assistant BDU
2020.07.31



Dr. Harindra Sathkumara
Post- Doctoral Research Fellow
2020.12.15



Ms. Kaveesha Banadara
Scientific Assistant IT
2020.08.07



Mr. James Thambyrajah
Assistant Lecturer (CMI)
2020.02.24



Ms. Uma Rajagopalan
Scientific Assistant Cell Biology
2020.10.19



Ms. Joanne Kotelawala
Assistant Lecturer (MLS)
2020.12.01

DISSEMINATION OF KNOWLEDGE

SHORT COURSES AND TRAINING PROGRAMMES

Seminar on Simultaneous multiplexed (to 800-plex) detection of mRNA, Proteins and DNA using single –molecule optical barcodes was conducted.



In-plant training of 3 months was completed by Ms. M.N. Fara Nifla (an undergraduate student from University of Wayamba).



Practical Demonstration on Restriction Enzyme Digestion on 10th March 2020 for 09 undergraduate students was conducted by Dr Sumadee De Silva and Dr Tharmini Sundralingam.



Demonstration on Real Time PCR on 17th January 2020 for undergraduate students participated from Wayamba University of Sri Lanka conducted by Dr Nilupa Gunaratna



Demonstration on DNA Sequencing on 17th January 2020 for undergraduate students participated from Wayamba University of Sri Lanka conducted by Dr Ruwandi Ranasinghe, Ms Joanne Koelawala and Ms Anjana Welikala



AWARDS



Vice Chancellor's Award for Research Excellence 2019 was received by Prof Shiroma Handunnetti



President's Award for Scientific Publications in Year 2018 were received by Prof Shiroma Handunneti and Dr Narmada Fernando.



Senate Award for Research Excellence 2019 was received by Prof Kamani Tennekoon, Dr Sumadee de Silva and Dr Sameera Samarakoon



Senate Award for Research Excellence 2018 was received by Prof OWDSJ Weerasera, Prof Kamani Tennekoon, and Dr Sameera Samarakoon



James Thambyrajah received the Third prize in the oral presentations in the 29th Annual Scientific Sessions, Sri Lanka Collage of Microbiologists





Yenuli Fernando (A/L Student) who completed her research project at IBMBB received SLMA Prize for the best poster received at the133rd Anniversary International Medical Congress 2020 for the poster presentation titled "Risk Factors and School Absenteeism in Children with Asthma from an Urban Area of Sri Lanka" .

PMLP Fernando and Yenuli Fernando, who have carried out their research at IBMBB, were selected to present their findings at the World Science Day organized by the National Science Foundation on 20th November 2020.



INTERNATIONAL RESEARCH FUNDING RECEIVED

Rs. 2,314,254.38

Source : ICGEB Grant

Source : Indo Sri Lanka Grant

අධ්‍යක්ෂතුමියගේ සමාලෝචනය



IBMBB ආයතනයෙහි මූලික ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් වන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති රාමුවෙහි (SLQF) 8 - 12 මට්ටම්වලට අදාළ විද්‍යාපති (MSc), දර්ශනපති (MPhil) සහ ආචාර්ය උපාධි (PhD) වැඩසටහන් ඇතුළු පශ්චාත් උපාධි වැඩසටහන්ය. IBMBB ආයතනය උපාධි අපේක්ෂකයන් ඇතුළත් කර නොගත්තද, කොළඹ විශ්වවිද්‍යාලයෙහි සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල උපාධි අපේක්ෂකයන් සඳහා වන අධ්‍යයන වැඩසටහන්වලට දායකත්වය දක්වයි.

IBMBB ආයතනය 2019 වසරෙහි සිට සංශෝධිත විෂයමාලාවන් සහිත විද්‍යාපති උපාධි වැඩසටහන් තුනක් ක්‍රියාත්මක වේ. එනම්, i) අණුක ජීවවිද්‍යා (MLS) ii) සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය (CMI) – සහ iii) ජෛවතොරතුරුවේදය (BI) වේ. මෙම සියලු උපාධි වැඩසටහන්වල (MLS, CMI & BI) විෂයමාලාවන් 2019 ශිෂ්‍ය කණ්ඩායමේ සිට සංශෝධනය කරන ලදී. මෙසේ වර්තමානයෙහි පිරිනමනු ලබන විද්‍යාපති වැඩසටහන් (SLQF 9 මට්ටම) සැලසුම් කර ඇත්තේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා මට්ටමින් (SLQF 8 මට්ටම) නැවැත්විය හැකි විද්‍යාපති උපාධි (SLQF level 9) සහ විද්‍යාපති (MSc) උපාධි (SLQF 10 මට්ටම) වලිනි.කොවිඩ් -19 වසංගත තත්ත්වය පැතිර ගිය 2020 වර්ෂය තුළ මෙම අධ්‍යයන වැඩසටහන් තුනම මිශ්‍ර ඉගෙනුම් පාඨමාලා බවට හරවන ලදී. මෙම විද්‍යාපති උපාධි වැඩසටහන්වල මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අදාළ අණුක ජීවවිද්‍යා, ප්‍රතිශක්තිවේදය, ජෛවතොරතුරුවේදය හා සම ක්ෂේත්‍රයන් කේන්ද්‍ර කර ගත් පුහුණුව සැපයීම සහ දර්ශනසූරී උපාධි (PhD) ලබා ගැනීම සඳහා ඉහළ මට්ටමේ අධ්‍යයනයන් කිරීමට තරුණ උපාධිධාරීන් දිරිමත් කිරීමයි.

දැනුම බෙදාහැරීම උදෙසා පශ්චාත් උපාධි වැඩසටහන්වලට අමතරව IBMBB ආයතනය විසින් කෙටි පුහුණු පාඨමාලා, වැඩමුළු, ආරාධිත දේශන, සීමාවාසික පුහුණු ද පවත්වනු ලැබේ. ඖෂධ රසායන විද්‍යාව සහ ජෛවතාක්ෂණවේදය පිළිබඳ වන සිවුවන විද්‍යාපති පාඨමාලාව මේ වනවිට සැලසුම් කෙරෙමින් පවතී.

2020 වසර තුළ ලබාගත් ජයග්‍රහණයන්හි සාරාංශය

2020 නව ලියාපදිංචිවීම්	විද්‍යාපති	අණුක ජීවවිද්‍යා	15
	විද්‍යාපති	සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	07
	විද්‍යාපති	අණුක ජීවවිද්‍යා	04
	විද්‍යාපති	සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	04
	දර්ශනපති/ දර්ශනසූරී (Phil/PhD)		03
2020 නිමැවුම්	දර්ශනසූරී		02
	විද්‍යාපති	අණුක ජීවවිද්‍යා	06
	විද්‍යාපති	සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	06
	විද්‍යාපති - අණුක ජීවවිද්‍යා		01
	සෛලීය හා අණුක ප්‍රති. විද්‍යා ප.උ.ඩි.		01
ප්‍රකාශන	සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා	සුවිගත ජාත්‍යන්තර සඟරා	25
	සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා	සුවිගත නොවූ සඟරා	01
	පර්යේෂණ සන්නිවේදන	දේශීය	13
		ජාත්‍යන්තර	02
ලබාගත් සම්මාන			11

අදාළ විස්තර මෙම වාර්තාවේ වෙනත් ස්ථානයක දැක්වේ.

මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති
අධ්‍යක්ෂ/ අයි.බී.එම්.බී.බී



පටුන

	පිටුව
ඓතිහාසික සමාලෝචනය	08
IBMBB ආයතනයේ අධ්‍යක්ෂවරු	09
ක්ෂණික යොමුව	09
2020 කාර්ය සාධනය කෙටියෙන්	10
සංවිධාන සටහන	11
කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්	12
ජාත්‍යන්තර පිළිගැනීම	13
2020 දී ලබාගත් ජාතික සම්මාන	13
මානව සම්පත් සංවර්ධනයෙහි ලා දැක්වූ දායකත්වය	14
පශ්චාත් උපාධි වැඩසටහන්	14
කෙටි පුහුණු පාඨමාලා	19
පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය	21
විවෘත දිනය	21
පර්යේෂණ ක්‍රියාකාරකම්	22
පරපෝෂිත හා බෝවන රෝග පිළිබඳ පර්යේෂණ වැඩසටහන	22
අණුක වෛද්‍ය විද්‍යාව	28
ශාක අණුක ජෛවවේදය හා ශාක පරිවෘත්තීය	33
ක්ෂුද්‍රජීවීන්ගේ ජෛවරසායනය හා අණුක ජීව විද්‍යාව	35
ඖෂධීය ශාක	35
කාර්මික යෙදවුම්	37
ශ්‍රී ලංකාවේ සත්ත්ව විශේෂවල අණුක හඳුනාගැනීම	38
භාවනාව හා සෞඛ්‍යය පර්යේෂණ වැඩසටහන	38
සේවා	39
2020 දී BDU යටතේ ක්‍රියාත්මක ක්‍රියාකාරකම්	39
තත්ත්ව සහතික කුටිය – IBMBB	40
IBMBB වෙත පැමිණි අමුත්තන්	41
කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව	41
බාධක	42
කාර්ය මණ්ඩල සංවර්ධනය හා සුබසාධක කටයුතු	43
මානව සම්පත්	44
සේවක වර්ගීකරණය 2020 දෙසැම්බර් 31 දිනට	44

පර්යේෂණ ප්‍රකාශන 46

පර්යේෂණ සන්නිවේදනයන් 50

පරිසරය සුරැකීම සඳහා වූ ක්‍රියාකාරකම් පිළිබඳ අනාගත වාර්තාව 52

වගුව 1: 2020 දී ක්‍රියාත්මක දර්ශනසූරී/ දර්ශනපති උපාධි හා නව ලියාපදිංචිවීම් 54

වගුව 2: 2020 දී IBMBB විද්‍යාගාරවල අධ්‍යයන සංරචකයක නිරත
වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි සිසුන් 60

වගුව 3: පර්යේෂණ අරමුදල් සැපයීම -2020 61

වගුව 4: 2020 විභාග සඳහා ඉදිරිපත් කළ දර්ශනපති/ දර්ශනසූරී නිබන්ධන 63

වගුව 5: විද්‍යාපති නිබන්ධන හා පිරිනැමූ උපාධි 2020 - අණුක ජීවවිද්‍යා 64

වගුව 6: විද්‍යාපති නිබන්ධන හා පිරිනැමූ උපාධි 2020 –
සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය 65

වගුව 7: 2020 උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනැමුණු දර්ශනසූරී/ දර්ශනපති උපාධි 66

වගුව 8: (අ) 2020 උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනැමුණු :විද්‍යාපති උපාධි 66

වගුව 8: (ආ) 2020 උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනැමුණු ප.උ. ඩිප්ලෝමා 66

වගුව 9: පර්යේෂණ සහයකයින් 67

වාර්ෂික මූල්‍ය වාර්තාව 69

2020 වසරේ අභ්‍යන්තර විගණන කාර්ය පිළිබඳ සමාලෝචනය 85

2020 සීමාවන් 86

2021 සඳහා කාර්ය සැලැස්ම 87

2020 විගණන වාර්තාව 89

2020 වාර්ෂික වාර්තාවෙහි සහ ගිණුම් සාරාංශය
සම්පත්, සිසුන් හා ආචාර්ය මණ්ඩලයෙහි තොරතුරු 95
පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු, පර්යේෂණ, 96
නවෝත්පාදන හා ප්‍රකාශන, වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු
ප්‍රදානයන් සහ වැයවීම් විස්තර (ප්‍රාග්ධන, පුනරාවර්තන, ව්‍යාපෘති) 97
මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු 98
2020 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 99

සිසුන් පිළිබඳ සමුච්චිත සාරාංශය - විද්‍යාපති හා MPhil/ PhD උපාධි වැඩසටහන් 100

ඓතිහාසික සමාලෝචනය

21 වන සියවස පාලනය වනු ඇත්තේ තොරතුරු හා පරිගණක තාක්ෂණය සහ අණුක ජීවවිද්‍යාව යන විෂයයන් මගිනි. අන් ජාතීන්ට සාපේක්ෂව විද්‍යාව හා දැනුම මත පදනම් වූ සංවර්ධනය උදෙසා ආයෝජනය කළ ජාතීන් සැලකියයුතු ප්‍රගතියක් ලබා ඇත. සිය අසල්වැසි රටවල් බොහෝ ඉදිරියෙන් සිටියද ශ්‍රී ලංකාව තවමත් ජෛවතාක්ෂණවේදය හා සම ක්ෂේත්‍රයන්හි විශාල ප්‍රගතියක් ලැබීමට තවමත් සමත්ව නැත. ජෛවතාක්ෂණවේදය හා සම ක්ෂේත්‍රයන් මත පදනම් වූ කර්මාන්තයන්හි හිඟකමට ප්‍රධාන හේතුව වන්නේ එම ක්ෂේත්‍රයෙහි පුහුණු මානව සම්පත හිඟකමයි.

කොළඹ විශ්වවිද්‍යාලයෙහි ස්වාධීන ආයතනයක් ලෙස ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය (IBMBB) ස්ථාපිත කරන ලද්දේ ආයතනය සහ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන් තුළ උපදෙස්, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධනය සහ උපදේශනය සැපයීම අරමුණු කරගනිමිනි. සංවර්ධනය වෙමින් පවතින රටවල් සමග පර්යේෂණ සහයෝගිතාව සඳහා වූ ස්වීඩන ඒජන්සියෙහි (Sida/ SAREC) ආධාරයෙන් අණුක ජීවවිද්‍යාව පිළිබඳව මහාචාර්ය එරික් එච්. කරුණානායකගේ නායකත්වයෙන් යුතුව දියත් කරන ලද ඉතාම සාර්ථක පර්යේෂණ වැඩ සටහනක කුඨප්‍රාප්තිය විය. IBMBB ගොඩනැගිල්ල ඉදි කිරීම හා උපකරණ ලබාදෙන ලද්දේ ආයෝජන දෙපාර්තමේන්තුව (Sida/ INEC) විසිනි. මේ සඳහා ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය (SIDA) විසින් ශ්‍රී ලංකා රජයට ස්වීඩන ක්‍රෝනර් (SEK) මිලියන 15ක සුලභ ණයක් ප්‍රදානය කරන ලදී.

2004 අප්‍රේල් 28 වන දින IBMBB ආයතනය උත්සවාකාරයෙන් විවෘත කරන ලද්දේ කොළඹ ස්වීඩන තානාපති කාර්යාලයේ දූත මණ්ඩල ප්‍රධානී ගරු ඇන් මේරි ෆැලනියස් මැතිනිය සහ ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලයෙහි උප මණ්ඩපාධිපති මහාචාර්ය උල්ෆ් පීටර්සන් විසිනි. 2003 අප්‍රේල් 03 වන දින සහ අංක 1282/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අදාළ ආඥා පණත නිකුත් කරන ලදී. IBMBB ගොඩනැගිල්ල කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇත. IBMBB ගොඩනැගිල්ල අණුක ජීවවිද්‍යා ක්ෂේත්‍රයෙහි භාවිතවන නවීනතම උපකරණ වන පූර්ණ ස්වයංක්‍රීය DNA අනුක්‍රමයන්, මයික්‍රෝ ඇරේස්කෑනර්, FPLC, HPLC, ප්‍රතිදීප්ත සහ කලා අසමතා අන්වීක්ෂ (Fluorescenes and phase Contrast microscope) සහ laminar floor hoods සහ සත්ත්ව හා ශාක පටක විද්‍යාගාරය තුළ වර්ධනය කිරීමේ පහසුකම්, පර්යේෂණ සත්වාගාර, ශීතාගාර, ස්ථානීය ජාලකරණය (LAN), විශේෂ ප්‍රකාශ තන්තු කේබල් මගින් අන්තර්ජාල ප්‍රවේශය ආදියෙන් සමන්විත වන අතර සම්පූර්ණයෙන් වායුසමීකරණය කර ඇත. IBMBB ආයතනය සිය පර්යේෂණ කටයුතු අරඹන ලද්දේ 2004 ජූනි මාසයේය. 2004 දී මහාචාර්ය එරික් කරුණානායකගේ සුපරීක්ෂණයෙන් දර්ශනපති හා දර්ශනසූරී උපාධි සඳහා හැදෑරුම් කරමින් සිටි සිසුහු සිය අධ්‍යයන කටයුතු IBMBB ආයතනයෙන් සිදුකළ අතර පර්යේෂණ උපාධි සඳහා නව සිසුන් බඳවා ගැනීම් ද 2004 දී සිදුවිය. 2005 පෙබරවාරි මස "අණුක ජීවවිද්‍යාව", "සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය" පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලා දෙකක් ආරම්භ විය. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල සමග ඒකාබද්ධ වැඩ සටහනක් ලෙස ජෛව තොරතුරුවේදය පිළිබඳ තෙවන විද්‍යාපති උපාධි වැඩසටහන 2012 මැයි මස ආරම්භ විය

2019 වර්ෂය අග භාගය වන විට මෙම SFQF 8-10 මට්ටම්වලට අනුගාමී වන පරිදි මෙම උපාධි වැඩසටහන්වල විෂයමාලා සංශෝධනය කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවෙන් අනුමත වූ සංශෝධිත අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසි සහිතව සංශෝධිත විෂයමාලා ඉගැන්වීම 2019 දී ආරම්භ වූ අතර 2020 දී ක්‍රියාත්මක විය.

IBMBB අධ්‍යක්ෂවරුන්

වර්තමාන අධ්‍යක්ෂ:

මහාචාර්ය ශිරෝමා එම්. හඳුන්නෙත්ති

පුරෝගාමී අධ්‍යක්ෂ:

මහාචාර්ය එරික් එච්. කරුණානායක	2004 - 2007

පූර්ව අධ්‍යක්ෂවරුන්:

මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්	2007 - 2012
මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්	2013 ජනවාරි- මාර්තු (වැඩබලන අධ්‍යක්ෂ)
මහාචාර්ය එම්.එච්. රිස්වි ෂෙරීෆ්	2013 අප්‍රේල් - 2014 සැප්තැම්බර් (වැඩබලන අධ්‍යක්ෂ)
මහාචාර්ය ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2014 ඔක්තෝම්බර් - 2015 ජනවාරි (වැඩබලන අධ්‍යක්ෂ)
මහාචාර්ය ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2015 පෙබරවාරි - 2019 පෙබරවාරි

ක්ෂණික යොමුව

නිල කාර්යාලය: අංක 90, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව

දුරකථන අංක:

පොදු:	+94-11-2552528
අධ්‍යක්ෂ:	+94-11-2552534
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී:	+94-11-2553672
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී:	+94-11-2553683

ෆැක්ස් අංක:

අධ්‍යක්ෂ:	+94-11-2552529
පොදු :	+94-11-2553683

විද්‍යුත් තැපෑල:

director @ibmbb.cmb.ac.lk
sar@ ibmbb.cmb.ac.lk
sab@ ibmbb.cmb.ac.lk/ db@ibmbb.cmb.ac.lk

විමසීම් :

info@ibmbb.cmb.ac.lk

2020 කාර්ය සාධනය කෙටියෙන්



ලියාපදිංචි සිසුන් හා උපාධිධාරීන් (2015 – 2020)				
වර්ෂය	පාඨමාලාව		ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව	උපාධිධාරීන් සංඛ්‍යාව
2020	විද්‍යාපති (SLQF-9)	අණුක ජීවවිද්‍යා	15	01
		සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	07	00
	විද්‍යාපති (SLQF-10)	අණුක ජීවවිද්‍යා	04	06
		සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	04	06
	සෛලීය හා අණුක ප්‍රති. ප.උ. ඩිප්. (SLQF-8)			01
	දර්ශනපති හා දර්ශනසූරී		02	02
2019	විද්‍යාපති (SLQF-9)	අණුක ජීවවිද්‍යා	10	5
		සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	07	2
		ජෛවතොරතුරුවේදය	19	0
	දර්ශනපති හා දර්ශනසූරී		2	9
2018	MSc (SLQF-10)	අණුක ජීවවිද්‍යා	12	9
		සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	7	6
	දර්ශනපති හා දර්ශනසූරී		5	3
2017	MSc (SLQF-10)	අණුක ජීවවිද්‍යා	7	4
		සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	4	7
	ජෛවතොරතුරුවේදය පිළිබඳ ප.උ.ඩි. (SLQF-8)			1
	දර්ශනපති හා දර්ශනසූරී		5	4
2016	MSc (SLQF-10)	අණුක ජීවවිද්‍යා	11	17
		සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	10	0
	දර්ශනපති හා දර්ශනසූරී		4	1
2015	MSc (SLQF-10)	අණුක ජීවවිද්‍යා	5	5
		සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය	8	6
		ජෛවතොරතුරුවේදය	NA	5
	ජෛවතොරතුරුවේදය පිළිබඳ ප.උ.ඩි (SLQF-8)			2
	දර්ශනපති හා දර්ශනසූරී		6	0

NA - දැන්වීම් පළ නොකළ

සංවිධාන සටහන


රේඛීය අමාත්‍යාංශය
(උසස් අධ්‍යාපන අමාත්‍යාංශය)
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
කොළඹ විශ්ව විද්‍යාලය
උප කුලපති
ජෛව රසායන විද්‍යා, අණුක ජෛවවෛද්‍ය හා ජෛව තාක්ෂණ ආයතනය
ආයතන අධ්‍යක්ෂ සහ පාලක මණ්ඩලය
විගණන කමිටුව
නි.ලේ/
ජේ.ස.ලේ
නි. වු./
ජේ.ස.වු.
ස.ලේ
මූල්‍ය හා කළමණාකාර කමිටුව
පර්යේෂණ හා උසස් උපාධි කමිටුව
අධ්‍යයන කමිටුව
තත්ත්ව පාලන ඒකකය
ව්‍යාපාර සංවර්ධන ඒකකය
අධ්‍යයන මණ්ඩලය - අණුක ජෛව විද්‍යාව
අධ්‍යයන මණ්ඩලය - සෛල හා අණුක ප්‍රතිශක්තිවේදය
අධ්‍යයන මණ්ඩලය - ජෛව තොරතුරුවේදය

අධ්‍යක්ෂ

මහාචාර්ය ශිරෝමා එම්. හඳුන්නෙත්ති

කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්

මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති, අධ්‍යක්ෂ -IBMBB, (සභාපති)

එස්. එස්. ඉවැන්ජලින් මිය, ලේකම් විසින් යෝජිත, අධ්‍යක්ෂ (සංවර්ධන), උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

මහාචාර්ය එරික් එච්. කරුණානායක, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද

මහාචාර්ය අයිරා තාබෘ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද

මහාචාර්ය රමණි විජේසේකර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද

මහාචාර්ය එස්. පී. දැරණියගල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද (2020 ජනවාරි 16 සිට)

තිලක් කරුණාරත්න මයා, පාලක සභාවෙන් නම් කරන ලද

පද්මිණී රණවීර මිය, පාලක සභාවෙන් නම් කරන ලද (2020 ජනවාරි 30 සිට)

මහාචාර්ය ඩබ්. ඉන්දිරා නානායක්කාර, සනාතන සභාවෙන් නම් කරන ලද

මහාචාර්ය සේනක රාජපක්ෂ, සනාතන සභාවෙන් නම් කරන ලද

මහාචාර්ය ජෙනිෆර් පෙරේරා, පීඨාධිපති/වෛද්‍ය, කොළඹ විශ්වවිද්‍යාලය, නිල බලයෙන් පත්වූ (2020 මාර්තු දක්වා)

මහාචාර්ය වජිර දිසානායක, පීඨාධිපති/ වෛද්‍ය, කොළඹ විශ්වවිද්‍යාලය, නිල බලයෙන් පත්වූ (2020 මාර්තු දක්වා)

මහාචාර්ය කේ. ආර්. ආර්. මහානාම, පීඨාධිපති/ විද්‍යා, කොළඹ විශ්වවිද්‍යාලය, නිල බලයෙන් පත්වූ (2020 ජූලි දක්වා)

මහාචාර්ය උපුල් සොන්නාදර, පීඨාධිපති/ විද්‍යා, කොළඹ විශ්වවිද්‍යාලය, නිල බලයෙන් පත්වූ (2020 ජූලි දක්වා)

මහාචාර්ය කේ. පී. හේවාගමගේ, අධ්‍යක්ෂ, පරිගණක විද්‍යාතනය, කොළඹ විශ්වවිද්‍යාලය (UCSC), නිල බලයෙන් පත්වූ)

මහාචාර්ය කිත්මිණි සිරිදේව, අංශ ප්‍රධාන /ජෛව රසායන හා අණුක ජීවවිද්‍යා අංශය, වෛද්‍ය පීඨය, නිල බලයෙන් පත්වූ)

ජාත්‍යන්තර පිළිගැනීම

IBMBB ආයතනය උප්සලා විශ්වවිද්‍යාලයෙහි රසායන විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහනේ (IPICS) අණුක ජීවවිද්‍යාව පිළිබඳ ආසියාවේ සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කළ අතර යුරෝපීය අණුක ජීවවිද්‍යා ජාලයෙහි ජාතික නෝඩය (EMBnet) ලෙසද කටයුතු කළේය.

2020 දී ලබාගත් ජාතික සම්මාන

අ) 2018 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් වූ ජනාධිපති සම්මාන
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති
ආචාර්ය නර්මදා ප්‍රනාන්දු

ආ) පර්යේෂණ විශිෂ්ටත්වය උදෙසා වන උපකුලපති සම්මානය-2019
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති

ඇ) පර්යේෂණ විශිෂ්ටත්වය උදෙසා වන සනාතන සහා සම්මානය -2018
මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන– සනාතන සහා සම්මානය (විවෘත අංශය)
මහාචාර්ය කමනි තෙන්නකෝන් – සනාතන සහා සම්මානය (විවෘත අංශය)
ආචාර්ය සමීර සමරකෝන් – සනාතන සහා සම්මානය (මුල් වෘත්තීය අංශය)

ඈ) පර්යේෂණ විශිෂ්ටත්වය උදෙසා වන සනාතන සහා සම්මානය -2019
මහාචාර්ය කමනි තෙන්නකෝන් - සනාතන සහා සම්මානය (විවෘත අංශය)
ආචාර්ය සුමාධි ද සිල්වා- සනාතන සහා සම්මානය (විවෘත අංශය)
ආචාර්ය සමීර සමරකෝන් - සනාතන සහා සම්මානය (මුල් වෘත්තීය අංශය)

ඉ) ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීව විද්‍යාඥයන්ගේ විද්‍යාලයේ 29 වන වාර්ෂික විද්‍යා සැසියේදී ලැබූ සම්මාන
තම්බිරාජ් ජේ සී, ජයමහ සී ජේ එස්, **රත්නායක ඒ කේ ඩී වී වයි**, **හඳුන්නෙත්ති එස්, ප්‍රනාන්දු එන්**, ශ්‍රී ලංකාවේ රෝග නිර්ණය විද්‍යාගාරයකට ඉදිරිපත් වූ Ganciclovir ප්‍රතිරෝධී සයිලොමෙගා වෛරස ආසාදිත බවට සැක කෙරෙන රෝගීන්ගේ UL97 ජානවල විකෘතිතා හඳුනා ගැනීම සඳහා වන මූලික පරීක්ෂණය OP6
වාචික ඉදිරිපත් කිරීම්වල තෙවන ස්ථානය දිනා ගැනිනි.

ඊ) හොඳම පෝස්ටරය සඳහා SLMA ත්‍යාගය – ජාත්‍යන්තර වෛද්‍ය සංගමයෙහි 133 වන සංවත්සරය 2020
“ශ්‍රී ලංකාවේ නාගරික පරිසරයක් ඇසුරින් ඇදුම රෝගී දරුවන්ගේ පාසල් නොපැමිණීම හා අවදානම් කරුණු” තේමාව සහිත පෝස්ටර් ඉදිරිපත් කිරීම
ප්‍රනාන්දු වයි එන්, අනුරාධා කේ ඩබ් ඩී ඒ, ද සිල්වා යූ, අලහකෝන් එම්, **හඳුන්නෙත්ති එස්**, වික්‍රමසිංහ පී.

මානව සම්පත් සංවර්ධනයෙහි ලා දැක්වූ දායකත්වය

පශ්චාත් උපාධි වැඩසටහන්

MPhil/ PhD වැඩසටහන්: 2020 වර්ෂය තුළ නව දර්ශනපති/ දර්ශනසූරී සිසුහු තිදෙනෙක් ලියාපදිංචි වූහ. IBMBB හි ලියාපදිංචිවූ MPhil/PhD සිසුහු විසිහත් දෙනෙක් සිටියහ. MPhil/PhD උපාධි මත පදනම් වූ පර්යේෂණ වැඩසටහන් පර්යේෂණ ක්‍රියාකාරකම් යටතේ විස්තර කරනු ලැබ ඇත. MPhil/PhD උපාධිය සඳහා වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වූ සිසුවෙක් සිය අධ්‍යයන කටයුතුවල කොටසක් IBMBB හිදී හැදෑරීය. PhD උපාධි අපේක්ෂකයෝ දෙදෙනෙක් සිය නිබන්ධන භාර දුන්හ. PhD උපාධි අපේක්ෂකයෝ දෙදෙනෙක් 2020 දී සිය වාචික පරීක්ෂණ සම්පූර්ණ කළහ. දෙසැම්බර් මස උපාධි ප්‍රදානෝත්සවයේදී PhD උපාධි අපේක්ෂකයන් දෙදෙනෙකුට උපාධි පිරිනැමිනි .

(MPhil/PhD සිසුන් ලැයිස්තුව සඳහා 1 හා 2 වගු ද, කෙරෙමින් පවතින හා නව පර්යේෂණ වැඩසටහන්වල අරමුදල්කරණය ගැන දැන ගැනීමට 3 වගුවද බලන්න) 2020 දී සිය විභාග කටයුතු සම්පූර්ණ කරමින් සිටින MPhil හා MSc සිසුන්ගේ විස්තර 5, 6, 7 හා 8 වගුවල දැකිය හැක.

විද්‍යාපති (MSc) වැඩසටහන: මාර්තු මාසයේදී, සංශෝධිත විෂයමාලා සහිත අණුක ජීවවිද්‍යා හා සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය උපාධි වැඩසටහන් උදෙසා නව සිසුන් කණ්ඩායම් බඳවා ගන්නා ලදී. එසේ බඳවා ගන්නා ලද්දේ අදාළ වැඩසටහන්වල දහසයවන හා දහ හතරවන කණ්ඩායම්ය. සංශෝධිත විෂයමාලා සහිතව විද්‍යාපති (SLQF 9) සඳහා ලියාපදිංචි වූ දෙවන කණ්ඩායම අණුක ජීවවිද්‍යා විද්‍යාපති (MLS) සිසුන් පහලොස් දෙනෙකු සහ සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය විද්‍යාපති (CMI) සිසුන් හත්දෙනෙකුගෙන් සමන්විත වේ.

2020 දී අණුක ජීවවිද්‍යා විද්‍යාපති සිසුන් දාහතර දෙනෙක් සහ සෛලීය හා අණුක ප්‍රතිශක්තිවේදය විද්‍යාපති සිසුන් දහතුන් දෙනෙක් සිය පර්යේෂණ ව්‍යාපෘති කරගෙන ගියහ. 2020 දී අණුක ජීවවිද්‍යා විද්‍යාපති සිසුන් හත්දෙනෙක් සහ සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය විද්‍යාපති සිසුන් අටදෙනෙක් සිය අවසාන නිබන්ධන භාර දුන්හ. 2020 අප්‍රේල් මාසයේ සහ නැවත එම සැප්තැම්බර් මාසයේදී කොවිඩ් වසංගතය නිසා අධ්‍යයන කටයුතුවලට බාධා පැමිණි බැවින් අණුක ජීවවිද්‍යා විද්‍යාපති සිසුන් හත්දෙනෙකුගේ සහ සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය විද්‍යාපති සිසුන් පස්දෙනෙකුගේ පර්යේෂණ ව්‍යාපෘති කටයුතු ප්‍රමාද විය. (විස්තර සඳහා 5 හා 6 වගු බලන්න).

2020 වසරේදී, හොඳම අණුක ජීවවිද්‍යා විද්‍යාපති සිසුවාට පිරිනැමෙන මහාචාර්ය එරික් එච්. කරුණානායක රන් පදක්කම අමාලි ජයවික්‍රම මෙනවිය විසින් දිනාගන්නා ලදී. හොඳම සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති සිසුවාට පිරිනැමෙන ග්ලැක්සෝ ස්මිත්ක්ලයින් රන් පදක්කම ජනිතා ඉද්දගොඩ මෙනවිය විසින් දිනාගන්නා ලදී. අණුක ජීවවිද්‍යා සිසුන් හය දෙනෙක් හා සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය සිසුන් හයදෙනෙක් වශයෙන් සමස්ත සිසුහු දොලොස්දෙනෙක් සිය MSc උපාධිය සම්පූර්ණ කළහ. එක් සිසුවකු අණුක ජීවවිද්‍යා විද්‍යාපති උපාධියක් ලබා ගනිමින් MLS වැඩසටහන වැඩසටහන හැර යාමට තීරණය කළ අතර තවත් සිසුවෙක් සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගනිමින් CMI වැඩසටහන හැර යාමට තීරණය කරන ලදී.

පහත සඳහන් කාර්ය මණ්ඩල සාමාජිකයෝ වැඩසටහන් සම්බන්ධීකාරක සහ සම/ සහකාර සම්බන්ධීකාරකවරුන් ලෙස කටයුතු කළහ:

මහාචාර්ය ඕවීඩීඑස්ජේ වීරසේන - වැඩසටහන් සම්බන්ධීකාරක, අණුක ජීවවිද්‍යා පිළිබඳ විද්‍යාපති
ආචාර්ය සුදේශිනී හේවගේ- සහකාර වැඩසටහන් සම්බන්ධීකාරක, අණුක ජීවවිද්‍යා පිළිබඳ විද්‍යාපති
ආචාර්ය සිසිර පතිරණ - වැඩසටහන් සම්බන්ධීකාරක, සෛලීය හා අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති
ආචාර්ය නර්මදා ප්‍රනාන්දු - සහකාර වැඩසටහන් සම්බන්ධීකාරක, CMI පිළිබඳ විද්‍යාපති
රූපිකා විජේසිංහ මිය- වැඩසටහන් සම්බන්ධීකාරක, ජෛවතොරතුරුවේදය පිළිබඳ විද්‍යාපති , UCSC
ආචාර්ය රුවන්දි රණසිංහ- වැඩසටහන් සම්බන්ධීකාරක, ජෛවතොරතුරුවේදය පිළිබඳ විද්‍යාපති, IBMBB

2020 දී පත්කරන ලද නව වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් මෙසේය.

ආචාර්ය සුමාධි ද සිල්වා- වැඩසටහන් සම්බන්ධීකාරක, ජෛවතොරතුරුවේදය පිළිබඳ විද්‍යාපති (2021 ඇතුළත් කර ගැනීම්)

පහත සඳහන් ආචාර්ය මණ්ඩල සාමාජිකයෝ / බාහිර කථිකාචාර්යවරු **අණුක ජෛවවේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව** සඳහා දේශන පැවැත්වූහ:

මහාචාර්ය එරික් එච්. කරුණානායක, ජෛවරසායන විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය හා පුරෝගාමී අධ්‍යක්ෂ, IBMBB
මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්, අණුක ජීවවිද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය , IBMBB
මහාචාර්ය අයිරා තාබෘ, බාහිර මහාචාර්ය , IBMBB
මහාචාර්ය වසන්ති අර්සරත්නම්, ජෛවරසායන විද්‍යාව ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
මහාචාර්ය නිමල් පුණ්‍යසිරි, ජෛවරසායන විද්‍යා මහාචාර්ය, IBMBB
මහාචාර්ය ටී.එල්.එස්. තිරිමාන්න, ශාක විද්‍යා මහාචාර්ය, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය නිලන්ති දසනායක, උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මහාචාර්ය කාන්තා ලංකාතිලක, ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ශලිනි ශ්‍රී රංගනාදන්, ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන, අණුක ජීවවිද්‍යාව පිළිබඳ මහාචාර්ය, IBMBB
ආචාර්ය නලින්ද සිල්වා, කායික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ආචාර්ය සුමාධි ද සිල්වා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
ආචාර්ය සුදේශිනී හේවගේ, කථිකාචාර්ය, IBMBB
ආචාර්ය සමීර සමරකෝන්, කථිකාචාර්ය, IBMBB
ආචාර්ය රුවන්දි රණසිංහ, විද්‍යාත්මක සහකාර, IBMBB
ආචාර්ය නිලූපා ගුණරත්න, විද්‍යාත්මක සහකාර, IBMBB
නිෂාරා බටගොඩ මිය, විද්‍යාත්මක සහකාර, IBMBB
ආචාර්ය ටී. සුන්දරලිංගම්, තාවකාලික සහකාර කථිකාචාර්ය, IBMBB (2020.10.18 දක්වා)
අංජනා වැලිකල මිය, තාවකාලික විද්‍යාත්මක/ ඉගෙනුම් සහකාර, IBMBB (2020.12.31 දක්වා)
ජොඇන් කොතලාවල මිය, තාවකාලික සහකාර කථිකාචාර්ය, IBMBB (2020.12.01 සිට)

පහත සඳහන් ආචාර්ය මණ්ඩල සාමාජිකයෝ/ බාහිර කථිකාචාර්යවරුන් **සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති උපාධි** ඉගෙනුම් කටයුතුවලට දායක වූහ :

මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති, අධ්‍යක්ෂ හා ප්‍රතිශක්තිවේද මහාචාර්ය, IBMBB
මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්, අණුක ජීවවිද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, IBMBB
මහාචාර්ය සුනිල් ප්‍රේමවංස, සත්වවිද්‍යා මහාචාර්ය, සත්වවිද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ශලිනි ශ්‍රී රංගනාදන්, ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ටී.එල්.එස්. තිරිමාන්න, ශාක විද්‍යා මහාචාර්ය, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ෂාමිනී ගුණවර්ධන, පිළිලවේදය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන, අණුක ජීවවිද්‍යාව පිළිබඳ මහාචාර්ය, IBMBB
ආචාර්ය ඉනෝකා කොරයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ක්ෂුද්‍රජීවවිද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
වෛද්‍ය ධනුෂ්කා දසනායක, ප්‍රතිශක්තිකරණ විශේෂඥ වෛද්‍ය, ශික්ෂණ රෝහල, මහනුවර.
ආචාර්ය නර්මදා ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
ආචාර්ය තුසිත ගජනායක, හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හොරයිසන් කැම්පස්, මාලඹේ
වෛද්‍ය සමිත ගිනිගේ, සහකාර වසංගතවේද විද්‍යාඥ, වසංගතවේද ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ 8
වෛද්‍ය බද්ධිකා ජයරත්න, රක්තවේද විශේෂඥ, ශ්‍රී ලංකා ජාතික රෝහල
මහාචාර්ය කාන්තා ලංකාතිලක, ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
වෛද්‍ය කාන්ති නානායක්කාර, වෛරසවේදය හා එන්නත්කරණය පිළිබඳ විශේෂඥ, වෛද්‍ය පර්යේෂණ ආයතනය, කොළඹ 8
ආචාර්ය සිසිර පතිරණ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
වෛද්‍ය ප්‍රීති පෙරේරා, හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ 8
වෛද්‍ය රජීව ද සිල්වා, විශේෂඥ ප්‍රතිශක්තිකරණවේදී, වෛද්‍ය පර්යේෂණ ආයතනය, කොළඹ 8
ආචාර්ය දර්ශන් ද සිල්වා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන.
ආචාර්ය සුමාධි ද සිල්වා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
වෛද්‍ය සුජීවා වීරසිංහ, පිළිකා පිළිබඳ විශේෂඥ, ජාතික පිළිකා ආයතනය, මහරගම
ආචාර්ය සනත් සේනානායක, පිළිලවේදය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය වසුන්දරා ප්‍රනාන්දු, පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක, වෛද්‍ය පීඨය, ඩල්හවුස් විශ්වවිද්‍යාලය, කැනඩාව
වෛද්‍ය ජූඩ් ජයමහ, උපදේශක වෛරස් විද්‍යාඥ , වෛද්‍ය පර්යේෂණ ආයතනය, කොළඹ 8
ජේමිස් තම්බිරාජා මයා, සහකාර කථිකාචාර්ය, IBMBB (2020.02.24 සිට)
ජයනි කාරියවසම් මිය, ඉගෙනුම් සහායක, IBMBB (2020.12.26 දක්වා)

පහත සඳහන් ආචාර්ය මණ්ඩල සාමාජිකයෝ / බාහිර කථිකාචාර්යවරු **ජෛවතොරතුරුවේදය පිළිබඳ විද්‍යාපති** දේශන පැවැත්වූහ:

ආචාර්ය රුවන් වීරසිංහ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, UCSC
මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය -අණුක ජීවවිද්‍යා, IBMBB
මහාචාර්ය එරික් එච්. කරුණානායක - සම්මානිත ජෛවරසායන විද්‍යා මහාචාර්ය, පුරෝගාමී අධ්‍යක්ෂ, IBMBB
මහාචාර්ය එරික් බොන්කාම් රුඩ්ලොෆ්, ජෛවතොරතුරුවේදය මහාචාර්ය, සත්ව අභිජනන හා ජාන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශය, ස්වීඩන කෘෂිකාර්මික විද්‍යා විශ්ව විද්‍යාලය, ස්වීඩනය
මහාචාර්ය එමිලියානෝ බැරෙටෝ-හර්නාන්ඩස් - සහකාර මහාචාර්ය, කොලොම්බියා ජාතික විශ්වවිද්‍යාලය, කොලොම්බියාව

ආචාර්ය ජෝස් ආර් වැල්වර්ඩ් - ප්‍රධානී, විද්‍යාත්මක පරිගණක සේවා, ජාතික ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, ස්පාඤ්ඤය
මහාචාර්ය නිමල් පුණ්‍යසිරි- ජෛවරසායන විද්‍යා මහාචාර්ය, IBMBB
මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන – අණුක ජෛවවේදය පිළිබඳ මහාචාර්ය, IBMBB
ආචාර්ය නලින් රණසිංහ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, UCSC
රූපිකා විජේසිංහ මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, UCSC
ආචාර්ය හෂේන්ද්‍ර කත්‍රිආරච්චි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය සමීර විශ්වකුල - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය රසිකා ජයතිලක- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය සුමාධි ද සිල්වා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
ආචාර්ය සුදේශිනී හේවගේ- කථිකාචාර්ය, IBMBB
ආචාර්ය එස්.එස්.ආර්. සමරකෝන් - කථිකාචාර්ය, IBMBB
ආචාර්ය රුවන්දි රණසිංහ - විද්‍යාත්මක සහකාර, IBMBB
ආචාර්ය මෙරාන් එදිරිවීර - පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක, ජේජු ජාතික විශ්වවිද්‍යාලය, කොරියානු ජනරජය
ආචාර්ය කනිෂ්ක සේනාතිලක - පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක, IBMBB
කාංචන සේනානායක මයා - සහකාර ජාල කළමනාකරු, IBMBB
නිෂාරා බටගොඩ මිය - විද්‍යාත්මක සහකාර, IBMBB
ලක්ෂිකා ජයසේකර මිය - පර්යේෂණ සහකාර, IBMBB
අමාලි ප්‍රනාන්දු මිය - විද්‍යාත්මක / ඉගෙනුම් සහායක, IBMBB

විද්‍යාපති (MSc) විෂයමාලා, අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසි සංශෝධනය කිරීම

අණුක ජීවවිද්‍යා, සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය සහ ජෛවතොරතුරුවේදය යන විෂයමාලා තුනෙහි සංශෝධන කටයුතු අදාළ අධ්‍යයන මණ්ඩල විසින් 2017 දී සම්පූර්ණ කරන ලද අතර 2018 වසරේදී 430 වන සනාතන සභා රැස්වීමේදී අනුමත කරන ලදී. සංශෝධිත අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසි 2018 දී පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. සංශෝධිත අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසි සඳහා පාලක මණ්ඩල අනුමැතිය 2019 ඔක්තෝම්බර් මාසයේදී ලැබුණි.

සංශෝධිත/ ප්‍රතිව්‍යූහගත කරන ලද විෂයමාලා තුන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා වන අයදුම්පත කළමනාකරණ මණ්ඩලය විසින් සම්පූර්ණ කර අනුමත කරන ලද අතර 2020 දෙසැම්බර් මාසයේදී සනාතන සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

අධ්‍යයන කමිටුව - 2020

මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති, (අධ්‍යක්ෂ හා සභාපති); ප්‍රතිශක්තිවේද මහාචාර්ය; සභාපති, BOS-CMI
මහාචාර්ය එරික් එච්. කරුණානායක, සම්මානිත ජෛවරසායන විද්‍යා මහාචාර්ය, IBMBB
මහාචාර්ය අයිරා තාබෘ, බාහිර මහාචාර්ය, IBMBB (2020 ජූලි දක්වා)
මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්, අණුක ජීවවිද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය; සභාපති, BOS-MLS, IBMBB
මහාචාර්ය එස් දැරණියගල, කාබනික රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන, වැඩසටහන් සම්බන්ධීකාරක, BOS-MLS; අණුක ජීවවිද්‍යාව පිළිබඳ මහාචාර්ය, IBMBB
මහාචාර්ය නිමල් පුණ්‍යසිරි, ජෛවරසායන විද්‍යා මහාචාර්ය, IBMBB
මහාචාර්ය සුලෝචනා විජේසුන්දර, ජෛව රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, අණුක ජෛවවේදය හා ජෛව තාක්ෂණ දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය කිත්මිණි සිරිදේව, අංශ ප්‍රධානී/ ජෛව තාක්ෂණ හා අණුක ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය සුනිල් ප්‍රේමවංස, සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
වෛද්‍ය ඉනෝකා කොරයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ක්ෂුද්‍රජීවවිද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය රුවන් වීරසිංහ, සභාපති, BOS-BI; ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, UCSC, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය සිසිර පතිරණ, වැඩසටහන් සම්බන්ධීකාරක, CMI; ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
ආචාර්ය රුවන්දි රණසිංහ, සම සම්බන්ධීකාරක, BOS-BI; විද්‍යාත්මක සහකාර, IBMBB
රූපිකා විජේසිංහ මිය, සම සම්බන්ධීකාරක, BOS-BI; ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, UCSC, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය සුමාධි ද සිල්වා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB (ලේකම්)
ආචාර්ය නර්මදා ප්‍රනාන්දු, සහකාර වැඩසටහන් සම්බන්ධීකාරක, CMI; ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
ආචාර්ය සුදේශිනී හේවගේ, සහකාර වැඩසටහන් සම්බන්ධීකාරක, MLS; කථිකාචාර්ය, IBMBB
විශේෂඥ වෛද්‍ය රජීව ද සිල්වා, විශේෂඥ ප්‍රතිශක්තිකරණවේදී, ප්‍රතිශක්ති විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පර්යේෂණ ආයතනය
ආචාර්ය නලින්ද සිල්වා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කායික විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (2020 සැප්. 29 සිට)
ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර, සහකාර වැඩසටහන් සම්බන්ධීකාරක, MLS; ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB (2020 මාර්තු 05 සිට)

අධ්‍යයන කමිටුව - අණුක ජීවවිද්‍යා:
කමනි තෙන්නකෝන් - අණුක ජීවවිද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සභාපති)
මහාචාර්ය එරික් එච්. කරුණානායක - සම්මානිත ජෛවරසායන විද්‍යා මහාචාර්ය, IBMBB
මහාචාර්ය නිමල් පුණ්‍යසිරි- ජෛවරසායන විද්‍යා මහාචාර්ය, IBMBB
මහාචාර්ය අයිරා තාබෘ - බාහිර මහාචාර්ය , IBMBB
මහාචාර්ය ජගත්ප්‍රිය වීරසේන – අණුක ජෛවවේදය පිළිබඳ මහාචාර්ය, IBMBB (සම්බන්ධීකාරක)
මහාචාර්ය නිලන්ති දසනායක - උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ආචාර්ය සුමාධි ද සිල්වා – ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB
ආචාර්ය සුදේශිනී හේවගේ- කථිකාචාර්ය, IBMBB (සහකාර සම්බන්ධීකාරක)
ආචාර්ය සමීර සමරකෝන් - කථිකාචාර්ය, IBMBB
ආචාර්ය රුවන්දි රණසිංහ - විද්‍යාත්මක සහකාර, IBMBB

අධ්‍යයන කමිටුව - සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය :
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති , ප්‍රතිශක්තිවේද මහාචාර්ය (සභාපති)
මහාචාර්ය සුනිල් ප්‍රේමවංස - සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය සිසිර ලාල් පතිරණ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB (සම්බන්ධීකාරක)
ආචාර්ය නර්මදා ප්‍රනාන්දු - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, IBMBB (සහකාර සම්බන්ධීකාරක)
වෛද්‍ය ඉනෝකා කොරෙයා- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ක්ෂුද්‍ර ජීවවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
වෛද්‍ය රජීව ද සිල්වා - විශේෂඥ ප්‍රතිශක්තිකරණවේදී, ප්‍රතිශක්ති විද්‍යා දෙපාර්තමේන්තුව, MRI
මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන – අණුක ජෛවවේදය පිළිබඳ මහාචාර්ය, IBMBB
වෛද්‍ය ධනුෂ්කා දසනායක - විශේෂඥ ප්‍රතිශක්තිකරණවේදී, ජාතික රෝහල මහනුවර
ආචාර්ය දර්ශන් ද සිල්වා- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
ජේමිස් තම්බිරාජා මයා- සහකාර කථිකාචාර්ය, IBMBB
ජයනි කාරියවසම් මිය - ඉගෙනුම් සහායක, IBMBB (ආරාධිත)
දක්ෂිකා ගංගානි මෙනවිය- විද්‍යාත්මක සහකාර, IBMBB (ආරාධිත)

අධ්‍යයන කමිටුව - ජෛවතොරතුරුවේදය:
ආචාර්ය රුවන් වීරසිංහ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, UCSC (සභාපති)
මහාචාර්ය කමනි තෙන්නකෝන් - අණුක ජීවවිද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (නියෝජ්‍ය සභාපති)
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති- අධ්‍යක්ෂ-IBMBB (නිල බලයෙන් පත්වූ සාමාජික)
මහාචාර්ය කේ පී හේවාගමගේ- අධ්‍යක්ෂ-UCSC (නිල බලයෙන් පත්වූ සාමාජික)
මහාචාර්ය එරික් එච්. කරුණානායක - සම්මානිත ජෛවරසායන විද්‍යා මහාචාර්ය, IBMBB
මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන – අණුක ජෛවවේදය පිළිබඳ මහාචාර්ය, IBMBB
ආචාර්ය නලින් රණසිංහ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, UCSC
ආචාර්ය එම් ඩී ටී ආටිගල - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය ආචාර්ය එච් එස් කත්‍රිආරච්චි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය ආචාර්ය සමීර විශ්වකුල- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
රූපිකා විජේසිංහ මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (සම සම්බන්ධීකාරක-UCSC)
ආචාර්ය රුවන්දි රණසිංහ - විද්‍යාත්මක සහකාර (සම සම්බන්ධීකාරක-IBMBB)
කාංචන එස් සේනානායක මයා - හිටපු IBMBB සම සම්බන්ධීකාරක (ආරාධිත)

කෙටිකාලීන පාඨමාලා හා පුහුණු වැඩසටහන්:

ක්‍රියාකාරකම් අතරමග නැවතීම හේතුවෙන් 2020 දී පැවැත්වීමට නියමිතව තිබූ අණුක ජීව විද්‍යාත්මක ක්‍රමශිල්ප හා පටක රෝපණ ක්‍රමශිල්ප පිළිබඳ පාඨමාලා 2021 වර්ෂය සඳහා නැවත දින නියම කරන ලදී.

2020 දෙසැම්බර් වන විට ආරම්භ කිරීමට නියමිතව තිබූ ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ උසස් සහතික පාඨමාලාව 2021 මාර්තු මාසයේදී පැවැත්වීමට නැවත දින නියම කරන ලදී.

i) ප්‍රායෝගික නිරූපණය: 2020 මාර්තු 10 වන දින ලන්ඩන් යුනිවර්සිටි කොලේජ් (UCL)

ආචාර්ය සුමාධි ද සිල්වා හා ආචාර්ය තර්මිනි සුන්දරලිංගම් විසින් 2020 මාර්තු 10 වන දින උපාධි අපේක්ෂකයින් 09 දෙනෙකු සඳහා එන්සයිම ජීර්ණය සීමා කිරීම පිළිබඳ ප්‍රායෝගික නිරූපණයක් පවත්වන ලදී.

ii) DNA අනුක්‍රමණය පිළිබඳ නිරූපණය

ආචාර්ය රුවන්දි රණසිංහ, ජොඇන් කොතලාවල සහ අංජනා වැලිකල යන මහත්මීන් විසින් 2020 ජනවාරි 17 වන දින ශ්‍රී ලංකාවේ වයඹ විශ්ව විද්‍යාලයේ තෙවන වසර ජෛව තාක්ෂණවේදය විශේෂ ප්‍රථම උපාධි සිසුන් 16 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම සඳහා ඩී.එන්.ඒ අනුක්‍රමණය පිළිබඳ එක් දින ප්‍රායෝගික නිරූපණයක් පවත්වන ලදී.

iii) PCR නිරූපණය

ශ්‍රී ලංකාවේ වයඹ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා ආචාර්ය නිලූපා ගුණරත්න විසින් 2020 ජනවාරි 17 වන දින PCR පිළිබඳ සවිස්තරාත්මක හැඳින්වීමක් හා ප්‍රායෝගික නිරූපණයක් සිදු කරන ලදී.

iv) කාර්මික පුහුණු ස්ථානගත කිරීම

මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ වීරසේනගේ අධීක්ෂණය යටතේ ෆාරා නිෆ්ලා මහත්මිය (වයඹ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂිකාවකි) මාස 3 ක පුහුණුවක් සම්පූර්ණ කරන ලදී.

v) කේවල අණුක දෘෂ්‍ය තීරු කේත භාවිතා කරමින් mRNA, ප්‍රෝටීන සහ DNA සමගාමී බහුකාර්ය (800 - plex දක්වා) හඳුනා ගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය

කේවල අණුක දෘෂ්‍ය තීරු කේත භාවිතා කරමින් mRNA, ප්‍රෝටීන සහ DNA සමගාමී බහුකාර්ය (800 - plex දක්වා) හඳුනා ගැනීම පිළිබඳ සම්මන්ත්‍රණයක් 2020 ජනවාරි 27 වනදා ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණවේද ආයතනය හිදී පවත්වන ලදී.

2020 පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය

පශ්චාත් උපාධි උපාධි ප්‍රදානය කරනු ලැබුවේ 2020 දෙසැම්බර් 31 වන දින ය. 2020 අවසාන කාර්තුවේ කෝවිඩ් -19 පැතිරයාම හේතුවෙන් සමාජීය උත්සවවලට අදාළ සෞඛ්‍ය සීමාවන් හේතුවෙන් චාරිත්‍රානුකූල උපාධි ප්‍රදානෝත්සවය නොපැවැත්විණි. චාරිත්‍රානුකූල උත්සවය 2021 පෙබරවාරි මාසයේදී පැවැත්වීමට නියමිතය.

විවෘත දිනය: 2020 ඔක්තෝබර් 9

කොවිඩ් -19 ව්‍යාප්තියට අදාළ සෞඛ්‍ය සීමාවන් හේතුවෙන් බොහෝ ස්ථානීය ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි වූ බැවින් මාර්ගගත විවෘත දින වැඩසටහනක් සැලසුම් කරන ලදී. එබැවින් 2020 ඔක්තෝබර් 9 වන දින විවෘත දිනයක් පවත්වන ලදී. මෙය IBMBB විසින් සංවිධානය කරන ලද සාර්ථක උත්සවයකි. රජයේ විශ්ව විද්‍යාලවල සහ පෞද්ගලික ආයතනවල විද්‍යා විෂය ධාරාවේ උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි සිසුන් මෙන්ම පාසල් හැරගිය අයගෙන් ද සමන්විත 60 දෙනෙක් මීට සහභාගී වූ අතර එහිදී IBMBB හි විද්‍යාපති, දර්ශනපති/ දර්ශනසූරී සහ වෙනත් කෙටි පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඔවුන්ට අවස්ථාව සලසා තිබිණි.

IBMBB හි පවත්වන ලද/ හැදෑරිය හැකි පාඨමාලා පිළිබඳ තොරතුරු, විද්‍යාගාර චාරිකා, පූර්ව ලියාපදිංචිය, කාර්ය මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ සිසුන් සමඟ උපදෙස් / සාකච්ඡා මෙම වැඩසටහනට ඇතුළත් විය. අයදුම්කරුවන් 39 දෙනෙක් විවෘත දිනයේදී පිරිනමන 50% වට්ටමක් (අයදුම්පත් ගාස්තු) යටතේ විද්‍යාපති උපාධි අයදුම්පත් ලබා ගත්හ.

විවෘත දිනයේදී IBMBB හි විද්‍යාපති පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන් සඳහා සහන කොන්දේසි මත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ලංකා බැංකුව සහ සම්පත් බැංකුව විසින් හඳුන්වා දී ඇත.

පර්යේෂණ ක්‍රියාකාරකම්

නිවර්තන කලාපීය පරපෝෂිත හා ආසාදිත රෝග (බරවා, මී උණ, ඩෙංගු, මැලේරියාව, මෙලියොයිඩෝසිස්, නෙමටොඩ ආසාදන හා SARS Cov 2) අණුක වෛද්‍ය විද්‍යාව (පිළිකා සහ පිළිකා කඳ සෛල, මානව DNA විචලනය සහ පුරාණ DNA අධ්‍යයනයන්, කෙටි පරාසයන් වල අණුක අධ්‍යයනයන්, පරිවෘත්තීය රෝග පිළිබඳ අණුක අධ්‍යයනයන්, සයිටොමෙගෝලෝ වෛරස වල ප්‍රවේණි විද්‍යාව සහ අසාත්මිකතා හඳුනා ගැනීම සහ ලක්ෂණ විභාග කිරීම් පිළිබඳ අණුක අධ්‍යයනයන් සහ ශාක අණුක ජීව විද්‍යාව, ශාක පරිවෘත්තීය, ජෛව රසායන විද්‍යාව සහ ක්ෂුද්‍ර ජීවී අණුක ජීව විද්‍යාව, ඖෂධීය ශාක (ප්‍රතිප්‍රදාහ සහ ප්‍රතිශක්ති අනුවර්තන, ප්‍රති පිළිකා, ප්‍රති-ආසාත්මිකතා බලපෑම්, ඖෂධීය ශාකවල පිළිකා නාශක බලපෑම, තෝරාගත් ආවේණික හා ඖෂධීය ශාකවල ප්‍රතිබරවා ක්‍රියාකාරිත්වය), කාර්මික යෙදවීම්, සත්ත්ව විශේෂ වල අණුක හඳුනා ගැනීම යන ක්ෂේත්‍රයන්හී පර්යේෂණ වැඩසටහන් රාශියක්ම IBMBB හි ක්‍රියාත්මකව පැවතිණ. ආයතනයේ අධ්‍යක්ෂ, අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ සහ සහයක විද්‍යාඥයින්ගේ අධීක්ෂණය යටතේ දර්ශනපති/ දර්ශනසූරී හා විද්‍යාපති සිසුන්ට පර්යේෂණ පුහුණුව ලබා දෙන ව්‍යාපෘති කීපයක් එක් එක් වැඩසටහනට ඇතුලත්වේ. සිසුන්, පර්යේෂණ ව්‍යාපෘති සහ අධීක්ෂකයන් 1 හා 2 වගුවල ලැයිස්තු ගත කර ඇත.

සමාන කණ්ඩායම් විසින් සමාලෝචනය කරන ලද, සුවිගත, ජාත්‍යන්තර ජර්නල වල පූර්ණ පත්‍රිකා මුළු සංඛ්‍යාව 26 ක් විය. ජාත්‍යන්තර උද්ධෘත ඇතුළුව පර්යේෂණ සන්නිවේදනයන් 15 ක් විද්‍යාත්මක රැස්වීම් වලදී ඉදිරිපත් කරන ලදී

අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පර්යේෂණ සහායකයන් විසින් ලබාගත් අරමුදල් පිළිබඳ විස්තර **3** වන වගුවේ දක්වා ඇත.

1) පරපෝෂිත සහ ආසාදන රෝග පිළිබඳ පර්යේෂණ වැඩසටහන්

පරපෝෂිත සහ ආසාදන රෝග වලින් ශ්‍රී ලාංකික ජනගහනයේ රෝග බරට සැලකිය යුතු ලෙස දායකත්වයක් තවමත් ලැබේ. ස්වාභාවයෙන්ම මරණීය රෝගයක් නොවූවද, දිගුකාලීනව පවතින රෝගයක් වන වසාල බරවා රෝගය (Lymphatic filariasis) සැලකිය යුතු ග්ලානාය තත්වයකට (morbidity) හේතුවන අතර ඒ සඳහා ඇති ප්‍රතිකාර විකල්පද සීමාසහිතවේ. මී උණ (ලෙප්ටොස්පයිරෝසිස්) සහ ඩෙංගු උණ පැතිරීම මෑතකදී භයානක ලෙස ඉහළ ගොස් ඇති අතර ඒ රෝග තත්වයන් දෙකම ග්ලානාය‍යට හා මරණවලට හේතුවේ. රෝග විනිශ්චය ප්‍රමාද වීම සහ රෝග ක්‍රියාවලියට පාදක වන යාන්ත්‍රණයන් පිළිබඳ අවබෝධයක් නොමැතිකම මෙම රෝග වලින් සිදු වන මරණ සංඛ්‍යාවන් ඉහල යාමට හේතු වේ. මෙම ගැටළුවලට විසඳුම් සෙවීම සඳහා පර්යේෂණ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වේ. මැලේරියා සම්ප්‍රේෂණය වීම පාලනය කර නමුදු ජාතික මැලේරියා මර්ධන ව්‍යාපාරය විසින් රෝගය නැවත හඳුන්වාදීම වලක්වනු ලබමින් පවතින සංවේදී අණුක ක්‍රම මෙම අදියරේදී ස්ථාපිත කිරීම අවශ්‍යවේ.

අ) බරවා

2020 දී ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පැවතුනි.

i) <u>විභව්‍ය ඖෂධ ඉලක්ක හඳුනා ගැනීම සඳහා නව පරම්පරාවේ අනුක්‍රමික (NGS) තාක්ෂණයන් භාවිතා කරමින් *Setaria digitata* ජෙනෝමය පිළිබඳ අධ්‍යයනයන්</u>

Setaria digitata හි අනුක්‍රමික දත්ත භාවිතා කරමින් විභව ඖෂධ ඉලක්ක හඳුනා ගැනීම අරමුණු කරයි.

විමර්ශකයන්: මහාචාර්ය එරික් බොංග්කැම් -රුඩ්ලොෆ් (උප්සලා විශ්වවිද්‍යාලය, ස්වීඩනය), මහාචාර්ය එරික් කරුණානායක (IBMBB) හා මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් (IBMBB)
MPhil/ PhD ශිෂ්‍ය/IBMBB: කාංචන එස්. සේනානායක

මූල්‍ය සම්පාදනය: Swedish Links ප්‍රදාන.
2020 දී MPhil/ PhD ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතුනි.
2020 දී එක් සම්පූර්ණ පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

ආ) ලෙප්ටොස්පයිරෝසිස් (මී උණ)

2020 දී එක් MPhil/ PhD ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පැවති අතර විද්‍යාපති ව්‍යාපෘති දෙකක් සම්පූර්ණ කරන ලදී. දර්ශනපති සිසුහු දෙදෙනෙක් සිය අධ්‍යයන කටයුතු අත්හිටුවූහ. පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණකවරයෙකු විසින් පර්යේෂණ වැඩසටහනක් කරගෙන යනු ලැබේ.

<u>i) ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ මානව ලෙප්ටොස්පයිරෝසිස් (මී උණ) පිළිබඳ Sero වසංගතවේදය</u>

රෝග විනිශ්චය සහ අනෙකුත් වසංගතවේදීය පරාමිතීන් සඳහා MAT හී භාවිතා වන cut off ප්‍රතිශක්ති titters සැපයෙන පරිදි කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ගේ ප්‍රතිශක්ති තත්ත්වය පිළිබඳ ලක්ෂණ විභාගය ඉලක්ක කරගන්නා ලදී.

විමර්ශකයන්: PI: මහාචාර්ය සේනක රාජපක්ෂ (UOC), මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු හා මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB); සහයෝගිත්වය : ආචාර්ය ලිලානි කරුණානායක (MRI).
MPhil ශිෂ්‍ය /IBMBB: ක්‍රිෂාන් බාලාජි (2020 දී අධ්‍යයනය අත්හිටුවා ඇත).

මූල්‍ය සම්පාදනය: කොළඹ විශ්වවිද්‍යාලය මහාචාර්ය සේනක රාජපක්ෂට (කො.වි.වි. ප්‍රදාන: AP/3/2/2014/RG/14)
පර්යේෂණ වැඩසටහන සම්පූර්ණ කරන ලදි. 2020 දී PLOS නොසලකා හරින ලද රෝග ගැන එක් පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලදී. තවත් අත් පිටපත් දෙකක් ප්‍රකාශනයට සූදානම් වෙමින් පවතී.

<u>ii) බරපතලකමේ විවිධත්වයන් සහිත ලෙප්ටොස්පයිරෝසිස් රෝගීන්ගෙන් ඉවත් කරගනු ලැබූ Leptospira ප්‍රවේණිදර්ශ සහ මස්තු දර්ශ හඳුනා ගැනීම</u>

ලෙප්ටොස්පයිරෝසිස් රෝගීන්ගෙන් වෙන් කරගන්නා ලද *Leptospira* ප්‍රවේණි දර්ශ සහ මස්තු දර්ශ සහ රෝගයේ බරපතලකමට ඒවායේ තිබිය හැකි සම්බන්ධතා අධ්‍යයනය කිරීමට අරමුණු කර ඇත.

විමර්ශකයන්: PI: මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය ජගත්ප්‍රිය වීරසේන, මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC) හා මහාචාර්ය සේනක රාජපක්ෂ (UOC); ආචාර්ය ලිලානි කරුණානායක (MRI).
MPhil/ PhD ශිෂ්‍ය/IBMBB: නදීමා එස් චන්ද්‍රපත්ම (2020 මැයි මාසයේදී අධ්‍යයන කටයුතු අත්හිටුවන ලදි).

මූල්‍ය සම්පාදනය: මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති වෙත ජාතික පර්යේෂණ සභාවෙන් (NRC -17-098) පර්යේෂණ වැඩසටහන 2020 මාර්තු දක්වා ක්‍රියාත්මක වූ අතර කෝවිඩ් -19 ව්‍යාප්තිය හේතුවෙන් අත්හිටුවා ඇත.

2020 දෙසැම්බර් මාසයේදී IBMBB වෙත පත් කරන ලද පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක ආචාර්ය හරින්ද්‍ර සත්කුමාර විසින් මෙම පර්යේෂණ වැඩසටහන සිදු කරන ලදී.

iii) ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද ඉතාම ප්‍රචලිත *Leptospira* serovars/මස්තූ කණ්ඩායම් වල ලෙප්ටොස්පිරා ප්‍රතිදේහජනක හඳුනා ගැනීම සඳහා ඒකක්ලෝන ප්‍රතිදේහ නිෂ්පාදනය

ලෙප්ටොස්පිරා ප්‍රතිදේහ සහ ලෙප්ටොස්පිරා ප්‍රතිදේහවලට එරෙහි මී ප්‍රතිශක්ති ප්‍රතිචාරයන්හි ලක්ෂණ විභාගය සහ ලෙප්ටොස්පිරා (ප්‍රතිදේහජනක) සොයා ගැනීමේ පරීක්ෂාවක් වැඩි දියුණු කිරීමේ අවසන් අරමුණ ඇතිව ලෙප්ටොස්පිරා ප්‍රතිදේහජනකවලට එරෙහි මී ඒකක්ලෝන ප්‍රතිදේහ නිපදවීම ඉලක්ක කරගන්නා ලදී.

විමර්ශකයන්: PI: මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය සේනක රාජපක්ෂ (UOC), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB)

සහයෝගීත්වය: ආචාර්ය ලිලානි කරුණානායක (MRI)
MPhil/PhD ශිෂ්‍ය/IBMBB: දක්ෂිකා ගංගානි

මූල්‍ය සම්පාදනය: ජාත්‍යන්තර ජාන ඉංජිනේරු හා ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති හට, IBMBB (ICGEB-LKA-17-1)
එක් MPhil/PhD ව්‍යාපෘතියක් 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතිනි. AISSL හි ද්විවාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේදී එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.

iv) *Leptospira* සහ ප්‍රතිදේහජනක ප්‍රතිශක්තිකරණයෙන් පසු මීයන්ගේ ප්‍රතිදේහ ප්‍රතිචාර හා පරිතාන ලිම්පොසයිට උපගනනයන් හි වෙනස්කම් පිළිබඳ මූලික අධ්‍යයනයක්

මී අන්තර් පරිතාන *Leptospira* ප්‍රතිදේහජනක ප්‍රතිශක්තිකරණයෙන් පසු ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාර ලබාදෙන ලිම්පොසයිට උපගණනයන් විමර්ශනය ඉලක්ක කර ගන්නා ලදී.

විමර්ශකයන්: PI: මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), වෛද්‍ය රජීව ද සිල්වා (MRI)
MSc ශිෂ්‍ය /IBMBB: ඩී. ඩී. වත්සලා කේ දිසානායක

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
MSc ව්‍යාපෘතිය නිම කරන ලද අතර 2020 දී නිබන්ධනය ඉදිරිපත් කරන ලදී.
AISSL හි ද්විවාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේදී එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.

v) ශ්‍රී ලංකාවේ වඩාත් පැතිරී ඇති *Leptospira* ප්‍රභේදයන්ගේ (Serovars*)* ප්‍රතිශක්ති ප්‍රතිචාර ඇති කරන ප්‍රෝටීන සන්සන්දනය කිරීම.

මී උණ ප්‍රතිශක්තිකරණය ප්‍රෝටීන (immunogenic *Leptospira* proteins) හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ වාර්තා වන සුලභම ප්‍රභේදයන්ගේ ප්‍රෝටීන හඳුනා ගැනීම ඉලක්ක කර ගන්නා ලදී.

විමර්ශකයන්: PI: මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB)

MSc /IBMBB ශිෂ්‍ය: ඩබ්ලිව්.ජී. කෞශල්‍ය අනුරාධ

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
MSc ව්‍යාපෘතිය නිම කරන ලද අතර 2020 දී නිබන්ධනය ඉදිරිපත් කරන ලදී.
AISSL හි ද්විවාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේදී එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී**.**

ඇ) ඩෙංගු

2020 දී MPhil/PhD ව්‍යාපෘති දෙකක් හා එක් MSc ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පැවති අතර MSc ව්‍යාපෘතියක් සම්පූර්ණ කරන ලදී.

i) ඩෙංගු ආසාදනයේ ව්‍යාධිජනකතාවේදී NS1 වල කාර්යභාරය නිගමනය කිරීම.

ඩෙංගුවල NS1 සම්බන්ධ ව්‍යාධිජනකතාවට පසුබිම් වන යාන්ත්‍රණයන් හඳුනා ගැනීම ඉලක්කය විය.

විමර්ශකයන්: PI: මහාචාර්ය නීලිකා මලවිගේ (USJP)-PI, ආචාර්ය සමීර සමරකෝන් (IBMBB), හා මහාචාර්ය කමනි තෙන්නකෝන් (IBMBB)
MPhil/PhD ශිෂ්‍ය (USJP): දේශිනි චතුරංගා ජයතිලක

මූල්‍ය සම්පාදනය: ජාතික පර්යේෂණ සභාව මහාචාර්ය නීලිකා මලවිගේ හට
PhD වැඩසටහන 2020 දී සම්පූර්ණ කරන ලදී.

ii) ස්ථාවර උෂ්ණත්ව යටතේ ලූප භාවිතයෙන් RNA ගුණනය කිරීමෙන් (RT –LAMP) සිදුවන වර්ණ විපර්යාස හරහා ඩෙංගු ආසාදිත මදුරුවන් (Aedes mosquitoes) තුල පවතින ඩෙංගු වෛරස කාණ්ඩ හඳුනා ගැනීම සඳහා අඩු පිරිවැය හා නවීන මදුරු වාහක සමීක්ෂණ මෙවලමක් ස්ථාපිත කිරීම.

Aedes මදුරුවන් තුල ඩෙංගු වෛරස් මස්තු දර්ශ (Serotypes) හඳුනා ගැනීම සඳහා පිරිවැය ඵලදායී නව්‍ය සමීක්ෂණ මෙවලමක් ලෙස Colourimetric reverse transcription loop medidated isothermal amplification (RT-LAMP) assay ස්ථාපනය කිරීම ඉලක්ක කර ගන්නා ලදී.

විමර්ශකයන්: PI: විශේෂඥ හසිත තිසේරා, අධ්‍යක්ෂ - ජාතික ඩෙංගු පාලන ඒකකය (NDCU) (දැනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා ඒකකයේ),
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), මහාචාර්ය ඕ.වී.ඩී.එස් වීරසේන (IBMBB), ආචාර්ය සිසිර පතිරණ (IBMBB),
ආචාර්ය සුබාෂිනි ආර්යප්‍රේම (එක්සත් රාජධානියේ ලිවර්පූල් වි. වි.), ආචාර්ය රුෂිකා පෙරේරා (ඇ. එ. ජ. කොලරාඩෝ ප්‍රාන්ත වි. වි.)
MPhil/PhD ශිෂ්‍ය (IBMBB): සකුන්තලා ජානකි (කීට විද්‍යාඥ, NDCU)

මූල්‍ය සම්පාදනය: ජාතික පර්යේෂණ සභාව වෛද්‍ය එච්. තිසේරාට (NRC-19-065)
MPhil/PhD වැඩසටහන 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පැවතිනි.

iii) ඩෙංගු වෛරසයට සක්‍රීය එන්.කේ සෛලවල බලපෑම - endothelium (අන්තශ්තජ) සෛලවල වෙනස්වීම්

විමර්ශකයන්: මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB),
ලෝෂිනි රණවීර (IBMBB)

MSc ශිෂ්‍ය: එම් පී සෙලෙස්ටින් (ක්වීන් එලිසබෙත් පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වලාභී)

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
MSc ව්‍යාපෘති කටයුතු 2020 දී සිදු කෙරෙමින් පැවතිණි.

ඈ) මැලේරියාව

එක් PhD ව්‍යාපෘතියක් 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

i) ශ්‍රී ලංකාවේ මැලේරියාව නැවත හඳුන්වාදීම වැළැක්වීමේ අදියර පිළිබඳ අධ්‍යයනයන්: පරපෝෂිතවේදී සහ අණුක රෝග විනිශ්චය ක්‍රම සැසඳීම සහ ආසාදන වල අණුක ලක්ෂණ විභාගය

ශ්‍රී ලංකාවේ මැලේරියාව නැවත හඳුන්වාදීම වැළැක්වීමේ අදියරේදී ආනයනිත මැලේරියා අවස්ථා වල ලක්ෂණ විභාගය සහ එවැනි මැලේරියා ආසාදන සඳහා සුදුසු ප්‍රශස්ත රෝග විනිශ්චය ක්‍රමයක් හඳුනා ගැනීම අරමුණු කර ගෙන ඇත.

විමර්ශකයන්: PI මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු (UOC), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන (IBMBB), ආචාර්ය රිසින්ත ප්‍රේමරත්න (මැලේරියා මර්ධන ව්‍යාපාරය)
PhD ශිෂ්‍ය/IBMBB: ඩබ්ලිව්. එම්. කුමුදු ටී ද අල්විස්-ඩබ්ලිව් ගුණසේකර

මූල්‍ය සම්පාදනය: ජාතික විද්‍යා පදනම මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු හට (NSF/RG/2014/HS/03)
PhD වැඩසටහන 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.
SLAAS හිදී එක් ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී.

ඉ) මෙලියෝයිඩෝසිස්

එක් MSc ව්‍යාපෘතියක් 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

i) මෙලියෝයිඩෝසිස් ප්‍රතිශක්තිරෝග විනිශ්චය සඳහා පරීක්ෂාවක් ස්ථාපනය කිරීම

විමර්ශකයන්: PI වෛද්‍ය ඉනෝකා කොරයා (UOC), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ජේම්ස් තම්බිරාජා මයා
MSc ශිෂ්‍ය/IBMBB: ලහිරු පෙරේරා

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
MSc ව්‍යාපෘති කටයුතු 2020 දී සිදු කෙරෙමින් පැවතිණි.

ඊ) නෙමටෝඩ් ආසාදන

එක් MSc ව්‍යාපෘතියක් 2020 දී නිම කරන ලදී.

i) *Enterobius vermicularis* බිත්තරවල ප්‍රතිදේහජනකවල ගති ලක්ෂණ හඳුනා ගැනීම

විමර්ශකයන්: PI මහාචාර්ය ශාමිනි ගුණවර්ධන (UOC), ආචාර්ය සිසිර පතිරණ (IBMBB)

MSc ශිෂ්‍ය/IBMBB: වයි.බී.එන්. සඳුනි ද කොස්තා

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
MSc ව්‍යාපෘතිය 2020 දී නිම කරන ලදී.

ඌ) SARS CoV 2

පර්යේෂණ ව්‍යාපෘති දෙකකට අවසර දෙන ලද අතර දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

i). <u>SARS-COV-2 ආසාදන හඳුනා ගැනීම සඳහා ප්‍රතිදේහජනක හඳුනාගැනීම මගින් ක්ෂණික රෝග විනිශ්චය පරීක්ෂණයක් සඳහා මූලධර්ම සාධනය</u>

විමර්ශකයන් : PI ආචාර්ය සිසිර පතිරණ (IBMBB) මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), ආචාර්ය පේෂල ගුණසේකර (IBMBB), මහාචාර්ය ඕ.වී.ඩී.එස් වීරසේන (IBMBB), විශේෂඥ වෛද්‍ය රජීව ද සිල්වා (MRI), විශේෂඥ වෛද්‍ය ධනුෂ්කා දසනායක (MRI), විශේෂඥ වෛද්‍ය නදීක ජනගේ (MRI)

මූල්‍ය සම්පාදනය: ජාතික පර්යේෂණ සභාව- ක්ෂණික ප්‍රතිචාර ප්‍රදාන යෝජනා ක්‍රමය
පර්යේෂණ ව්‍යාපෘතිය 2020 දී ආරම්භ කරන ලද අතර එය ක්‍රියාත්මක වෙමින් පැවතිනි.

ii). <u>අභ්‍යන්තරික IgG සහ IgM ELISA භාවිතයෙන් තක්සේරු කරන ලද ප්‍රතිදේහ ප්‍රතිචාරය සමග රෝග උග්‍රත්වය සහ වෛරසයේ ප්‍රවේණික සම්බන්ධතාව හඳුනාගැනීම</u>

විමර්ශකයන්: PI ආචාර්ය සිසිර පතිරණ (IBMBB), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), ජේමිස් තම්බිරාජා මයා (IBMBB), දක්ෂිකා ගංගානි මිය (IBMBB), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), මහාචාර්ය ඉනෝකා පෙරේරා (UOC), මහාචාර්ය සේනක රාජපක්ෂ (UOC), තේජානි පෙරේරා (UOC), සහන් සිරිවර්ධන මයා (UOC), විශේෂඥ වෛද්‍ය රජීව ද සිල්වා (MRI), විශේෂඥ වෛද්‍ය ධනුෂ්කා දසනායක (MRI), විශේෂඥ වෛද්‍ය සුරංග මානිල්ගම (MoH), විශේෂඥ වෛද්‍ය රෝහිත මුතුගල (MoH), විශේෂඥ වෛද්‍ය ධනංජා නාමලි (MoH), විශේෂඥ වෛද්‍ය ගයනි ප්‍රේමවන්ස, විශේෂඥ වෛද්‍ය සාරංග සුමතිපාල (MoH), මහාචාර්ය ඇන්ඩ්‍රියාස් නිස්වේ (රොබට් කොක් ආයතනය, ජර්මනිය)
පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක : ආචාර්ය පේෂල ගුණසේකර (IBMBB)

මූල්‍ය සම්පාදනය: ජර්මනියේ රොබට් කොක් ආයතනය විසින් මූල්‍ය අනුග්‍රහය දක්වන IDEA ව්‍යාපෘතිය
පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එය 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතිනි.

ඍ) වෛරස එන්සෙෆලයිටිස්

එක් MPhil/PhD ව්‍යාපෘතියක් 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතුනි.

i) <u>ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාත්මක වශයෙන් වැදගත් වවුලන්ගේ ව්‍යාධිජනක රෝගකාරක සහ වෛරස් එන්සෙෆලයිටිස් රෝගී අවස්ථා පිළිබඳ ප්‍රතිශක්තිකාරක හා අණුක හඳුනා ගැනීම.</u>

විමර්ශකයන්: PI: මහාචාර්ය විපුල යාපා, සම්මානිත මහාචාර්ය සුනිල් ප්‍රේමවංස, මහාචාර්ය ඇන්ඩ්‍රියාස් නිට්ව, ආචාර්ය ක්ලෝඩියා කෝල්, විශේෂඥ වෛද්‍ය ගයනි ප්‍රේමවංස, මහාචාර්ය ඕ.වී.ඩී.එස්. වීරසේන, මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති
MPhil/ PhD ශිෂ්‍ය: තේජානි පෙරේරා

මූල්‍ය සම්පාදනය: ජර්මනියේ රොබට් කොක් ආයතනය විසින් මූල්‍ය අනුග්‍රහය දක්වන IDEA ව්‍යාපෘතිය
MPhil/ PhD වැඩසටහන 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතුනි. එක් ප්‍රකාශනයක් සූදානම් වෙමින් තිබුණි.

2) අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ වැඩසටහන්

මානව හෝ සත්ව අත්හදා බැලීම් අවශ්‍ය වන ජෛව වෛද්‍ය විද්‍යාවේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. පිළිකා, මානව DNA විචලනය, වර්ධක හෝමෝන ඌනතාවයේ අණුක ප්‍රවේණිවේදය, සයිටෝමෙගාලෝ වෛරසයේ ප්‍රවේණිවේදය සහ හයිමෙනොප්ටෙරන් (venom) විෂ පිළිබඳ අණුක අධ්‍යයන ආදිය මෙයට ඇතුළත් ය.

අ) පිළිකා සහ පිළිකා කඳ සෛල

ශ්‍රී ලංකාවේ පිළිකා රෝගයේ පැතිරීම මෑතක සිට ඉහළ ගොස් ඇති අතර දළ වශයෙන් කාන්තාවන් අතර 1:25 අනුපාතයට පියයුරු පිළිකා පැතිරීම දක්නට ලැබේ. සමහර පියයුරු පිළිකා ප්‍රවේණිය අනුව හට ගන්නා අතර (මවගෙන් දුවරුනට පිළිකා කාරක ජාන උරුම වීම) අනෙක් ඒවා අහඹු ලෙස විවිධ අවස්ථාවල හටගනී (පිළිකා පිළිබඳ පවුල් ඉතිහාසයක් නැති කාන්තාවන්ට රෝගය හට ගැනීම). ස්ථූලතාව එසේ ඉඳහිට ඇති වන පියයුරු පිළිකාවට හේතු වන සාධකයක් වන නමුත් ස්ථූලතාව නිසා පිළිකා ඇති වන්නේ කෙසේ ද යන්න පැහැදිලි නැත.

2020 දී MPhil/PhD ව්‍යාපෘති හතරක් ක්‍රියාත්මක වෙමින් පැවති අතර එක් ව්‍යාපෘතියක් 2020 දී නිම කරන ලදී.

i) <u>තෝරාගත්පිළිකා වල TP53 විකෘතිය: RNA සහ ප්‍රෝටීන් මට්ටමෙන් සහ සෛල රහිත DNA වල විකෘති විශ්ලේෂණය</u>

ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන්ගේ පැරෆින් කාවැද්දූ හෝ නව පිළිකා පටක භාවිතා කරමින් පිළිකා වර්ග කිහිපයක TP 53 ප්‍රවේණි අණුවල දෛහික විකෘතිතා නිරීක්ෂණය කර RNA සහ ප්‍රෝටීන් මට්ටම්වලදී විකෘතිතා විශ්ලේෂණය අරමුණු කරයි.

විමර්ශකයන්: PI මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් (IBMBB), මහාචාර්ය එරික් එච්. කරුණානායක (IBMBB), ආචාර්ය සුමාධි ද සිල්වා (IBMBB), මහාචාර්ය ප්‍රීතිකා අහුනවෙල (වෛද්‍ය පීඨය, කොළඹ) සහ වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (ජාතික පිළිකා ආයතනය)

PhD ශිෂ්‍ය/IBMBB: වාහිනිප්‍රියා මනෝහරන්

මූල්‍ය සම්පාදනය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් ප්‍රදාන (UGC/VC/DRIC/SRSP/2014/CMB-01) හා ජාතික පර්යේෂණ සභා ප්‍රදාන (NRC 15-33) ආචාර්ය සුමාධි ද සිල්වාට
2020 දී ආචාර්ය උපාධි නිබන්ධනය විභාගය සඳහා ඉදිරිපත් කරන ලදී
එක් ප්‍රකාශනයක් 2020 වර්ෂය තුළ සිදු කරන ලදී

ii) <u>විරල පියයුරු පිළිකා ආශ්‍රිතව ඩී ලූපයෙහි ඇති වන මයිටොකෝන්ඩ්‍රියානු DNA විකෘතතාවල සහ මයිටොකෝන්ඩ්‍රියානු DNA ඒකකාණ්ඩවල ස්වභාවය හදුනා ගැනීම.</u>

මේ ව්‍යාපෘතියේ ඉලක්කය වන්නේ මයිටොකෝන්ඩ්‍රියල් D ලූප බහුරූපතාවන් පදනම් කරගත් විසිරුණු පිළිකා සඳහා විභව්‍ය ජෛව සලකුණුකරණයන් හඳුනාගැනීමය.

විමර්ශකයන්: ජේ ටී කොතලාවල (PhD ශිෂ්‍ය), PI මහාචාර්ය කමණි එච්. තෙන්නකෝන්, ආචාර්ය රුවන්දි රණසිංහ, වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (ජාතික පිළිකා ආයතනය)

මූල්‍ය සම්පාදනය: කොතලාවල මහත්මිය ලබාගත් ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය
2020 දී ආචාර්ය උපාධි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතුනි.
2020 පෙබරවාරි 12-15 පැවති කොළඹ වෛද්‍ය සභාවේදී එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.
එක් අත් පිටපතක් 2020 දී ප්‍රකාශයට පත් කරන ලදී.

iii) <u>ශ්‍රී ලංකාවේ සිංහල ජනවාර්ගික රෝගීන්ගේ විරල පියයුරු පිළිකා සඳහා අවදානම් සාධක වශයෙන් මයිටොකෝන්ඩ්‍රියල් ප්‍රවේණි අණුවල විකෘතකා සහ බහුරූපිතා</u>

මයිටොකෝන්ඩ්‍රියල් කේතන කලාපයේ බහුරූපිතාව පදනම් කරගත් විසිරුණු පිළිකා සඳහා විභව්‍ය සලකුණුකරණයන් හඳුනා ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

විමර්ශකයන්: PI මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්, ආචාර්ය රුවන්දි රණසිංහ, වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (ජාතික පිළිකා ආයතනය)
MPhil/ PhD ශිෂ්‍ය: එල් ජයසේකර
මූල්‍ය සම්පාදනය: NRC ප්‍රදානට මහාචාර්ය කමනි තෙන්නකෝන්ට (NRC-17-020)
MPhil/ PhD ව්‍යාපෘතිය 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතුනි. .
2020 පෙබරවාරි 12-15 පැවති කොළඹ වෛද්‍ය සභාවේදී එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.

iv) <u>ශ්‍රී ලංකාවේ ආවේණික ශාකවලින් පියයුරු පිළිකා සඳහා පිළිකා කඳ සෛල ඉලක්ක කරගත් ඖෂධ නියමු</u>

පියයුරු පිළිකා කඳ සෛල ඉලක්ක කරගත හැකි ආවේණික ශාකවලින් ලැබෙන ස්වාභාවික සංයෝග ඒකලනය (isolation), ව්‍යුහාත්මක හා ක්‍රියාත්මක ලක්ෂණ විභාගය ඉලක්ක කරගන්නා ලදී.

විමර්ශකයන්: PI ආචාර්ය සමීර සමරකෝන් (IBMBB). මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් (IBMBB), මහාචාර්ය නීලිකා මලවිගේ (USJP), වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (ජාතික පිළිකා ආයතනය), මහාචාර්ය දිලිප් ඊ ද සිල්වා (UOC)
MPhil/ PhD ශිෂ්‍ය/IBMBB: උමා රාජගෝපාලන්

මූල්‍ය සම්පාදනය: ජාතික පර්යේෂණ සභා ප්‍රදානය (NRC 14-067) ආචාර්ය සමීර සමරකෝන්ට
ආචාර්ය උපාධි ව්‍යාපෘතිය 2020 දී නිම කරන ලදී**.**

v) <u>මධ්‍යසාර නොවන ස්ටීටෝහෙපටයිටිස් (steatohepatitis (NASH)) ආශ්‍රිත සිරෝසිස් වල hepatocellular පිළිකා (hepatocellular carcinoma (HCC)) සඳහා පුරෝකථන සලකුණු සඳහා ජාන විශ්ලේෂණය</u>

ශ්‍රී ලාංකික ජනගහනයක NASH හා සම්බන්ධ HCC හි ජානමය පසුබිම විශ්ලේෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

විමර්ශකයන්: PI ආචාර්ය සුදේශිනී හේවගේ, මහාචාර්ය රොහාන් සිරිවර්ධන (UOK), මහාචාර්ය කමනි තෙන්නකෝන් (IBMBB), මහාචාර්ය මදුනිල් නිරිඇල්ල (UOK), ආචාර්ය සුමාධි ද සිල්වා- IBMBB)

මූල්‍ය සම්පාදනය: NRC ප්‍රදානය ආචාර්ය සුදේශිනී හේවගේ හට (NRC-19-030)
MPhil/ PhD වැඩසටහන 2020 දී ආරම්භ කරන ලදී.

ආ) මානව DNA විචල්‍යතා සහ පැරණි DNA අධ්‍යයන

MPhil/ PhD ව්‍යාපෘතියක් 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතුනි. .

i) ශ්‍රී ලංකාවේ අතීතයේ විසූ මානවයන් පිළිබඳ අණුක පුරාවිද්‍යාත්මක අධ්‍යයනය: උඩුපියන්ගල්ගේ සහ අළුගල්ගේ ලෙන් තුළින් ලබාගත් අස්ථි කොටස් ආශ්‍රයෙන් කරනු ලබන මයිටෝකොන්ඩියල් අණුක ප්‍රවේණි ද්‍රව්‍ය සහ අණුක ලිංග නිර්ණ අධ්‍යනය

පැරණි මානව ඇටසැකිලි නියැදිවල මයිටොකෝන්ඩ්‍රියල් DNA විචල්‍යතා විශ්ලේෂණය සහ අණුක ලිංගික නිගමනය මේ ව්‍යාපෘතියේ අරමුණු විය.

විමර්ශකයන්: PI ආචාර්ය රුවන්දි රණසිංහ, මහාචාර්ය කමණි එච්. තෙන්නකෝන්, මහාචාර්ය රාජ් සෝමදේව (පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (UOK), ආචාර්ය නිරාජ් රායි (BSIP, ලක්නව්, ඉන්දියාව)
MPhil/PhD ශිෂ්‍ය: ඒ එස් ප්‍රනාන්දු

මූල්‍ය සම්පාදනය: NRC ප්‍රදානය ආචාර්ය රුවන්දි රණසිංහ හට NRC-17-042)
MPhil ව්‍යාපෘතියක් 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතුනි. .
එක් අත් පිටපතක් ප්‍රකාශනය සඳහා සූදානම් කෙරෙමින් පවතී.

ඇ) අඩු උස ප්‍රමාණය පිළිබඳ අණුක අධ්‍යයනයන්

2020 දී MSc ව්‍යාපෘති දෙකක් අවසාන විය.

i) වර්ධක හෝමෝන ඌනතාවයකින් පෙළෙන දරුවෙකු තුල LHX4 ජානයේ මැකීයාම පිළිබඳව තහවුරු කිරීම සහ ලක්ෂණ හඳුනා ගැනීම.

විමර්ශකයන්: PI ආචාර්ය සුදේශිනී හේවගේ, ආචාර්ය තර්මිණී සුන්දරලිංගම්, මහාචාර්ය ශම්‍යා ද සිල්වා
MSc ශිෂ්‍ය: සෞම්‍යා සමරසිංහ
මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී එක් MSc ව්‍යාපෘතියක් අවසන් විය.

ii) වෙන්කරගත් වර්ධක හෝමෝන ඌනතාවයකින් පෙළෙන දරුවන් දෙදෙනෙකු තුල ඇති *GH1* සම්පූර්ණ ජානයේ මැකීයාමේ නිශ්චිත කඩයිම් අවස්ථාව හඳුනාගැනීම.

විමර්ශකයන්: PI ආචාර්ය සුදේශිනී හේවගේ (IBMBB), ආචාර්ය තර්මිණී සුන්දරලිංගම් (IBMBB), මහාචාර්ය ශම්‍යා ද සිල්වා
MSc ශිෂ්‍ය: ෆාතිමා නුස්හා නූහා
මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී එක් MSc ව්‍යාපෘතියක් අවසන් විය.

ඈ) <u>පරිවෘත්තීය රෝග පිළිබඳ අණුක අධ්‍යයනයන්</u>

2020 දී MSc ව්‍යාපෘති දෙකක් අවසන් විය.

(i) <u>ශ්‍රී ලංකාවේ වෙසෙන හිමෝසිස්ටිනියුරියා (Homocystinuria) සහිත ළමුන් සමූහයකගේ Methylenetetrahydrofolate reductase (MTHFR) ජානයේ තෝරාගත් වෙනස්කම් කිහිපයක් හඳුනාගැනීමේ අධ්‍යයනය.</u>

විමර්ශකයන්: PI ආචාර්ය සුමාධි ද සිල්වා (IBMBB), මහාචාර්ය නිමල් පුණ්‍යසිරි (IBMBB), වෛද්‍ය ඉරේෂා ජාසිංගේ,රසායනික ව්‍යාධි විද්‍යා විශේෂඥ වෛද්‍ය, රිජ්වේ ආර්යා රෝහල
MSc ශිෂ්‍ය/IBMBB: ඩී. ටී. මහලියනගේ
මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
අවසාන නිබන්ධනය 2020 දී සාර්ථකව භාරදෙන ලදී.

<u>ii) ශ්‍රී ලංකාවේ වෙසෙන හිමෝසිස්ටිනියුරියා (Homocystinuria) සහිත ළමුන් සමූහයකගේ Cytathionine beta-synthase (*CBS*) ජානයේ තෝරාගත් වෙනස්කම් කිහිපයක් හඳුනාගැනීමේ අධ්‍යයනය.</u>

විමර්ශකයන්: PI ආචාර්ය සුමාධි ද සිල්වා (IBMBB), මහාචාර්ය. නිමල් පුණ්‍යසිරි (IBMBB), වෛද්‍ය ඉරේෂා ජාසිංගේ, රසායනික ව්‍යාධි විද්‍යා විශේෂඥ වෛද්‍ය, රිජ්වේ ආර්යා රෝහල.
MSc ශිෂ්‍ය /IBMBB: එන්. සමරසිංහ
මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
අවසාන නිබන්ධනය 2020 දී සාර්ථකව භාරදෙන ලදී.

ඉ) <u>සයිටොමෙගලෝ වෛරසයේ ප්‍රවේණි විද්‍යාව</u>

2020 දී එක් MSc ව්‍යාපෘතියක් අවසන් විය.

<u>ප්‍රතිශක්ති ඌනතාවයන්ගෙන් පෙළෙන රෝගීන්ගේ ගැන්සික්ලෝවියර් ප්‍රතිරෝධී (ganciclovir resistance) UL97 ජානයේ විකෘතිතා හඳුනා ගැනීමේ මූලික අධ්‍යයනය</u>

විමර්ශකයන්: PI වෛද්‍ය ෂූඩ් ජයමහ, (MRI), වරුණි රත්නායක මිය, ආචාර්ය නර්මදා ප්‍රනාන්දු
MSc ශිෂ්‍ය/IBMBB: ජේම්ස් තම්බිරාජා

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
මෙම MSc ව්‍යාපෘතිය 2019 දී නිම කල අතර නිබන්ධනය 2020 දී භාරදෙනු ලැබිණි.
2020 දී ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීව විද්‍යාඥයින්ගේ විද්‍යාලයේ 29 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේදී එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.

ඊ) <u>අසාත්මීකාරක හඳුනාගැනීම සහ ලක්ෂණ විභාගය පිළිබඳ අණුක අධ්‍යයනයන්</u>

2020 දී එක් PhD ව්‍යාපෘතියක් අවසන් විය. විද්‍යාපති අධ්‍යයන තුනක් ක්‍රියාත්මකව පැවතුණු අතර තවත් MSc අධ්‍යයන දෙකක් මෙම වර්ෂයෙහිදී අරඹන ලදී.

i)*Apis dorsata* විෂ සහ *Vespa affinis* විෂ පිළිබඳ ප්‍රතිශක්ති රසායනික ලක්ෂණ විභාගය

Apis dorsata (ආසියානු යෝධ මී මැස්සා)ගේ විෂෙහි ප්‍රතිශක්ති ප්‍රවේණ්‍යානුවල අණුක සහ ප්‍රතිශක්තිවේදී ලක්ෂණ විභාගය සහ නිර්සංවේදීකරණ නියමාවලියක් (Protocol) ස්ථාපනය කිරීම සඳහා *A. cerana* වල විෂ ප්‍රතිශක්ති ප්‍රවේණ්‍යානු සමඟ ප්‍රතිශක්ති හරස් ප්‍රතික්‍රියාකාරීත්වයක් ඉලක්ක කරන ලදී.

විමර්ශකයන්: PI වෛද්‍ය රජීව ද සිල්වා (MRI), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය ශ්‍රියානි ඩයස් (UOK) හා වෛද්‍ය ඊ. ඩබ්ලිව්. ආර්. ඒ. විතාරණ (විශේෂඥ වෛද්‍ය, දෙනියාය මූලික රෝහල)
PhD ශිෂ්‍ය: පේශල ගුණසේකර

මූල්‍ය සම්පාදනය: ජාතික විද්‍යා පදනම ප්‍රදානය (NSF/RG/2014/HS/02) වෛද්‍ය රජීව ද සිල්වාට (PI) සහ මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (සහකාරක) හා වෛද්‍ය පර්යේෂණ ආයතනය වෛද්‍ය රජීව ද සිල්වාට (Project ID:/46-2013)
2020 දී එක් PhD ව්‍යාපෘතියක් අවසන් විය. එක් සම්පූර්ණ ලිපියක් සම-සමාලෝචනය කරන ලද සුවිගත කරන ලද සඟරාවකට 2020 දී ඉදිරිපත් කරන ලද අතර එය දැනට සමාලෝචනයට ලක්ව ඇත.

ii) ශ්‍රී ලංකාවේ කුඹි විෂට ආසාත්මිකතාවන් පෙන්වන රෝගීන් ගේ, *Apis dorsata* සහ *Vespa affinis* විෂ සංඝටක වල හරස් ප්‍රතික්‍රියාකාරී ප්‍රතිදේහ පිළිබඳ අධ්‍යයනය

විමර්ශකයන්: PI වෛද්‍ය රජීව ද සිල්වා (MRI), වෛද්‍ය ධනුෂ්කා දසනායක (MRI), ආචාර්ය පේශල ගුණසේකර මයා (IBMBB), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB)

MSc ශිෂ්‍ය: රශෙන්කා පීරිස්
මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී එක් MSc ව්‍යාපෘතියක් අවසන් විය. AISSL හි ද්විවාර්ෂික විද්‍යාත්මක සැසි සඳහා එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.

iii) ඩෙංගු වෛරසය ආසාදනය වූ බේසොෆිල් (*basophils*) මත ශාක නිස්සාරන සහ ඖෂධවේදී මිශ්‍රණයන්ගේ ස්ථායීකරණ බලපෑම

විමර්ශකයන්: PI ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB),
MSc ශිෂ්‍ය: වෛද්‍ය චතුරිකා විජේගුණරත්න

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී එක් MSc ව්‍යාපෘතියක් අවසන් විය. AISSL හි ද්විවාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේදී එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.

iv) අසාත්මිකතාකාරක *Cocos nucifera, Artocarpus heterophyllus, Boerhavia diffusa* හා *Moringa oleifera* වල අසාත්මිකතා හඳුනා ගැනීම

විමර්ශකයන්: PI වෛද්‍ය ධනුෂ්කා දසනායක (MRI), වෛද්‍ය රජීව ද සිල්වා (MRI), වෛද්‍ය නීලිකා මලවිගේ (USJP), ආචාර්ය පේෂල ගුණසේකර (IBMBB)
MSc ශිෂ්‍ය: ජනිතා ඉද්දගොඩ

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී එක් විද්‍යාපති ව්‍යාපෘතියක් අවසන් විය. AISSL හි ද්විවාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේදී එක් සාරාංශයක් ඉදිරිපත් කරන ලදී.

v) තෝරාගත් ඖෂධීය ශාක සාරයක් මගින් RBL සෛල මගින් හිස්ටමින් මුදා හැරීම නිෂේධනය කිරීම

විමර්ශකයන්: PI ආචාර්ය සිසිර පතිරණ IBMBB), දිලානි රුක්ෂලා මිය (IBMBB), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB)

MSc ශිෂ්‍ය: සුමේද කුලතුංග

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී MSc ව්‍යාපෘති කටයුතු සිදු කෙරෙමින් පැවතිනි.

vi) Psoriatic arthritis රෝගීන්ගේ භක්ෂසෛල මත තෝරාගත් ශාක ව්‍යුත්පන්න සංරචක වල ප්‍රති-ප්‍රදාහික බලපෑම පිළිබඳ නාලස්ථ අධ්‍යයනය

විමර්ශකයන්: PI ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), මහාචාර්ය සේනක රාජපක්ෂ (UOC), ආචාර්ය චාලුක්‍ය ගුණසේකර (MoH)

MSc ශිෂ්‍ය: ෆාතිමා ෂබීර්

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී MSc ව්‍යාපෘති කටයුතු සිදු කෙරෙමින් පැවතිනි.

3) ශාක අණුක ජෛව විද්‍යා පිළිබඳ පර්යේෂණ වැඩසටහන්

MSc අධ්‍යයන දෙකක් හා තවත් පර්යේෂණ ව්‍යාපෘතියක් 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතුනි. .

i) රතු තේ ප්‍රවේශයන්හි ඇන්තොසයනින් (Anthocyanins) පැනිකඩ

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය මගින් කරන ලද රතු තේ ප්‍රවේශයන්හි ඇන්තොසයනින් (Anthocyanins) පැනිකඩ පිළිබඳ අධ්‍යයනය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

විමර්ශකයන්: PI ආචාර්ය එම්. ඒ. බී. රණතුංග (තේ පර්යේෂණ ආයතනය), ජේ. ඩී. කෝට්ටව ආරච්චි මයා (තේ පර්යේෂණ ආයතනය), මහාචාර්ය නිමල් පුණ්‍යසිරි.

මූල්‍ය සම්පාදනය: තේ පර්යේෂණායතනය

ii) Agarwood නිපදවන ශ්‍රී ලංකාවේ ශාක ප්‍රභේද සඳහා විශේෂිත වූ සලකුණු සංවර්ධනය

විමර්ශක: PI ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර
MSc ශිෂ්‍ය: සෙල්ලචාමි ප්‍රියන්කන්

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී MSc ව්‍යාපෘති කටයුතු සිදු කෙරෙමින් පැවතිනි.

iii) ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක් වූ ආවේණික ඕකිඩ් වල DNA තීරු කේතනය සහ අණුක වර්ගීකරණය

විමර්ශක: PI ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර
MSc ශිෂ්‍ය: සාරා අෂ්රෆ්

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී MSc ව්‍යාපෘති කටයුතු සිදු කෙරෙමින් පැවතිනි.

3) පරිවෘත්තීය

2020 දී ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මකව පැවතිණි.

i) සහල් වල ඇමයිනෝ අම්ල විශ්ලේෂණය

ඉහළ කාර්යසාධනයක් සහිත ද්‍රව වර්ණදේහ (High Performance Liquid Chromatography) සහ LC-MSMS භාවිතා කරමින් සහල්වල ඇමයිනෝ අම්ල ප්‍රමාණය කිරීම සඳහා ක්‍රමවේදයන් සකස් කරන ලදී. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සහල් ප්‍රභේද ඇතුළු සහල්වල ඇමයිනෝ අම්ල මට්ටම ගණනය කිරීම සඳහා මෙම ක්‍රම භාවිතා කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. සම-සමාලෝචනය කරන ලද ලිපි හයක් මෙම ව්‍යාපෘතියෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

විමර්ශකයන්: PI විමර්ශි ලියනාරච්චි (ITI), මහාචාර්ය කේ. ආර්. මහානාම (UOC), ආචාර්ය එච්. පී. පී. එස්. සෝමසිරි (ITI), මහාචාර්ය නිමල් පුණ්‍යසිරි
මූල්‍ය සම්පාදනය: කාර්මික තාක්ෂණ ආයතනය

ii) ඖෂධ පරිවෘත්තීය

හින්නෝන්මාදය සහිත ශ්‍රී ලංකාවේ රෝගීන් සඳහා HPLC භාවිතා කරමින් Clozapine හි චිකිත්සක ඖෂධ අධීක්ෂණය (TDM).
විමර්ශකයන්: PI ආචාර්ය තුසිත වික්‍රමසිංහ සහ ඔහුගේ කණ්ඩායම, සායනික ෆොවරසායන අ.අංශය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය සහ මහාචාර්ය නිමල් පුණ්‍යසිරි, IBMBB

මූල්‍ය සම්පාදනය: කැළණිය විශ්වවිද්‍යාලය

4) ක්ෂුද්‍රජීවීන්ගේ ජෛව රසායනය සහ අණුක ජෛව විද්‍යාව පිළිබඳ පර්යේෂණ වැඩසටහන

2020 දී එක් PhD ව්‍යාපෘතියක් අවසාන විය.

i)කෘමිනාශක ක්‍රියාකාරීත්වය සහිත *Bacillus thuringiensis* ඒකලනයන් හඳුනාගැනීම

සහල් සහ එළවළු පරපෝෂිතයන් පාලනය සඳහා භාවිත කළ හැකි වැඩි දියුණු වූ කෘමිනාශක ක්‍රියාකාරීත්වය සහිත *Bacillus thuringiensis* ප්‍රභේද ඒකලනය සහ ලක්ෂණ විභාගය ඉලක්ක කරන ලදී.

විමර්ශකයන්: PI මහාචාර්ය ඕවීඩීඑස්ජේ වීරසේන (IBMBB), ආචාර්ය රාධිකා සමරසේකර (කාර්මික තාක්ෂණ ආයතනය)

PhD ශිෂ්‍ය/IBMBB: රශිනි බරගමආරච්චි

මූල්‍ය සම්පාදනය: ජාතික විද්‍යා පදනම හා ජාතික පර්යේෂණ සභාව ආචාර්ය රාධිකා සමරසේකරට (NSF/RG/2011/BT/05)
2020 දී එක් PhD ව්‍යාපෘතියක් අවසාන විය.

5) ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණ

අ) ප්‍රතිප්‍රදාහක, ප්‍රතිශක්ති අනුකූලතා (immunomodulatory), ප්‍රති අසාත්මික බලපෑම් සහිත ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණ

2020 දී PhD ව්‍යාපෘති දෙකක් අවසාන වෙමින් පැවති අතර MSc ව්‍යාපෘතියක කටයුතු සිදු කෙරෙමින් පැවතිනි.

මේ අධ්‍යයනයන්හි අවධානය යොමු වූයේ ප්‍රදාහක ප්‍රතිචාර හා සම්බන්ධ හෝ ඒවා මගින් සිදු වූ හෝ ප්‍රතිශක්ති අනුකූලතා වශයෙන් භාවිත කරනු ලබන ප්‍රතිචාර හා සම්බන්ධ රෝගවලට ප්‍රතිකාර කිරීමේදී භාවිත කරනු ලබන ඖෂධීය ශාක පිළිබඳවය.

i) ශ්‍රී ලංකාවේ ඖෂධීය ශාකවලින් ඖෂධීය නියමු. (drug leads): ප්‍රතිශක්ති අනුකූලතා / ප්‍රති අසාත්මිකතා ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශන

තෝරා ගනු ලැබූ ඒකදේශික හා ඖෂධීය ශාකවල විභව්‍ය ප්‍රතිශක්ති අනුකූලතා/ ප්‍රතිඅසාත්මිකතා ක්‍රියාකාරීත්වයන් අගැයීම ඉලක්ක කරනු ලැබිණ.

විමර්ශකයන්: PI මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය දිලිප් ඊ. ද සිල්වා (IBMBB)
PhD ශිෂ්‍ය/IBMBB: බී. ඒ. දිලානි රුක්ෂලා
මූල්‍ය සම්පාදනය: උසස් අධ්‍යාපන අමාත්‍යාංශය: ඖෂධීය ශාකවලින් ලබාගන්නා ඖෂධීය නියමු
ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සිදු වෙමින් පැවතුනි. එක් අත් පිටපතක් නැවත ප්‍රකාශනය සඳහා ඉදිරිපත් කරන ලදී. තවත් අත් පිටපත් දෙකක් ප්‍රකාශයට පත් කිරීමට සූදානම් වෙමින් තිබිණි.

ii) *Alpinia carcarata* රයිසෝම හා පත්‍රවලින් ලබාගන්නා ප්‍රති ප්‍රදාහ සංයෝග වෙන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම් අධ්‍යයනය

ප්‍රදාහ රෝග / තත්ත්වයන් සඳහා ප්‍රතිප්‍රදාහ සංයෝග සහ වටිනාකම එකතු වූ නිෂ්පාදිත වෙන් කිරීම ඉලක්ක කරගන්නා ලදී.

විමර්ශකයන්: PI ආචාර්ය සෙල්වලක්ෂ්මී වෙල්වේන්ද්‍රන් (ITI), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය ජී.ඒ.එස්. ප්‍රේමකුමාර
PhD ශිෂ්‍ය: මධුවන්ති චන්ද්‍රකාන්තන්

මූල්‍ය සම්පාදනය: ජාතික පර්යේෂණ සභාව ආචාර්ය සෙල්වලක්ෂ්මී වෙල්වේන්ද්‍රන් හට (NRC-12-081)
PhD නිබන්ධනය 2020 දී නිමවෙමින් තිබුණි. එක් පත්‍රිකාවක් ප්‍රකාශනයට පත් කරන ලදී.

.

iii) *Erythroxylum moonii* හා *Erythroxylum monogynum* වල ප්‍රතිශක්ති අනුකූලතා ක්‍රියාකාරිත්වය අධ්‍යනය කිරීම

විමර්ශකයන්: PI ජයනි කාරියවසම් මහත්මිය (IBMBB), දිලානි රුක්ෂලා මිය (IBMBB), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB)
MSc ශිෂ්‍ය: සජීව් ද සිල්වා

මූල්‍ය සම්පාදනය: IBMBB (MSc අධ්‍යයන)
2020 දී MSc ව්‍යාපෘති කටයුතු සිදු කෙරෙමින් පැවතිනි.

ආ) ඖෂධීය ශාකවල පිළිකා මර්දන බලපෑම්

2020 දී අධ්‍යයන 3ක් ක්‍රියාත්මකව පැවතුණි.

i) *Vernonia zeylanica* (ආරිද්ද) ශාකයෙහි පිළිකා මර්දක බලපෑම්

විමර්ශකයන්: PI මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් (IBMBB), ආචාර්ය මෙරාන් කේශව එදිරිවීර (පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක), ආචාර්ය සමීර ආර්. සමරකෝන් (IBMBB), මහාචාර්ය අයිරා තාබෘ (බාහිර මහාචාර්ය , IBMBB)

මූල්‍ය සම්පාදනය: ජාතික විද්‍යා පදනම් ප්‍රදාන (NSF/2016/BT-02) මහාචාර්ය කමණි එච්. තෙන්නකෝන්ට.
එක් පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

ii) *Mangifera indica* (ඉන්දියාව) සහ *Mangifera zeylanica* (ශ්‍රී ලංකාව) විවිධ කොටස්වල ප්‍රතිපිළිකා සහ රේඩියෝ අභාජ්‍ය බලපෑම් සහ හරිත රජත නැනෝ සංයෝජිතවල බලපෑම පිළිබඳ *In vitro* සහ *in vivo* අපිජනන විමර්ශනයන්

විමර්ශකයන්: PI මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්, ආචාර්ය සමීර සමරකෝන්, ආචාර්ය මෙරන් එදිරිවීර (IBMBB), ආචාර්ය එන්. දේවිප්‍රියා හා ආචාර්ය වී. වඩිවේල් (ඉන්දියාව)
MPhil ශිෂ්‍ය/IBMBB: A.A.D.N පෙරේරා

මූල්‍ය සම්පාදනය:-ශ්‍රී ලංකා ද්විපාර්ශවීය එකඟත්වය යටතේ විද්‍යා අමාත්‍යාංශයේ තාක්ෂණ හා පර්යේෂණ ප්‍රදානය.

MPhil ව්‍යාපෘතියක් 2020 දී ක්‍රියාත්මක වෙමින් පැවතුනි. ශ්‍රී ලංකා විද්‍යාඥයින් සහ ඉන්දියානු ප්‍රතිපාර්ශවකරුවන් හුවමාරු චාරිකා පවත්වා තිබේ.

iii) පිළිකා මර්දන ඖෂධ සංවර්ධනය

විමර්ශකයන්: මහාචාර්ය කමනී තෙන්නකෝන්, ආචාර්ය සමීර සමරකෝන්, මහා. අයිරා තාබෘ, මහාචාර්ය ඊ. දිලිප් ද සිල්වා, මහාචාර්ය නීද්‍රා කරුණාරත්න (UoP), ආචාර්ය ඒ. අධිකාරි (නේපාලය), මහාචාර්ය ඉක්බාල් වෞද්රි (පකිස්තානය), ආචාර්ය පූර්ණා පියතිලක (වයඹ විශ්වවිද්‍යාලය) ආචාර්ය ගෝමික උඩුගමසූරිය, ඇමෙරිකා එක්සත් ජනපදය.

පර්යේෂණ විද්‍යාඥයන් : කණිෂ්ක සේනාතිලක, ආචාර්ය මෙරන් එදිරිවීර

MPhil ශිෂ්‍ය: නිමේෂා වික්‍රමසිංහ, ජේ. තුෂ්‍යන්තන්, කැළුම් රත්නායක, ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූවන් හා MSc සිසුන්

මූල්‍ය සම්පාදනය: ජාතික විද්‍යා පදනම් ප්‍රදාන - RPHS/2016-C07, PI මහාචාර්ය. කමනි තෙන්නකෝන් හා ආචාර්ය සමීර සමරකෝන් (Co-I)
2020 දී MPhil/PhD වැඩසටහන් තුනක් ක්‍රියාත්මකව තිබුණි.

6) කාර්මික යෙදවුම් පිළිබඳ පර්යේෂණ වැඩසටහන්

2020 දී එක් PhD අධ්‍යයනයක් ක්‍රියාත්මක වෙමින් තිබුණි.

i) ශ්‍රී ලාංකික වෙළෙඳපොළේ ඇති ඖෂධීය ශාක වට්ටෝරුවක ප්‍රතිශක්ති අනුකූලතා ක්‍රියාකාරීත්වය

ඖෂධීය ශාක කොටස් 14 කින් සමන්විත වන ඖෂධීය නිෂ්පාදනයක් වන ලින්ක් සමහන්වල ප්‍රතිශක්ති අනුකූලතා ක්‍රියාකාරීත්වය සහ ප්‍රතිශක්ති යාන්ත්‍රණයන් විමර්ශනය කිරීම මේ අධ්‍යයනයේ ඉලක්කය විය.

විමර්ශකයන්: PI මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය ඕවීඩීඑස්ජේ වීරසේන (IBMBB), මහාචාර්ය ඒ. අබේසේකර, ලින්ක් ලංකා නැචුරල් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්
PhD ශිෂ්‍ය: ලෝෂිණී රණවීර

මූල්‍ය සම්පාදනය: MPhil/PhD අධ්‍යයනය සඳහා ලින්ක් නැචුරල් ප්‍රොඩක්ට්ස් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ IBMBB අතර අවබෝධතා ගිවිසුම අනුව පර්යේෂණ සහයෝගිතා අධ්‍යයනය ආරම්භ කරන ලදී.

2020 දී PhD පර්යේෂණය ක්‍රියාත්මකව පැවැති අතර එක් අත් පිටපතක් ප්‍රකාශයට පත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලදී. දෙවන අත් පිටපත ප්‍රකාශයට පත් කිරීමට සූදානම් වෙමින් පැවතිනි.

7) ශ්‍රී ලංකාවේ සත්ත්ව විශේෂවල අණුක හඳුනාගැනීම පිළිබඳ පර්යේෂණ වැඩසටහන

2020 දී එක් MPhil/PhD අධ්‍යයනයක් ක්‍රියාත්මක වෙමින් තිබිණ.

අණුක ජෛව විද්‍යාත්මක තාක්ෂණයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන සත්ත්ව විශේෂ හඳුනා ගැනීම මේ අධ්‍යයනයේ අරමුණු විය.

i) <u>නව සත්ත්ව විශේෂවල අණුක හඳුනාගැනීම</u>

විමර්ශකයන්: PI මෙන්ඩිස් වික්‍රමසිංහ මයා (ශ්‍රී ලංකා උරග විද්‍යා සංගමය), මහාචාර්ය කමනි තෙන්නකෝන් (IBMBB) සහ ආචාර්ය සමීර ආර්. සමරකෝන් (IBMBB)

පර්යේෂණ ශිෂ්‍ය: නෙතු වික්‍රමසිංහ (ශ්‍රී ලංකා උරග විද්‍යා සංගමය)

මූල්‍ය සම්පාදනය: ශ්‍රී ලංකා උරග විද්‍යා සංගමය

8) භාවනාව හා සෞඛ්‍යය පර්යේෂණ වැඩසටහන

2020 දී එක් MPhil/PhD අධ්‍යයනයක් ක්‍රියාත්මක වෙමින් තිබිණ.

<u>i) භාවනා කරන්නන්ගේ ආතති ප්‍රතිචාරයේ ප්‍රතිශක්තිකරණ, හෝමෝන හා ජෛව රසායනික පරාමිතීන් පිළිබඳ අධ්‍යයනය.</u>

විමර්ශකයන්: PI මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය ඩී. එච්. වරාවිටගේ, මහාචාර්ය දිල්ෂානි දිසානායක (වෛද්‍ය පීඨය, කොළඹ).

MPhil/ PhD ශිෂ්‍ය: ජේ.සී. තම්බිරාජා

මූල්‍ය සම්පාදනය: ලෝක බැංකු ප්‍රදාන No 6026 – LK/ 8743 – LK මගින් අරමුදල් සැපයෙන AHEAD ව්‍යාපෘතිය - මහාචාර්ය දිල්ෂානි දිසානායකට

එක් අත් පිටපතක් ප්‍රකාශයට පත් කිරීමට සූදානම් වෙමින් තිබිණි.

සේවා – IBMBB

1. IBMBB කාර්ය මණ්ඩලය විසින් පහත දැක්වෙන සේවා ලබාදෙන ලදී
   i) DNA අනුක්‍රමණ සේවා
   ii) සෛල රෝපණ පහසුකම් *
   iii) පිළිකා, සංවර්ධන ආබාධ හා ප්‍රතිශක්තිකරණ ඌනතා ආබාධ වැනි මානව රෝග කිහිපයක් සඳහා ජාන විශ්ලේෂණය
   iv) රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා HPLC පහසුකම
   [* *non ATCC Cell lines* සඳහා ලබාගත හැකිය]

2. පර්යේෂණ හා උසස් අධ්‍යාපන කටයුතු සඳහා වෘත්තීය උපදේශන ලබා දීම

3. ආරාධිත දේශන, මාර්ග සංදර්ශන සහ වෙනත් වැඩසටහන් පැවැත්වීම තුළින් ග්‍රාමීය, නාගරික නොවන පාසල්වල උසස්පෙළ සිසුන්ගේ අණුක ජීවවිද්‍යා හා ජෛව රසායන දැනුම පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීමට ව්‍යාපෘති සංවර්ධනය කිරීම

2020 දී ව්‍යාපාර සංවර්ධන ඒකකය යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්

අ) බුද්ධිමය දේපළ අයිතිවාසිකම් (IPR) සහ දැනුවත්භාවය පිළිබඳ පුහුණුව

ව්‍යාපාර සංවර්ධන ඒකකය 2020 ජූලි 29 වන දින බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ දැනුවත්භාවය පිළිබඳ පුහුණුව ලබා දීමෙහි නිරත විය.

ආ)IBMBB පර්යේෂණ ව්‍යාපෘතිවල පේටන්ට් බලපත්‍රය ලබාගතහැකි නිමවුම්

ව්‍යාපාර සංවර්ධන ඒකකය IBMBB පර්යේෂණ ව්‍යාපෘතිවල පේටන්ට් බලපත්‍ර ලබාගතහැකි නිර්මාණ දෙකකට පේටන්ට් බලපත්‍ර ගැනීම සඳහා පූර්ව කලා සෙවීම, එම නව නිපැයුම්වල තොරතුරු විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකාරකය සමග හුවමාරු කර ගැනීම, අනාවරණය නොකිරීමේ ගිවිසුම සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම (UBL සහ IBMBB අතර) එකී නව නිපැයුම් සඳහා එම පේටන්ට් බලපත්‍ර අයදුම්පත්, PCT සහ දේශීය පේටන්ට් අයදුම්පත් කෙටුම්පත් කිරීම ආදි කටයුතු වල නිරත විය.

ඇ) IBMBB හි වාණිජකරණය කළ හැකි නවෝත්පාදන හා විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකාරකය සමග සන්නිවේදනය කිරීම

IBMBB හි නව නිපැයුම් වාණිජකරණය කිරීම සඳහා AHEAD සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයෙන් අරමුදල් ඉල්ලා ආචාර්ය සමීර සමරකෝන්, ආචාර්ය සිසිර පතිරණ හා ආචාර්ය නර්මදා ප්‍රනාන්දුගේ වාණිජකරණය කළ හැකි නව නිපැයුම් පිළිබඳ විස්තර ලැයිස්තුවක් UBL වෙත ඉදිරිපත් කරන ලදී.

ඈ) විවෘත දිනය - 2020

IBMBB හි 8 වන වාර්ෂික අතථ්‍ය විවෘත දිනය 2020 ඔක්තෝබර් 9 වන දින පවත්වන ලදී. IBMBB හි සියලුම ආචාර්යවරු දැනට ආයතනය මගින් පිරිනැමෙන පශ්චාත් උපාධි පාඨමාලා හා සිදු වෙමින් පවතින පර්යේෂණ ක්‍රියාකාරකම් ගැන සහභාගි වූ සිසුන් හා පර්යේෂකයන් සමග කතාබහට එක්වූහ . පශ්චාත් උපාධි පාඨමාලා සහ කෙටි පාඨමාලා හැදෑරීමට උනන්දුවක් දක්වන මාර්ගගත අමුත්තෝ එක් එක් පාඨමාලාවට අදාළ තොරතුරු ලබා ගත්හ.

ඉ) **2021 වසර සඳහා IBMBB මගින් පිරිනැමෙන විද්‍යාපති වැඩසටහන් හා කෙටිකාලීන පාඨමාලා**
ව්‍යාපාර සංවර්ධන ඒකකය 2021 වසර සඳහා IBMBB මගින් පිරිනැමෙන විද්‍යාපති වැඩසටහන් හා සෛල රෝපණ ක්‍රමවේදයන් සහ උසස් ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ IBMBB විසින් සපයනු ලබන කෙටි පාඨමාලාවලට බඳවා ගැනීම් පිළිබඳ දැන්වීම්/ පෝස්ටර් සකස් කිරීම සම්බන්ධීකරණය කිරීමෙහි නිරත විය.

IBMBB තත්ත්ව සහතික කුටිය (QA Cell)

IBMBB තත්ත්ව සහතික කුටිය මගින් 2020 සිදුකළ ක්‍රියාකාරකම්වල සාරාංශය

- ආචාර්ය නර්මදා ප්‍රනාන්දු IBMBB තත්ව සහතික කුටියේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කළාය.

- ජනිතා ඉද්දගොඩ මහත්මිය තත්ව සහතික කුටියේ විද්‍යාත්මක සහකාර ලෙස 2020 පෙබරවාරි සිට 2020 ජූලි දක්වා කටයුතු කළාය.
  2020 නොවැම්බර් මස දිලානි රුක්ෂලා මිය තත්ව සහතික කුටියේ විද්‍යාත්මක සහකාර ලෙස පත් කරන ලදී.

- 2015 ආයතනික සමාලෝචනය සඳහා රැස්කරගත් තොරතුරු ඩිජිටල්කරණය 2020 ජූනි මාසය වන විට අවසන් කරන ලදී.

- BOC සහ IBMBB අතර ගිවිසුම 2020 ජූනි මාසයේදී අත්සන් කරන ලදී. නව ගෙවීම් දොරටුව සම්පූර්ණ කිරීම සඳහා නව පද්ධතියක් සංවර්ධනය වෙමින් පවතී.

- පරාස සම්බන්ධීකාරකවරුන් නැවත පත් කරන ලද අතර ලේඛන හා ක්‍රියා පටිපාටි නිසි ලෙස සටහන් කිරීමට සැලසුම් කර ඇත. නව තොරතුරු හා ක්‍රියාවලි එකතු කිරීම ආරම්භ කරන ලදී.

- සිසුන්ගේ ප්‍රතිපෝෂණ ආකෘතිපත්‍ර ලබා ගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

- තත්ව සහතික කුටිය සඳහා ද්විතියික වෙබ් අඩවියක් ඇතුළුව අමතර වෙබ් පිටු IBMBB වෙබ් අඩවියේ සංවර්ධනය කරන ලදී.

- අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ පැතිකඩ යාවත්කාලීන කරන ලදී.

- පේටන්ට් බලපත්‍ර අයදුම්පතක් ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා "බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ පූර්ව කලා සෙවීම" පිළිබඳ ආරාධිත දේශනයක් / සම්මන්ත්‍රණයක් ආචාර්ය සම්පත් පුංචිහේවා සහ විශ්ව විද්‍යාල ව්‍යාපාර සම්බන්ධකයෙහි තිලිණ වීරකෝන් මහතා විසින් 2020 ජූලි 29 දින පවත්වන ලදී. ආචාර්ය පුන්චිහෙවා ආරාධිත දේශනය පැවැත්වූ අතර, වීරකෝන් මහතා සැසිවාරයට පෙර IBMBB හි කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා ප්‍රායෝගික වැඩ සටහනක් පැවැත්වීය.

ආයතනයට පැමිණි අමුත්තන්

ස්පාඤ්ඤයේ ග්‍රැනඩා විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ජානවිද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ෆෙඩරිකෝ සූරිටා මාටිනස් විසින් ආරාධිත දේශනයක් පවත්වන ලදී. මෙය ‘‘ජානමය වශයෙන් වෙනස් කරන ලද සතුන් (ඩ්‍රොසෝෆිලා ඩිම්බකෝෂයේ විෂබීජ හා සෝමාටික් සෛල අතර සෛල අන්තර්ක්‍රියා)’’ පිළිබඳව 2020 පෙබරවාරි 07 වන දින **IBMBB** හි සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි**.**

කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව -2020

පහත වගුවේ දැක්වෙන පරිදි කාර්ය මණ්ඩල සාමාජිකයෝ පස් දෙනෙක් පුහුණු පාඨමාලා ලබා විවිධ අංශවල පුහුණු පාඨමාලාවලට සහභාගි වූහ.

නම	තනතුර	වැඩමුළුව / පුහුණු පාඨමාලාව	කාලසීමාව
ආචාර්ය පිපීඑස්එල් පතිරණ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	CTHE පාඨමාලාව	මාස 10
අනෝමා ජයසෝම මහත්මිය	තාක්ෂණ නිලධාරී, I ශ්‍රේණිය	ගබඩා කළමනාකරණය	මාස 06
බී.සී.එම්. පෙරේරා මහත්මිය	කළමනාකාර සහකාර, III ශ්‍රේණිය	රජයේ නිලධාරීන්ගේ නිවාඩු විධි විධාන	2020 පෙබ. 10 හා 11
එස්.ඒ.අයි.යූ. සමරසිංහ මහත්මිය	කළමනාකාර සහකාර (පොත් තබන්නා) III ශ්‍රේණිය	ගිණුම්කරණ කටයුතු වැඩි දියුණු කිරීම	2020 සැප්. 07
එච්.ටී.ඩී.ටී. හෙට්ටිආරච්චි මහත්මිය	කළමනාකාර සහකාර, III ශ්‍රේණිය	Microsofi Office EXCEL උසස් වැඩමුලුව	2020 සැප්. 17 හා 18

බාධක

2020 ක්‍රියාකාරී සැලැස්ම හා 2020-2024 ආයතනික/ උපායමාර්ගික හා කළමනාකරණ සැලැස්මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට 2020 දී මූල්‍ය සම්පත් ප්‍රධාන බාධාවක් විය. ආයතනය විසින් ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 92 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර තථ්‍ය වියදම රජය විසින් වෙන් කර ඇති මුදල වූ රු. මිලියන 3.53 කට සීමා විය. තවද, විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ඇති අනෙකුත් පීඨ සඳහා ප්‍රතිපාදන ලබා දී ඇති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් IBMBB වෙත පර්යේෂණ ප්‍රතිපාදන සඳහා කිසිදු මුදලක් ලැබී නොමැත.

කොවිඩ් -19 පළමු වරට 2020 මාර්තු මාසයේදීත්, දෙවන වරට 2020 ඔක්තෝම්බර් මාසයේදීත් පැතිරයාම නිසා ස්ථානීය අධ්‍යයන සහ වෙනත් ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම කඩාකප්පල් වී ඇත. ඉගැන්වීමේ ක්‍රියාකාරකම් මාර්ගගත මාදිලියට පරිවර්තනය කළද, මෙය ප්‍රායෝගික විෂය සංරචක පැවැත්වීම සඳහා බාධාවක් විය. 2020 වර්ෂය සඳහා අධ්‍යයන දින දර්ශනය සංශෝධනය කිරීමට මෙය හේතු වී තිබේ. තවද, 2020 වර්ෂය තුළ විවිධ ක්‍රියාකාරකම් හා ඉලක්ක සපුරා ගැනීම සඳහා කොවිඩ් ව්‍යාප්තියෙන් ඇතිවූ බාධා විශාල පසුබෑමක් වී තිබේ. වැඩ වාර සටහන් ක්‍රමයට රාජකාරි සිදුවීම නොයෙක් ප්‍රමාදයන් සහ බාධාවන්ට හේතුවිය. COVID 19 තත්ත්වය 2020 වර්ෂය තුළ IBMBB හි සියළුම ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි ලෙස බලපා ඇත

මානව සම්පත් හිඟකම 2020 දී ආයතනය ක්‍රියාත්මක කිරීමේදී බාධාකාරී විය. සමහර සේවක තනතුරු පිරවීම අත්හිටුවා ඇති අතර එයින් ආයතනික තත්වයන් සුමටව පවත්වාගෙන යාම සඳහා දුෂ්කරතා ඇති කර තිබේ. නියෝජ්‍ය මූල්‍යාධිකාරී සප්ත වාර්ෂික නිවාඩු මත සිටි අතර මෙම රාජකාරි ආවරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයෙක් පැවරුම් පදනම මත බඳවා ගත යුතුව තිබුණි. කෙසේ වෙතත්, නොවැම්බර් 1 වන විට නියෝජ්‍ය මූල්‍යාධිකාරී සිය ධුරයෙන් ඉල්ලා අස් වූ අතර දෙසැම්බර් 1 වන විට නව නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයෙකු (සප්ත වාර්ෂික නිවාඩු මත පසුවන වෙනත් විශ්ව විද්‍යාලයක කාර්ය මණ්ඩල සාමාජිකාවක්) පත් කර ඇත.

2020 සැප්තැම්බර් වන විට, පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක (PDRF) තනතුර සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ හා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට ආයතනයට හැකි විය. පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක තනතුරු පිළිබඳ දැන්වීම් ඔක්තෝම්බර් මාසයේ දී පළ කරන ලද අතර දෙසැම්බර් වන විට පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක තනතුරු තුනක් තෝරා පත් කරන ලදී. පුරප්පාඩු වූ කථිකාචාර්ය තනතුර ගැනද දැන්වීම් පළ කරන ලද අතර 2020 දෙසැම්බර් මස අවසන් වන විට තෝරා ගැනීම සිදු වෙමින් තිබිණි. අවශ්‍ය අනුමත කිරීම් / ලැයිස්තු නොලද බැවින් පුරප්පාඩු වූ අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු (අනුමත සේවක තනතුරු පහක්) පුරවා ගත නොහැකි විය. අනධ්‍යයන තනතුරු දරන්නන් පස් දෙනෙකු විශ්ව විද්‍යාල පද්ධතියට නවකයන් වීම සැලකිල්ලට ගනිමින් මූල්‍යමය සම්පත් නොමැතිකම කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනයට වක්‍රව බලපා ඇති බව පැවසිය හැකිය.

කාර්ය මණ්ඩල සංවර්ධනය සහ සුභසාධන ක්‍රියාකාරකම්

සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය

2020 දී IBMBB සේවකයන් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සෞඛ්‍ය රක්ෂණ ඔප්පුවක් මිලදී ගෙන ඇත. සුභසාධන පදනම මත රක්ෂණ ඔප්පුව මිලදී ගැනීම ආයතනයේ කළමණාකාරිත්ව මණ්ඩලය මගින් අනුමත කල අතර, රක්ෂණය කළ මුළු එකතුවෙන් 50%ක මුදලක් ආයතනය මගින් දරණු ඇත. සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයට IBMBB සේවකයන් 11 ක් සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයන් 22 ක් ඇතුලත් විය. 2020 දී ජනනය කල මුළු මුදලින් රුපියල් 109, 298.84 ක් මේ සඳහා යොදවන ලදී.

ලේ දන් දීමේ වැඩසටහන - 2020

කොවිඩ් -19 තත්ත්වය සහ දිස්ත්‍රික්කය ඉහළ අවදානම් ප්‍රදේශයක් වීම හේතුවෙන් 2020 දී කිසිදු සමාජ සත්කාරයක් සිදු නොවීය.

ඖෂධීය ශාක සංවර්ධනය හා සංරක්ෂණ වැඩසටහන – 2020

2020 සැප්තැම්බර් 17 වන දින ඖෂධ පැළැටි රෝපණය කිරීම IBMBB හිදී පැවැත්විණි. මෙය ආයුර්වේද වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ‘‘සුව දරනි’’ ඖෂධීය ශාක සංවර්ධනය හා සංරක්ෂණ ව්‍යාපෘතියට සමගාමීව පවත්වන ලදී.



අධ්‍යක්ෂතුමිය හා කාර්ය මණ්ඩලය
තිප්පිලි සිටවමින්



මහාචාර්ය වීරසේන කහ සිටවමින්

මානව සම්පත්

සේවක වර්ගීකරණය 2020 දෙසැම්බර් 31 දිනට

සේවා කාණ්ඩය	වැටුප් ක්‍රේතය	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය		පුරප්පාඩු	සටහන්
			ස්ථීර	තාවකාලික		
ප්‍රාථමික මට්ටම						
ප්‍රාථමික ශ්‍රේණිය- නුපුහුණු	U- PL 1	01	00	01	01	වැඩ පැවරුම් පදනම මත එක් වැඩ සහයකයෙකු පත් කර ඇත.
ප්‍රාථමික ශ්‍රේණිය- අර්ධ පුහුණු	U- PL 2	03	03			
ප්‍රාථමික ශ්‍රේණිය- පුහුණු	U- PL 3	01	01			
ද්විතීයික මට්ටම						
කළමනාකරණ සහකාර-කාර්මික නොවන	U- MN 1	11	08	04	03	වැඩ පැවරුම් පදනම මත කළමනාකරණ සහකාරවරු සිව් දෙනෙකු පත් කර ඇත.
කළමනාකරණ සහකාර - කාර්මික	U- MT 1	04	02	02	02	
සහය නිලධාරීන්- 2 වන කොටස	U- MN 2	00	00			
සහය නිලධාරීන්- 1 වන කොටස	U- MN 3	00	00			වැඩ පැවරුම් පදනම මත කාර්මික නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඇත.
මාණ්ඩලික සහකාර /අධි ශ්‍රේණි සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U- MN 4	00	00			
තෘතීයික මට්ටම						
අධ්‍යයන සහයක - 2 වන කොටස	U- AS 1	06	04	05	-	අනුමත කරන ලද තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත් පදනම මත) තනතුරු 6න් 4ක් යටපත් කර කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් ස්ථීර විද්‍යාත්මක සහකාර තනතුරු 4 ක් අනුමත කර ඇත. විද්‍යාත්මක සහකාර තනතුරු 3ක් සඳහා තාවකාලික පදනම මත පත් කර ඇත.
කණිෂ්ඨ විධායක/ කළමනාකරුවන්	U- EX 1	01	01			
අධ්‍යයන සහයක - 1 වන කොටස	U- AS 2	01	01			

ජ්‍යෙෂ්ඨ මට්ටම						
වෛද්‍ය නිලධාරී	U- MO 1	00	00			*නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරෙහි ස්ථිර වශයෙන් සේවය කල නිලධාරිනිය 2020 නොවැම්බර් 01 දින සිට එම තනතුරෙන් ඉල්ලා අස්වී ඇත. මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරයෙකු නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර සඳහා 2020.12.01 දින සිට වසරක කාලයක් සඳහා එම නිලධාරිනියගේ සප්ත වාර්ෂික නිවාඩු කාලය සඳහා පත් කර ඇත. ^ ආයතනයේ අධ්‍යක්ෂ ආයතනයේම මහාචාර්යවරියක් වන බැවින් ඇය මහාචාර්යවරුන්/ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් කාණ්ඩය යටතේ දක්වා ඇත. **තාවකාලික සහකාර කථිකාචාර්ය තනතුරු 02 ක් සහ පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක තනතුරු 03 ක් සඳහා කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තු අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙම තනතුරු 5 සඳහා කොන්ත්‍රාත් පදනම මත පුරප්පාඩු පුරවන ලදී.
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U- MO 2	00	00			
මධ්‍යම මට්ටමේ විධායකයින්	U- EX 2	01	01			
මධ්‍යම මට්ටමේ විධායකයින්*	U- EX 2 (a)	01	00	01	01*	
ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්	U- EX 3	00	00			
කථිකාචාර්ය	U- AC 3	11	06		01	
සහය මහාචාර්යවරුන්	U- AC 4		00			
මහාචාර්යවරුන්/ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් ^	U- AC 5		04^			
පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක	ස්ථිර (fixed) **	03	00	02	01	
තාවකාලික සහකාර කථිකාචාර්ය	ස්ථිර (fixed)	02	00	02		

පර්යේෂණ ප්‍රකාශන

කතුවරුන්ගේ නම් දැක්වීමේදී IBMBB කාර්ය මණ්ඩලය / සිසුන් / පර්යේෂණ සහකාරවරුන්ගේ නම් තද අකුරින් දැක්වේ. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වූ සහ IBMBB හිදී සිය කාර්යයන් කරගෙන යන සිසුන්ගේ නම් සාමාන්‍ය අකුරුවලින් දැක්වේ.

සම-සමාලෝචිත සඟරාවල පර්යේෂණ ප්‍රකාශන- 2020

1. **චන්ද්‍රකාන්තන් එම්, හඳුන්නෙත්ති එස්එම්**, ප්‍රේමකුමාර ජීඑස්ඒ, හා කදිරගාමනතර් එස්. *Alpinia calcarata* Rosc හි අත්‍යවශ්‍ය තෙල්වල ප්‍රතිප්‍රදාහක ක්‍රියාකාරිත්වය, එහි ප්‍රධාන සංඝටක සහ ක්‍රියාකාරී යාන්ත්‍රණය. **Evidence-Based Complementary and Alternative Medicine,** 2020, Article ID 2035671, P. 19 https://doi.org/10.1155/2020/2035671.

2. කොලඹ පතිරණගේ වී, ලෝවි ජේඑන්, **රාජගෝපාලන් යූ, එදිරිවීර එම්කේ, සේනාතිලක කේ**, පියතිලක පී, **තෙන්නකෝන් කේඑච්, සමරකෝන් එස්ආර්**. *Garcinia quaesita* පලතුරු වල හෙක්සේන් නිස්සාරණය ත්‍රිත්ව නිශේධන පියයුරු පිළිකා සෛල MDA-MB-231වලින් වෙන් කරගත් ප්‍රාථමික සෛල වල ඇපොප්ටෝසිස් ඇති කරයි.**Nutrition and Cancer**. 2020 ජුනි 1:1-11.

3. දර්ශනී ටී, ෆ්‍රොන්සෙක් එෆ්ආර්, ප්‍රියදර්ශනී වීවී, **සමරකෝන් එස්ආර්**, පෙරේරා අයිසි, පෙරේරා ටී, නව නැප්තලීන් ව්‍යුත්පන්න සහිත ත්‍රිශූලාකාර ලිගන්ඩවල සංස්ලේෂණය හා අනුලක්ෂණකරණය සහ කුඩා නොවන පෙනහලු පිළිකා හා සම්බන්ධ සෛල වෙත ඒවායේ ශුද්ධ උදාසීන රේනියම් ට්‍රයිකාබොනිල් සංකීර්ණ හා සෛටධූලකවල බලපෑම. **Polyhedron**. 2020. 114652. https://doi.org/10.1016/j.poly.2020.114652.

4. **ද සිල්වා එස්, මනෝහරන් වී, කරුණානායක ඊ එච්, තෙන්නකෝන් කේඑච්**, ඉමිතිකාබ් ඒඅයිඒ, ද සිල්වා කේ, අහුණවෙල පී, විශ්වකුල එස්, ලුනෙක් ජේ. ශ්‍රී ලාංකික පියයුරු හා ආන්ත්‍රික පිළිකා රෝගීන් සමූහයක TP53 හි නියුක්ලියොටයිඩ විචල්‍ය රටා හා p53 හි ප්‍රකාශනය හා එහි අනුස්‍රෝත ප්‍රෝටීන අතර සහසම්බන්ධතාවය. **BMC Cancer**. 2020 ජන. 30;20(1):72.

5. **ප්‍රනාන්දු වයි**, වික්‍රමසිංහ පී, ද සිල්වා යූ, අලහකෝන් එම්, අනුරාධ කේඩබ්ඩීඒ, **හඳුන්නෙත්ති එස්** . ශ්‍රී ලාංකික දරුවන්ගේ හොඳින් පාලනය කරන ලද හා හොඳින් පාලනය නොකරන ලද ඇදුම රෝගයේ ඔක්සිකරණ ආතතියෙහි මස්තු දර්ශකයන්ගේ විෂමතා: නියාමක අධ්‍යයනයක්. **Allergy Asthma & Clinical Immunology**, 2020 16:66 https://doi.org/10.1186/s13223-020-00463-9.

6. ජයසූරිය ඩබ්ජේඒබීඑන්, **හඳුන්නෙත්ති එස්එම්**, වනිගතුංග සීඒ, ප්‍රනාන්දු ජීඑච්, අබේතුංග ඩීටීයූ, සුරේෂ් ටීඑස්. ශාක ඖෂධීය ගුණ සහිත *Pleurotus ostreatus* වල (ඔයිස්ටර් හතු) ප්‍රති ප්‍රදාහක ක්‍රියාකාරකම්. **Evidence-Based Complementary and Alternative Medicine** වෙළුම 2020, Article ID 6845383, පිටු 9 https://doi.org/10.1155/2020/6845383.



7. **කාරියවසම් කේඩබ්ජේසී, සිරිසේන පීඩීඑන්එන්**, **නානායක්කාර එච්එල්සී**, රත්නසූරිය ඩබ්ඩී, **හඳුන්නෙත්ති එස්එම්**. *Vitex negundo* L. (නික) ශාකසාරය මානව ශ්වේතාණුවල IL-6 හා TNF-α ස්‍රාවනය හා භක්ෂ සෛලකතාව නිශේධනය කරයි, **Journal of Herbal Medicine** 2020,doi:https://doi.org/10.1016/j.hermed.2020.100341.

8. **කරුණාරත්න කේඑච්ටී, මෙවන් කේඑම්, වීරසේන ඕවීඩීඑස්ජේ,** පෙරේරා එස්ඒසීඑන්**,** එදිරිසිංහ ඊඑන්යූ, තේ (*Camellia sinensis* L.) වගාවේ බිබිලි අංගමාර ප්‍රතිරෝධය හඳුනා ගැනීමට ක්‍රියාකාරී අණුක සලකුණුකාරකයක්. **Journal of Genetic Engineering and Biotechnology**, 2020, DOI: https://doi.org/ 10.1007/ s00299-020-02637-6.

9. **කරුණාරත්න කේඑච්ටී**, සේනාතිලක එන්එච්කේඑස්, මෙවන් කේඑම්, **වීරසේන ඕවීඩීඑස්ජේ**, පෙරේරා එස්ඒසීඑන්. පරිගනකය මගින් තේ ශාකයේ (*Camellia sinensis* L.) EST073 කේත කරනු ලබන ප්‍රෝටීනයේ සමජාතීය ව්‍යුහය නිර්මාණය කිරීම. **Journal of Genetic Engineering and Biotechnology**, 2020, 18(1) 1-10.

10. **කොතලාවල ජේටී, රණසිංහ ආර්,** රොද්‍රිගෝ සී, **තෙන්නකෝන් කේඑච්**, සිල්වා කේ, ශ්‍රී ලංකාවේ සිංහල ජනවාර්ගික පුද්ගලයන්ගේ විකීර්ණ පියයුරු පිළිකාවල සසම්භාවී ජෛව සලකුණුකාරකයක් ලෙස මයිටොකොන්ඩ්‍රීය ඒකකාණ්ඩ හා නිර්- කේතකරණ කලාප අනුක්‍රමණ විචල්‍ය ඇගයුම. **Biomedical Reports,** 2020 ජුනි;12(6):339-347. doi: 10.3892/br.2020.1292. Epub 2020 Mar 17.

11. **කොතලාවල එස්ඩී, එඩ්වර්ඩ් ඩී, හරස්ගම ජේසී, රණවීර එල්, වීරසේන ඕවීඩීඑස්ජේ**, **නිලූෆා ආර්**, රත්නසූරිය ඩබ්ඩී, ප්‍රේමකුමාර ජීඒඑස්, **හඳුන්නෙත්ති එස්එම්**. කොත්තමල්ලි (*Coriandrum sativum* L) සහ වෙනිවැල්ගැට (*Coscinium fenestratum* G.) වලින් සැදුම්ලත් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික පානයේ ප්‍රතිශක්තිකරණය ඇති කිරීමේ හැකියාව. **Evidence-Based Complementary and Alternative Medicine,** 2020 Article ID 9715060, පිටු 10 https://doi.org/10.1155/2020/9715060.

12. ලියනආරච්චි ජීවීවී, මහානාම කේආර්ආර්, සෝමසිරි එච්පීපීඑස්, **පුණ්‍යසිරි**, **පීඒඑන්**., සහ කොට්ටවආරච්චි ජේඩී. දියෝඩ අරා අනාවරණ ක්‍රමය(RP-HPLC-DAD) සමග සම්මත ප්‍රතිවර්තිත පියවර ඉහළ සාධන ද්‍රව වර්ණදේහ විද්‍යා ක්‍රමය මගින් සහල්වල සමස්ත ඇමයිනෝ අම්ල විශ්ලේෂණය **International Journal of Analytical and Bioanalytical Methods,** 2020, 2, 1-8. DOI: 10.35840/ijabm/2408.

13. ලියනආරච්චි ජීවීවී, මහානාම කේආර්ආර්, සෝමසිරි එච්පීපීඑස්, **පුණ්‍යසිරි**, **පීඒඑන්**., සහ කොට්ටවආරච්චි ජේඩී. ශ්‍රී ලංකාවේ අගනුවර පරිභෝජනය කෙරෙන ජනප්‍රිය සහල් (*Oryza sativa* L.) වර්ගවල සමස්ත ඇමයිනෝ අම්ල අන්තර්ගතය, 2020, **Journal of National Science Foundation, Sri Lanka** (in press).

14. මහේන්ද්‍රන් ආර්**, පතිරණ එස්**, පියතිලක අයිටීඑස්, පෙරේරා එස්එස්එන්, වීරසිංහ එම්සී, (2020) මැලේරියා රෝගය පවතින ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශයක මැලේරියාව සම්ප්‍රේෂණය කෙරෙහි පාරිසරික විචල්‍ය පිළිබඳ ඇගයීමක්: තරංගිකා ප්‍රවේශය. **PLoS ONE** 15(2): e0228540. https://doi.org/10.1371/ journal.pone.0228540.

15. **මනෝහරන් වී, කරුණානායක ඊඑච්, තෙන්නකෝන් කේඑච්**, **ද සිල්වා එස්,** ඉම්තිකාබ් ඒඅයිඒ, සිල්වා කේ, අඟුණවෙල පී, විශ්වකුල එස්, ලුනෙක් ජේ. ශ්‍රී ලාංකික පියයුරු හා ආන්ත්‍රික පිළිකා රෝගීන් සමූහයක TP53 හි නියුක්ලියොටයිඩ විචල්‍ය රටා හා p53 හි ප්‍රකාශනය හා එහි අනුස්‍රෝත ප්‍රෝටීන අතර සහසම්බන්ධතාවය. **BMC Cancer**. 2020 20:72.

16. **මාපලගමගේ එම්, හඳුන්නෙත්ති එස්එම්**, වික්‍රමසිංහ ඒආර්, ප්‍රේමවංස ජී, තිලෙනාදන් එස්, ප්‍රනාන්දු ටී, කණපතිපිල්ලෙ කේ, ද සිල්වා ඒඩී, ප්‍රේමවංස එස්. බරපතල තත්වයේ ඩෙංගු රක්තපාත උණ රෝගීන්ගේ මස්තු ඇන්ජියොපොයෙටින් 2 ඉහළ මට්ටම් හා ඇන්ජියොපොයෙටින් 2/1 අනුපාතය සහ සායනික හා ජෛවරසායනික පරාමිතීන් සමග ඒවායේ සම්බන්ධය. **Journal of Clinical Microbiology,** 2020, 58:e00436-19. https://doi.org/10 .1128/JCM.00436-19.

17. **මෙල්ශාන්දි එච්ඩීඑස්**, සමරසේකර ජේකේආර්ආර්, **හඳුන්නෙත්ති එස් එම්, වීරසේන ඕවීඩීඑස්ජේ**, මහාරාජන් ආර්, චෞදුරි එම්අයි. ශ්‍රී ලංකාවේ ඒකදේශික ඖෂධ ශාකයක් වන ගොඩපර (*Dillenia retusa*) ශාකයේ බැක්ටීරියා සහ දිලීර නාශක හැකියාව සොයා බැලීම. **South Asian Research Journal of Natural Products**, 2020; *3*(4), 1-12. (https://www.Journalsarjnp.com/ සුචි අංකය.php/SARJNP/article/view/30112).

18. **මිටිනි- නිකොමා එස්සී, ප්‍රනාන්දු එන්, ඉෂාකා ජීකේඩී, හඳුන්නෙත්ති එස්එම්, පතිරණ එස්එල්**. ක්ෂයරෝග ප්‍රතිකාරකයක් ලෙස අයන ප්‍රවාහක අනුකූලකය. **Tuberculosis Research and Treatment,** වෙළුම. 2020, Article ID 3767915, පිටු 7 , 2020. https://doi.org/10.1155/ 2020/3767915.

19. පතිරනගේ වීසී, තාබෘ අයි, **සමරකෝන් එස්ආර්, තෙන්නකෝන් කේඑච්, රාජගෝපාලන් යූ**, එදිරිවීර එම්කේ. කුඩා-නොවන පෙනහළු පිළිකා සෛලවලට එරෙහිව සාම්ප්‍රදායික බහු ඖෂධීය ශාක නිස්සාරණ වල ප්‍රති පිළිකා බලපෑම් ඇගයීම. **Journal of Integrative Medicine**. 2020 May;18(3):242-252.

20. රාජපක්ෂ එස්, වීරතුංග පීඑන්, **බලාජී කේ, රාම්චන්දනී කේඝී, ද සිල්වා යූඑස්**, රණසිංහ එස්ඒ, ගුණරත්න ඩී, **විජේරත්න පීපීබී, ප්‍රනාන්දු එන්, හඳුන්නෙත්ති එස් එම්**, ප්‍රනාන්දු එස්ඩී. මිශ්‍ර අර්ධ නාගරික පරිසරයක ලෙප්ටොස්පයිරෝසියාවේ පැවැත්ම - ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ සිදුකළ ප්‍රජාපාදක අධ්‍යයනයක්. **PLoS Neglected Tropical Diseases,** 2020, 14(5): e0008309. https://doi.org/10.1371/journal. pntd.0008309.

21. **රණසිංහ එච්එන්, ප්‍රනාන්දු එන්, හඳුන්නෙත්ති එස් එම්**, වීරතුංග පීඑන්, කටුලන්ද පී, රාජපක්ෂ එස්, ගලප්පත්ති පී, කොන්ස්ටන්ටයින් ජීආර්. යෝග්‍ය පිරික්සුම (APPROPRIATE trial) මගින් අධි රුධිර පීඩනයෙන් පෙලෙන බවට සාධක ලද රෝගීන්ගේ නයිට්‍රික් ඔක්සයිඩ් සහ පූර්ණ ප්‍රතිඔක්සිකාරක ධාරිතාව කෙරෙහි propranolol වල බලපෑම. **BMC Research Notes**, 2020, 13:228 https://doi.org/10.1186/s13104-020-05067-5.

22. සමන්ති කේඒයූ, වැලිදෙනිය ඩීටී, ආචාරිගේ ඒඩී, **සමරකෝන් එස්ආර්**, රත්නායක ආර්කේ, ද සිල්වා එම්, පෙරේරා එස්එස්, පීරිස් සී, වන්නිනායක යූකේ, ජයතිලක ඒ, කරුණාරත්න වී, අමරතුංග ජීඒජේ, ගුණසේකර ඩීඑස්. මයියොක්කාවලින් ලිනමරින් නිස්සාරණය කිරීමේ හා පිරිපහදු කිරීමේ ඵලදායී ක්‍රමයක් ; කෘතිම පරිසරයක් තුළ ජීවවිද්‍යාත්මක ඇගයුමක් **Natural Product Research.** 2020.1-4. https://doi.org/10.1080/14786419.2020.1744136.

23. සන්දිරසේගරම් එස්, වික්‍රමාරච්චි එස් ආර්, අත්තනායක ආර් එන්, වීරකෝන් ජී, **සමරකෝන් එස්ආර්**, විජේරත්න කේ, පරණගම පීඒ. *Amandinea medusulina* ලයිකනයෙහි සිටින එන්ඩොලිචනික් දිලීරයෙන් නව සයිටොටොක්සික් සංයෝගයක් **Natural Product Communications.** 2020. 15.7. https://doi.org/10.1177/1934578X20933017.

24. **සේනානායක කේඑස්**, සොඩර්බර්ග් ජේ, පොලාජෙව් ඒ, මාම්බර්ග් එම්, **කරුණානායක ඊඑච්**, **තෙන්නකෝන් කේඑච්**, **සමරකෝන් එස්ආර්**, *Setaria digitata* ජෙනෝමය: මානව බරවා පරපෝෂිතයන්ට ඉතාම සමීප සත්ව නෙමටෝඩයක්. **Genome Biology and Evolution**. 2020 පෙබ. 1;12(2):3971-3976.

25. **තීස්වරන් ආර්**, ද සිල්වා එන්එල්, ආර්යා ආර්, ගුණරත්න එල්, **හඳුන්නෙත්ති එස් එම්**, රාජපක්ෂ එස්. ලෙප්ටොස්පයිරෝසිස් හි රක්තපාතරෝධක විරූපණය: යෝජිත මූලික සංසන්දනාත්මක අධ්‍යයනයක්. **International Journal of Critical Illness and Injury Science**, 10: 28-32.

26. විතානගේ වීඊඩබ්, රත්නායක කේ, මුදියන්සෙලාගේ ආර් ඊ, කෝට්ටෙආරච්චි එන්එස්, කැකුලන්දර ඩීඑස්, **වීරසේන ජේ**, කැතරින් ස්ටීල්. ආසියානු වී (*Oryza sativa* L.) ජාන ප්ලාස්මයේ සුවඳ නිපදවන ජානයක් වන (badh2) ජානය පරිගණක භාවිතයෙන් විශ්ලේෂණය කිරීම සහ එම ඇලීල සඳහා විශේෂිත වූ සලකුණුකාරකයන්ගේ වලංගුතාවය සොයා බැලීම. **Plant Genetic Resources Characterization and Utillization**, 2020,18(2)71-80.

පෙරමුද්‍රන

1. **සේනාතිලක කේ**, **සමරකෝන් එස්**, **තෙන්නකෝන් කේඑච්**. 2019 නව කොරෝනා වෛරසයෙහි ග්ලයිකොප්‍රෝටීනයට එරෙහි නිශේධක අතථ්‍ය තිරගතකරණය: ඖෂධ පුනර්අරමුණුකරන ප්‍රවේශයක්h. 2020. 10.20944/preprints202003.0042.v2.

සම්මේලන කටයුතු වලදී ප්‍රකාශයට පත් කරන ලද පත්‍රිකා -2020

පර්යේෂණ සන්නිවේදන – 2020

(සම්මේලන කටයුතු වලදී ප්‍රසිද්ධ කරන ලද සාරාංශ)

1. **ද කොස්තා වයිබීඑන්එස්, පතිරණ එස්එල්, හඳුන්නෙත්ති එස් එම්**, ගුණවර්ධන එස්,*Enterobius vermicularis* (කිරිපණුවා) බිත්තරවල ඇන්ටිජන්වල ගති ලක්ෂණ. **වාර්ෂික පර්යේෂණ සැසි සමුළුව - 2020, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය**, 2020 දෙසැ. 14, පිටුව 34.

2. **ගුණසේකර ඩබ්එම්කේටී, ද සිල්වා ඒඩබ්, වීරසේන ඕවීඩීඑස්ජේ**, ප්‍රේමරත්න ආර්ජී, **හඳුන්නෙත්ති එස් එම්**, ප්‍රේමවංස එස්, ප්‍රනාන්දු එස්ඩී. (2020). මැලේරියා ශූන්‍ය දේශීය පසුබිමක ෆැල්සිපාරම් නොවන මැලේරියා ආසාදන රෝග නිර්ණයෙහි ලා ක්ෂණික මැලේරියා රෝග නිර්ණය පරීක්ෂණවල යෝග්‍යතාව. ශ්‍රී ලංකා විද්‍යානිවර්ධන සංගමයේ 76 වන වාර්ෂික සැසිවාරය, 76 (1), පි. 3.

3. **ජයසේකර බීඑම්එල්පී, තෙන්නකෝන් කේඑච්, රණසිංහ ආර්**, ද සිල්වා ජීකේඑස්. අනාගත පරම්පරා අනුක්‍රමණය තුළින් මානව මයිටොකොන්ඩ්‍රියම ඩීඑන්ඒ විචල්‍ය විශ්ලේෂණය: සිංහල කාන්තාවන් අතර විරල පියයුරු පිළිකා සඳහා සම්භාවී ජෛව සලකුණුකාරක සංසරණ හඳුනා ගැනීම. **Colombo Medical Congress** 2020 පෙබ. 12-15.

4. **කොතලාවල ජේටී, තෙන්නකෝන් කේඑච්, රණසිංහ ආර්, රොද්‍රිගෝ එච්ඒසිඅයිකේ**, ද සිල්වා ජීකේඑස්, පෙරේරා ඩබ්ඒඑච්ඒ, යෝගනාදන් එන්, මනතුංග එම්ආර්එස්, දිසානායක ඩීඑම්ඒඑස්, ජෝසප් එන්, රාජසූරියර් සී, ඉන්ද්‍රනාත් කේ, ශ්‍රී ලාංකික ද්‍රවිඩ කාන්තාවන්ගේ විරල පියයුරු පිළිකා හා මයිටොකොන්ඩ්‍රියල් ඩීඑන්ඒ අධිවිචල්‍ය කලාපයේ T16189C බහුරූපත්වය අතර සම්බන්ධය. **කොළඹ වෛද්‍ය සභාව**2020 පෙබ, පි. 106-107.

5. ලියනආරච්චි ජීවීවී, මහානාම කේආර්ආර්, සෝමසිරි එච්පීපීඑස්, **පුණ්‍යසිරි, පීඒඑන්.** හා රණතුංග එම්ඒබී.(2020). පිසීම ක්‍රමය අනුව සහල්වල (*Oryza sativa* L) ඇමයිනෝ අම්ල සංයුතියේ විචල්‍යය . **වාර්ෂික පර්යේෂණ සැසි සමුළුව, කොළඹ විශ්වවිද්‍යාලය, විද්‍යා පීඨය**, 2020.

6. **පෙරේරා ඒඒඩීඑන්, සමරකෝන් එස්ආර්, එදිරිවීර එම්කේ, තෙන්නකෝන් කේඑච්.** Mangifera zeylanica (අඹ) පොතු හා පත්‍ර නිස්සාරකයන්ගේ NCI-H292 හි කුඩා නොවන පෙනහලු පිළිකා සෛලවලට එරෙහි ප්‍රතිපිළිකා ක්‍රියාකාරකම් පිළිබඳ ඇගයීමක්. **කොළඹ වෛද්‍ය සභාව** 2020 පෙබ. 12-15.

7. **පෙරේරා එච්අයිටී,** යාපා ඩබ්බී, ෂ්වාර්ස් එෆ්, **වීරසේන ඕවීඩීඑස්ජේ,** ටී. මියුසෙනික්, සිරිවර්ධන එස්, ප්‍රේමවංස ජී, ටාගොස් ඒ, බෙකර්සියාජා බී, ක්‍රොමාක් එන්. ග්‍රොසෙගී එම්. **හඳුන්නෙත්ති එස් එම්**, ප්‍රේමවංස එස්, කෝල් සී, නීෂේ ඒ. ශ්‍රී ලංකාවේ වැල්ලවාය වවුලගල ගුහාවෙන් හමුවූ *Rhinolophus rouxii* වවුලු වර්ගය අණුක විද්‍යාත්මකව හඳුනා ගැනීම. **වාර්ෂික පර්යේෂණ සැසි සමුළුව 2020, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය**, ශ්‍රී ලංකාව 2020 දෙසැ. 17, පි. 46.

8. **රත්නායක ආර්එම්ආර්කේ, සමරකෝන් එස්ආර්, තෙන්නකෝන් කේඑච්,** අධිකාරි ඒආර්, ශ්‍රේෂ්තා ආර් එල්. මානව පිළිකා මත ගැනිඩයින්වල ධූලකත්වය පිළිබඳ තිරගතකිරීම. **කොළඹ වෛද්‍ය සභාව** 2020 පෙබ..

9. **රත්නායක ආර්එම්ආර්කේ, සමරකෝන් එස්ආර්, තෙන්නකෝන් කේඑච්, එදිරිවීර එම්කේ,** අධිකාරි ඒ, ගුණසේකර ඩීඑස්. අඹ (Mangifera zeylanic) ගසකින් වෙන්කරගත්රෙසොසිනල් ලිපිඩයක් මගින් මානව පිළිකා සෛල සමූහයකට ඇතිවන විෂසහිත බලපෑම (2020). රසායනික තාක්ෂණය පිළිබඳ පුරෝගාමීන්ගේ පළමු ජාත්‍යන්තර සමුළුව (FCT, 20 – 22 ජූලි, 2020) .

10. **සමරසිංහ එස්ඒඑස්එම්, හේවගේ ඒඑස්, සුන්දරලිංගම් ටී, ද සිල්වා කේඑස්එච්, තෙන්නකෝන් කේඑච්.** ශ්‍රී ලංකාවේ වර්ධන හෝමෝන ඌනතාවයෙන් පෙළෙන දරුවෙකු තුළ LHX4 ලක්ෂය සැක සහිත මැකියාමක අනුකූලතාවය සහ ලක්ෂණ.. **කොළඹ වෛද්‍ය සභාව** 2020. කොළඹ, Sri Lanka. pp 021.

11. **ටෙරන්සන් එස්,** ප්‍රනාන්දු එච්එන්එස්, සිල්වා ජේඑන්, කෝට්ටෙආරච්චි එන්එස් සහ **වීරසේන ඕවීඩීඑස්ජේ**. 2020. වී ශාකයේ කොළ අංගමාරය සහ දුඹුරු පුල්ලි රෝගය අණුක විද්‍යාත්මකව වෙන් කර ගැනීම, **කෘෂිකර්මය පිළිබඳ හත්වන ජාත්‍යන්තර සමුළුව (AGRICO 2020)**, නොවැ. 26-27, 2020 පි.11.

12. **තම්බිරාජා ජේසී, හඳුන්නෙත්ති එස් එම්,** වරාවිටගේ ඩීඑච්, දිසානායක ඩබ්ඩීඑන්. දිගුකාලීන භාවනායෝගීන්ගේ ඉහළ ප්‍රතිඔක්සිකාරක ධාරිතාව: නියාමන අධ්‍යයනයක්. **වාර්ෂික පර්යේෂණ සැසි සමුළුව - 2020, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය**, 2020 දෙසැ. 14, පි. 38.

13. **තම්බිරාජා ජේසී, හඳුන්නෙත්ති එස්එම්,** වරාවිටගේ ඩීඑච්, දිසානායක ඩබ්ඩීඑන්**.** දිගුකාලීන භාවනායෝගීන්ගේ නයිට්‍රේට් හා නයිට්‍රයිට් මට්ටම්: නියාමන අධ්‍යයනයක්. **වාර්ෂික පර්යේෂණ සැසි සමුළුව - 2020, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය,** 2020 දෙසැ. 14, පි. 65.

14. **තම්බිරාජා ජේසී,** ජයමහ සීජේඑස්, රත්නායක ඒකේඩීවයි, **හඳුන්නෙත්ති එස් එම්, ප්‍රනාන්දු එන්.** ශ්‍රී ලංකාවේ රෝග නිර්ණය විද්‍යාගාරයකට ඉදිරිපත් වූ ගැන්සික්ලෝවර් ප්‍රතිරෝධී CMV රෝගය වැලදුන බවට සැකකෙරෙන ලංකාවේ රෝගීන්ගේ UL97 ජානයේ විකෘතිතා හඳුනා ගැනීමට මූලික පරීක්ෂණය. **ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවවිද්‍යාඥයන්ගේ විද්‍යාලයීය බුලටීනය**. (1) අගෝ. 2020.

15. **වික්‍රමරත්න එන්එස්, තුෂාන්තන් ජේ, සමරකෝන් එස්ආර්,** ඩීඑන් කරුණාරත්න හා **තෙන්නකෝන් කේඑච්** (2019); ER ධන පියයුරු පිළිකා සෛල (MCF-7) මත Angiopterisevecta (Forst.) Hoffm කොලවල වරණීය සෛටධූලකත්වය . **කොළඹ වෛද්‍ය සංගමය** 2020 පෙබ. 12-15.

තිරසාර සංවර්ධනය මත පදනම් වූ පාරිසරික සෘණාත්මක බලපෑම අඩු කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳ අනාගත ව්‍යාපෘති වාර්තාව

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද සහ ජෛවතාක්ෂණ ආයතනය **(IBMBB)** යනු ජෛවරසායන විද්‍යාව, අණුක ජෛව විද්‍යාව, ජෛව තාක්ෂණය, ප්‍රතිශක්තිවේදය, ජෛවතොරතුරුවේදය සහ වෙනත් සම්බන්ධිත විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුව, පර්යේෂණ හා සංවර්ධනය සහ උපදේශනය සැපයීමේ අදහසින් පිහිටුවන ලද ආයතනයකි. ජෛවරසායන, අණුක ජෛවවේද සහ ජෛවතාක්ෂණ ආයතනය එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනයේ ඉලක්කයන් අතරින් සිව්වන ඉලක්කය වන ගුණාත්මක අධ්‍යාපනයට සෘජුවම දායක වන අතර පරිසර සුරක්ෂිතතාවය සහ අහිතකර පාරිසරික බලපෑම් අවම කිරීම සඳහාද ආයතනය සැලකිල්ල යොමු කර ඇත.

I. කඩදාසි භාවිතවන කටයුතු අවම කිරීම

කඩදාසි භාවිතය අඩු කිරීම සඳහා කඩදාසි මත පදනම් වූ ලිපිගොනු සංඛ්‍යාත්මක ධාරාවෙහි යෙදීම කරගෙන යනු ලබයි. 2022 දී IBMBB සඳහා ලිපිගොනු කළමනාකාරීත්ව පද්ධතියක් හඳුන්වාදීමට සැලසුම් කර ඇත. තවද කඩදාසි වැඩ සහ ටෝනර් භාවිතය ආයතනය තුළ අඩු කිරීම සඳහා ආයතනය තුළ සන්නිවේදනය සඳහා විද්‍යුත් තැපෑල භාවිතා කරනු ලබයි.

II. පොලිතීන් මුක්ත කලාපය

ජෛවරසායන, අණුක ජෛවවේද සහ ජෛවතාක්ෂණ ආයතනය පොලිතීන් වලින් නිදහස් වූ කලාපයක පිහිටුවා ඇති අතර ඉදිරියටත් ආයතනය එය එසේ පවත්වාගැනීමට කටයුතු කර ඇත.

III. රුක්රෝපණ වැඩසටහන

ආයතනයේ වාර්ෂික සංවත්සරය සැමරීම සඳහා රුක්රෝපණ වැඩසටහනක් වාර්ෂිකව ආයතනය සංවිධානය කරන අතර ආයතනයේ 17 වන වාර්ෂික උත්සවය සැමරීම සඳහා 2021 ජුනි මස රුක්රෝපණ වැඩසටහනක් ද පැවැත්වීම සඳහා සැලසුම් කර ඇත.

IV. අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද සහ ජෛවතාක්ෂණ ආයතනය තුල පශ්චාත් උපාධි ඉගැන්වීමේ සහ පුහුණු කටයුතු සඳහා පිහිටුවනු ලැබූ නවීන විද්‍යාගාර ඇති අතර එම විද්‍යාගාර තුල මිනිස් ලේ සාම්පලයන් සහ සෛල භාවිතයෙන් සිදුකරන පර්යේෂණ වලදී අවශ්‍ය නිසි ආරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබේ. හානිදායක ජෛව අපද්‍රව්‍යයන් ඉවත දැමීම සහ පරිහරණය කිරීම සම්මත ආරක්ෂක ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකරගෙන යනු ලබයි. අනතුරුදායක රසායනික ද්‍රව්‍ය හා ප්‍රතික්‍රියාකාරක භාවිතයේදී හා බැහැර කිරීමේදී පාරිසරික අවදානම අවම කිරීමට අවශ්‍ය සියලු පියවර ගෙන ඇති අතර ඒවා ඉදිරි වර්ෂයේදීත් එම ආකාරයෙන්ම නිසි පරිදි ක්‍රියාත්මක කරනු ඇත.

V. පරිසර හිතකාමී බලශක්ති නිපැයුමක් සඳහා යෝජනා

2023 වන විට සූර්යයකෝෂයන් භාවිතා කිරීමෙන් ආයතනයේ බලශක්ති භාවිතා කිරීම 40% කින් ආවරණය කිරීමට හැකියාව ඇතිදැයි සොයා බැලීමට ශක්‍යතා අධ්‍යනයක් කර ඇත. IBMBB ගොඩනැගිල්ලෙහි වහලයේ ඇති ඉඩ ප්‍රමාණය නොමැති නිසා සූර්ය බලයෙන් සම්පූර්ණ බලශක්ති පරිභෝජනය ආවරණය කළ නොහැක. එබැවින් සූර්ය බලශක්තිය මගින් 40% ක වාර්ෂික බලශක්ති පරිභෝජනය ආවරණය කිරීමට ආයතනය සැලසුම් කර ඇත.

VI. පරිසර හිතකාමී අලෝක සැපයීමේ උපාංග සවිකිරීමේ යෝජනාව

2024 වන විට සම්ප්‍රදායික විදුලි සැපයුම් වලට වඩා ෆ්ලෝරසන්ට් වැනි ශක්ති පිරිමැසුම් සහ පාරිසරික මිත්‍රශීලී LED ආලෝක උපාංග වෙත යාමට සැලසුම් කර ඇත. එහි විෂ මූල ද්‍රව්‍යයන් අඩංගු නොවන නිසා අපතේ යන ද්‍රව්‍ය පොළොව ගොඩකිරීම සඳහා බෙදීමේදී පාරිසරික දූෂණයන් LED බල්බ මගින් සිදුනොවේ.



වගුව 1: ක්‍රියාත්මකව පවතින දර්ශනපති/ දර්ශනසූරී උපාධි පාඨමාලා සහ නව ලියාපදිංචිවීම් – 2020

	සුචි අංකය	සිසුවාගේ නම	ලියාපදිංචි වූ දිනය	අරමුදල් ප්‍රභවය/ප්‍රභවයන්	තාවකාලික මාතෘකාව	අධීක්ෂකයින්
01	IBMBB/ MPhil/13/ 001	බී. ඒ. දිලානි රුක්ෂලා මිය	2013.05.01	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	ශ්‍රී ලංකාවේ ඖෂධීය ශාක වලින් ඖෂධ නියම - ප්‍රතිශක්ති අනුකූලතා/ප්‍රති ආසාත්මිකතා ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනය	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති මහාචාර්ය ඊ. දිලිප් ද සිල්වා
02	IBMBB/ MPhil/13/ 008	එම්. චන්ද්‍රකාන්තන් මිය	2013.10.25	ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදානය	*Alpinia carcarata* රයිසෝම සහ පත්‍රවලින් ප්‍රතිපදාහ සංයෝග වෙන් කිරීම පිළිබඳ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය	ආචාර්ය සෙල්වලක්ෂ්මි චෙල්වෙන්ද්‍රන් මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති ආචාර්ය ජී. ඒ. සිරිමල් ප්‍රේමකුමාර
03	IBMBB/ MPhil/15/ 001	කාංචන එස්. සේනානායක මයා	2015.02.01	ස්වීඩන් පර්යේෂණ සම්බන්ධතා ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණ ප්‍රදානය - ස්වීඩන්පර්යේෂණ සභාව	NGS තාක්ෂණයන් භාවිතා කරමින් *Seteria digitata* ගෙනෝම විශ්ලේෂණය, *Seteria digitata* හි විභව්‍ය ඖෂධීය ඉලක්ක හඳුනා ගැනීම	ආචාර්ය එරික් බොංග්කැම් රඩ්ලොෆ් මහාචාර්ය ඊ. එච්. කරුණානායක මහාචාර්ය කේ. එච්. තෙන්නකෝන්
04	IBMBB/ MPhil/15/ 002	ඩබ්ලිව්. එම්. කේ. ටී. ද ඒ. ඩබ්ලිව්. ගුණසේකර මිය	2015.02.01	ජාතික විද්‍යා පදනම	ශ්‍රී ලංකාවේ මැලේරියාව නැවත හඳුන්වාදීම වැළැක්වීමේ අදියරේදී මැලේරියා රෝග විනිශ්චය සඳහා භාවිතා වන පරපෝෂිතවේදී හා අණුක රෝගී විනිශ්චය ක්‍රම සැසඳීම	මහාචාර්ය දිපිකා ප්‍රනාන්දු මහාචාර්ය සුනිල් ප්‍රේමවංස මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති ආචාර්ය ජගත්ප්‍රිය වීරසේන ආචාර්ය රිසින්ත ප්‍රේමරත්න



	සුචි අංකය	සිසුවාගේ නම සිසුවා	ලියාපදිංචි වූ දිනය	අරමුදල් ප්‍රභවය/ප්‍රභවයන්	තාවකාලික මාතෘකාව	අධීක්ෂකයින්
05	IBMBB/ MPhil/15 /003	වාහිනීප්‍රියා මනෝහරන් මිය	2015.02.01	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම	ශ්‍රී ලංකා රෝගීන් කාණ්ඩයක තෝරාගත් පිළිකාවල TP53 ප්‍රවේණි අණුවේ දෛහික විකෘතිතා විශ්ලේෂණය	මහාචාර්ය ඊ. එච්. කරුණානායක ආචාර්ය සුමාදි ද සිල්වා මහාචාර්ය කමනී එච්. තෙන්නකෝන්
06	IBMBB/ MPhil/15 /004	ක්‍රිෂාන් ආර්. බලාජි මයා	2015.02.02	කොළඹ විශ්ව විද්‍යාල පර්යේෂණ ප්‍රදානය	ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ මානව ලෙප්ටොපයිරෝසිස් රෝගයේ Sero වසංගත අධ්‍යනය	මහාචාර්ය සේනක රාජපක්ෂ මහාචාර්ය ශිරෝමා එම් හඳුන්නෙත්ති මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු
07	IBMBB/ MPhil/15 /005	උමා ප්‍රියතර්ෂිනි රාජගෝපාලන් මිය	2015.03.01	ජාතික පර්යේෂණ සභාව	පිළිකා මර්දන මූල සෛල ක්‍රියාකාරිත්වය සඳහා ශ්‍රී ලංකාවේ ආවේණික ශාක පරීක්ෂාව සහ පියයුරු පිළිකා සඳහා ක්‍රියාකාරී ශාක වලින් වෙන්කර ගන්නා ලද සංයෝගවල පිළිකා මර්ධන මූල සෛල ලක්ෂණ ඇගයීම	ආචාර්ය සමීර ආර්. සමරකෝන් මහාචාර්ය කමනී එච්. තෙන්නකෝන් මහාචාර්ය ඊ. දිලිප් ද සිල්වා
08	IBMBB/ MPhil/15 /006	ඩී. එල්. පේෂල එරංග ගුණසේකර මයා	2015.08.01	වෛද්‍ය පර්යේෂණ ආයතනය හා ජාතික විද්‍යා පදනම	*Apis dorsata* සහ *Vespa affinis (ගණය: hymenoptera)* විෂෙහි ප්‍රතිශක්ති රසායනික ලක්ෂණ විභාගය සහ අදාල බටහිර විශේෂ වල විෂ සමග ඒවායේ හරස් ක්‍රියාකාරීත්වය	වෛද්‍ය රජීව ද සිල්වා මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති මහාචාර්ය සුනිල් ප්‍රේමවංස මහාචාර්ය ශ්‍රියානි ඩයස් ආචාර්ය සිරිමල් ප්‍රේමකුමාර
09	IBMBB/ MPhil/16 /001	සමන් භාරත කොටිගල මයා	2016.06.01	ජාතික විද්‍යා පදනම/ ස්වයං මූල්‍ය සම්පාදනය	පෙනහළු පිළිකා සෛල වල ප්‍රතිපිළිකා ක්‍රියාකාරිත්වය, ඒකලනය, ක්‍රියාකාරී ප්‍රතිපිළිකා සංයෝග වල ව්‍යුහ පැහැදිලි කිරීම සහ ඒවායේ ක්‍රියාකාරිත්වයේ අණුක යන්ත්‍රණයන් තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලාංකික ආවේණික ශාක පරිලෝකනය	මහාචාර්ය අයිරා තාබෘ ආචාර්ය සමීර ආර්. සමරකෝන්



	සුචි අංකය	සිසුවාගේ නම සිසුවා	ලියාපදිංචි වූ දිනය	අරමුදල් ප්‍රභවය/ප්‍රභවයන්	තාවකාලික මාතෘකාව	අධීක්ෂකයින්
10	IBMBB/ MPhil/16 /002	ජොඇන් ටිෆානියා කොතලාවල මිය	2016.06.01	ජාතික විද්‍යා පදනම- පර්යේෂණ ශිෂ්‍යත්වය	D-loop සහ mtDNA haplogroups විරල පියයුරු පිළිකාවේදී මයිටොකොන්ඩ්‍රියල් DNA විකෘත ලක්ෂණ විභාගය	මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් වෛද්‍ය කණිෂ්ක ද සිල්වා
11	IBMBB/ MPhil/16 /003	බී වී ලෝෂිනී රවීමාරණවීර මිය	2016.08.01	ලින්ක් නැවුරල් ප්‍රොඩක්ට්ස් (පුද්ගලික) සමාගම - ශ්‍රී ලංකාව	ශ්‍රී ලංකා වෙළඳපොළේ ශාක නිෂ්පාදනයක ප්‍රතිශක්ති උත්තේජක ක්‍රියාකාරිත්වය සහ ඊට පාදක වූ ප්‍රතිශක්ති යාන්ත්‍රණයන් පිළිබඳ අධ්‍යයනය	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති ආචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන මහාචාර්ය අජිත් අබේසේකර
12	IBMBB/ MPhil/16 /004	පූර්ණ ඩබ්. බාලසූරිය මයා	2016.11.01	ජාතික විද්‍යා පදනම	ශ්‍රී ලංකාවේ රබර් වැවෙන ඉඩම්වල සුදු මූල රෝගය සඳහා ජීව විද්‍යාත්මක පාලන පියවර ලෙස දේශීය පාංශු ක්ෂුද්‍ර ශාක යොදා ගැනීම.	ආචාර්ය ටී. එච්. පී. එස්. ප්‍රනාන්දු ආචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන
13	IBMBB/ MPhil/17 /001	සුවන්තිනි ටෙරන්සන් මිය	2017.06.01	ස්වයං මූල්‍ය සම්පාදනය	ශ්‍රී ලංකාවේ rice blast pathogen *Magnaporthe oryzae* ව්‍යාධිජනකයේ ජෙනෝමික විවිධත්වය සහ සහල් ජනක ප්ලාස්මයේ සත්කාරක ප්‍රතිරෝධය සැලසුම් කිරීම.	ආචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන. මහාචාර්ය නිශා එස්. කෝට්ටෙ ආරච්චි
14	IBMBB/ MPhil/17 /002	නිමේෂා එස්. වික්‍රමරත්න මිය	2017.06.01	ජාතික විද්‍යා පදනම	ශ්‍රී ලංකාවේ ශාකවල අන්තෝවාසී දිලීරවලින් සහ තෝරාගත් ආවේණික/ ඖෂධීය ශාකවලින් ලබා ගත් ක්‍රියාකාරී ප්‍රති පියයුරු පිළිකා පරිවෘත්තියන්හි ව්‍යුහාත්මක සහ කාර්ය ලක්ෂණ විභාගය වෙන් කිරීම.	මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් ආචාර්ය සමීර ආර්. සමරකෝන් මහාචාර්ය නීද්‍රා කරුණාරත්න



	සුචි අංකය	සිසුවාගේ නම	ලියාපදිංචි වූ දිනය	අරමුදල් ප්‍රභවය/ප්‍රභවයන්	තාවකාලික මාතෘකාව	අධීක්ෂකයින්
15	IBMBB/ MPhil/17 /003	ජෙයරාජ් තුෂ්‍යන්තන් මයා	2017.06.01	ජාතික විද්‍යා පදනම	හෙපටොසෙලියුලර් කාසිනෝමා (HepG2) සෛලදාමය භාවිත කරමින් ප්‍රතිපිළිකා ක්‍රියාකාරීත්වය සඳහා තෝරාගත් පරිවෘත්තීජය දිලීර සහ ආවේණික ශාක ලක්ෂණ විභාගය සහ ක්‍රියාකාරී සංයෝග වෙන් කිරීම.	මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් ආචාර්ය සමීර ආර්. සමරකෝන් මහාචාර්ය අයිරා තාබa
16	IBMBB/ MPhil/17 /004	බී. එම්. එල්. පී. ජයසේකර මිය	2017.09.01	ජාතික පර්යේෂණ සභාව	ශ්‍රී ලංකාවේ සිංහල වාර්ගික රෝගීන්ගේ විරල පියයුරු පිළිකාවේ අවදානම් සාධකයන් වශයෙන් මයිටොකොන්ඩ්‍රියල් ප්‍රවේණි අණුවල විකෘතිතා හා බහුරූපතා	මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් ආචාර්ය රුවන්දි රණසිංහ වෛද්‍ය කණිෂ්ක ද සිල්වා
17	IBMBB/ MPhil/17 /005	ආර්. එම්. ආර්. කැළුම් රත්නායක මයා	2017.10.01	ජාතික විද්‍යා පදනම	පිළිකා සෛල පැනලයක සංයුක්ත එකතූන් (libraries) ලක්ෂණ පරීක්ෂාව සහ කෘත්‍රිම ප්‍රතිපිළිකා සංයුක්ත එකතුවක් සංවර්ධනය කිරීම හා ක්‍රියාකාරී සංයෝග වෙන් කිරීම.	මහාචාර්ය කේ. එච්. තෙන්නකෝන් ආචාර්ය සමීර ආර්. සමරකෝන් ආචාර්ය දිනාරා ගුණසේකර
18	IBMBB/ MPhil/18 /002	එච්. අයි. තේජානී පෙරේරා මිය	2018.02.01	ජර්මනියේ රොබට් කොච් ආයතනයේ පර්යේෂණ අරමුදල්	ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාත්මක වශයෙන් වැදගත් වවුලන්ගේ ව්‍යාධිජනක රෝගකාරක සහ වෛරස් එන්සෙෆලයිටිස් රෝගී අවස්ථා පිළිබඳ ප්‍රතිශක්තිකාරක හා අණුක හඳුනා ගැනීම.	මහාචාර්ය විපුල යාපා ආචාර්ය අන්ද්‍රියෙස් ආචාර්ය ක්ලෝඩියා කෝල් මහාචාර්ය සුනිල් ප්‍රේමවංස මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන
19	IBMBB/ MPhil/18 /003	පී. දක්ෂිකා ගංගානි මිය	2018.04.01	ජාන ඉංජිනේරු හා ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය	ශ්‍රී ලංකාවේ තෝරාගත් වඩාත් ප්‍රචලිත ලෙප්ටොස්පිරා Serovars/Serogroups වල ලෙප්ටොස්පිරා ප්‍රතිදේහජන්‍ය හඳුනාගැනීම සඳහා ඒකක්ලෝන ප්‍රතිදේහ නිෂ්පාදනය	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති මහාචාර්ය සේනක රාජපක්ෂ මහාචාර්ය සුනිල් ප්‍රේමවංශ



	සුචි අංකය	සිසුවාගේ නම	ලියාපදිංචි වූ දිනය	අරමුදල් ප්‍රභවය/ප්‍රභවයන්	තාවකාලික මාතෘකාව	අධීක්ෂකයින්
20	IBMBB/ MPhil/18 /004	අමාලි එස්. ප්‍රනාන්දු මිය	2018.04.01	ජාතික පර්යේෂණ සභාව	ශ්‍රී ලංකාවේ ජනාවාසකරණයේ අණුක මානව විද්‍යාව පිළිබඳ අවබෝධය. උඩුපියන්ගල සහ අළුගල්ගේ ගුහාවල පුරාවිද්‍යාත්මක ඇටසැකිලි අවශේෂවල පුරාණ මානව mtDNA සහ අණුක ලිංග විශ්ලේෂණය	මහාචාර්ය කමනි තෙන්නකෝන් ආචාර්ය රුවන්දි රණසිංහ
21	IBMBB/ MPhil/18 /005	එන්. වික්‍රමසිංහ මිය	2018.07.01	ස්වයං මූල්‍ය සම්පාදිත	ශ්‍රී ලංකාවේ අන්ධ සර්පයන්ගේ (serpentes: Scolecophidia) අණුක වර්ගීකරණය	ආචාර්ය ඩේවිඩ් ගවර් මහාචාර්ය කමනී එච්. තෙන්නකෝන් ආචාර්ය සමීර ආර්. සමරකෝන්
22	IBMBB/ MPhil/18 /006	ඒ. ඒ. ඩී. එන්. පෙරේරා මහතා මයා	2018.10.01	ඉන්දු - ශ්‍රී ලංකා ප්‍රදානය	කුඩා-නොවන පෙනහළු පිළිකා සෛල මත *Mangifera zeylanica* ශාක නිස්සාරණ වල ප්‍රති පිළිකා බලපෑම් ඇගයීම	මහාචාර්ය කමනි තෙන්නකෝන් ආචාර්ය සමීර ආර්. සමරකෝන් ආචාර්ය මෙරාන් කේ එදිරිවීර
23	IBMBB/ MPhil/19 /001	එම්. ඩී. එස්. ජානකී මිය	2019.01.01	ජාතික පර්යේෂණ සභාව	*Aedes* මදුරුවන් තුල ඩෙංගු වෛරස් මස්තු දර්ශ (serotypes) අවකලන හඳුනා ගැනීම සඳහා පිරිවැය ඵලදායී, නව්‍ය සමීක්ෂණ මෙවලමක් ලෙස (RT-LAMP) assay ස්ථාපනය කිරීම.	ආචාර්ය ඕ. වී. ඩී. එස්. ජේ. වීරසේන මහාචාර්ය එස්. එම්. හඳුන්නෙත්ති ආචාර්ය පී. පී. එස්. එල්. පතිරණ විශේෂඥ වෛද්‍ය හසිත තිසේරා ආචාර්ය පී. එච්. කේ. වී. එස්. ආයීප්‍රේම



	සුචි අංකය	සිසුවාගේ නම	ලියාපදිංචි වූ දිනය	අරමුදල් ප්‍රභවය/ප්‍රභවයන්	තාවකාලික මාතෘකාව	අධීක්ෂකයින්
24	IBMBB/ MPhil/19 /002	එස්. කුමාරස්වාමි මිය	2019.02.01	ජාතික විද්‍යා පදනම	ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ පවතින සමුද්‍ර සාර්ව ඇල්ගී (මුහුදු පැළෑටි) වල අණුක භෞතික විද්‍යාව සහ සමුද්‍ර සාර්ව ඇල්ගී වලින් මුඛ පිළිකා ඉලක්ක කර ගැනීම සඳහා පිළිකා මර්දන සංයෝග වෙන් කිරීම.	ආචාර්ය එම්. ඒ. පූර්ණා සී. පියතිලක මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් ආචාර්ය රුවන්දි රණසිංහ ආචාර්ය සමීර ආර්. සමරකෝන්
25	IBMBB/ MPhil/20 20/001	එස්.ඒ.සෞම්‍යා එම් සමරසිංහ මිය	2020.09.01	ජාතික පර්යේෂණ සභාව	මධ්‍යසාර නොවන ස්ටීටෝ හෙපටයිටිස් හි හෙපටෝටික සෛල පිළිකා (HCC) සඳහා පුරෝකථන සලකුණු සඳහා ජාන විශ්ලේෂණය (NASH)	ආචාර්ය අසංකා සුදේෂිනි හෙවගේ මහාචාර්ය රොහාන් සිරිවර්ධන මහාචාර්ය කමනි තෙන්නකෝන් මහාචාර්ය මදුනිල් අනුක් නිරිඇල්ල
26	IBMBB/ MPhil/20 20/002	අංජනා එච්.ජේ. වැලිකල මිය	2020.10.01	අධීක්ෂකවරුන්ට ලැබී ඇත. (ආචාර්ය රුවන්දි රණසිංහ, මහාචාර්ය කමනි තෙන්නකෝන්)	ශ්‍රී ලංකාවේ සිංහල, ශ්‍රී ලංකා දෙමළ සහ වැදි ජනගහනයන් තුළ සමස්ත මයිටොකොන්ඩ්‍රීය ජෙනෝමය සංසන්දනාත්මක විශ්ලේෂණය	ආචාර්ය රුවන්දි රණසිංහ මහාචාර්ය කමනි තෙන්නකෝන්
27	IBMBB/ MPhil/20 20/003	ජේම්ස් සී තම්බිරාජා මයා	2020.07.01	AHEAD ප්‍රදානය (6026-LK/8743-LK)	පළපුරුදු බෞද්ධ භාවනායෝගීන් සහ භාවනා නොකරන අයගේ ආතති ප්‍රතිචාරයේ තෝරාගත් ප්‍රතිශක්තිකරණ, හෝමෝන හා ජෛව රසායනික පරාමිතීන් පිළිබඳ හරස්කඩ සංසන්දනාත්මක අධ්‍යයනයක්	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති ආචාර්ය දිලන්ති වරාවිටගේ මහාචාර්ය දිල්ෂානි දිසානායක



වගුව 2 : වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වී ඇති සහ අධ්‍යයනයේ කොටසක් IBMBB රසායනාගාරවල සිදු කරන සිසුන් – 2020

අං.	ශිෂ්‍යයාගේ නම	ලියාපදිංචි වූ උපාධිය	අනුබද්ධ ආයතනය	අරමුදල් ප්‍රභවය	තාවකාලික මාතෘකාව	අධීක්ෂකවරුන්
1	ආචාර්ය ඩී. පද්මසිරි ඒ. දිසානායක	PhD	දේශීය වෛද්‍ය ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය	HETC- දේශීය වෛද්‍ය ආයතනය	*Cyathulla prostrata, Acyranthus aspera* සහ *Asparagus racemosus* කෂායවල ප්‍රතිප්‍රදාහ හැකියාව	මහාචාර්ය එච්.එම්.ඒ. තිසේරා *මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති ආචාර්ය එස්. සිවගනේෂ්
2	කේෂානි සිල්වා මිය	PhD	රබර් පර්යේෂණ ආයතනය අගලවත්ත	රබර් පර්යේෂණ ආයතනය	ශ්‍රී ලංකාවේ *Phellinus noxius* රබර් විසංගතයන්හි ජාන විභේදනය සහ නිපදවන එන්සයිම වල ලක්ෂණ	මහාචාර්ය ජගත් වීරසේන මහාචාර්ය චන්ද්‍රිකා නානායකර ආචාර්ය සරෝජිනී ප්‍රනාන්දු

*පර්යේෂණ සංරචක උදෙසා IBMBB අධීක්ෂකවරුන්, කොළඹ විශ්වවිද්‍යාලය.



වගුව 3: පර්යේෂණ අරමුදල් සැපයීම -2020

[**IBMBB** පර්යේෂකයන්ගේ නම් තද අකුරු වලින් දක්වා ඇත.]

ප්‍රදානය ලබන්නා	**ව්‍යාපෘතියේ නම**	**මූල්‍ය සම්පාදන ආයතනය**	**ප්‍රදාන අංකය**	**නිබෙන අරමුදල් (රු.)**
මහාචාර්ය කමනි තෙන්නකෝන් (PI) **ආචාර්ය සමීර සමරකෝන්** (CoI)	*Mangifera indica* (ඉන්දියා) සහ *Mangifera zeylanica* (ශ්‍රී ලංකා) ශාකයේ විවිධ කොටස්වල ප්‍රතිපිළිකා සහ radiopriming බලපෑම් පිළිබඳ නාලස්ථ සහ *in vivo* විමර්ශනය සහ හරිත රජත නැනෝසංඝටක වල බලපෑම.	විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය	MSTR/TRD/AGR/3/2/08	825,276.00
මහාචාර්ය කමනි තෙන්නකෝන් (PI) **ආචාර්ය රුවන්දි රණසිංහ (Co-I)** වෛද්‍ය කණිෂ්ක ද සිල්වා (Co-I)	සිංහල ජනවාර්ගික ශ්‍රී ලාංකික රෝගීන්ගේ විරල පියයුරු පිළිකා පිළිබඳ අවදානම් සාධක වශයෙන් මයිටොකෝන්ඩ්‍රියල් ප්‍රවේණි අනුවල විකෘතතා හා බහුරූපතා	ජාතික පර්යේෂණ සභාව	NRC 17-020	(අරමුදල් NRC විසින් හසුරුවනු ලැබේ)
මහාචාර්ය කමනි තෙන්නකෝන් (PI) **ආචාර්ය සමීර සමරකෝන්** **(ප්‍රධාන සම-විමර්ශක)**	ප්‍රතිපිළිකා සංයෝග ගොනු සංවර්ධනය කිරීම	ජාතික විද්‍යා පදනම	RPHS/2016/C-07	3,234,348.00
ජොඇන් කොතලාවල මිය - **(PhD සිසු)** **මහාචාර්ය කමනි තෙන්නකෝන් - (PI)** **ආචාර්ය රුවන්දි රණසිංහ (Co-S)** වෛද්‍ය කණිෂ්ක ද සිල්වා (Co-S)	විරල පියයුරු පිළිකාවේ D-loop සහ mtDNA haplogroups එකකණ්ඩායම්වලමයිටොකෝන්ඩ්‍රියල් DNA විකෘතතාවල ලක්ෂණ විභාගය	ජාතික විද්‍යා පදනම	NSF/SCH/2016/04	737,529.00
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (PI) **ආචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන (Co-I)** මහාචාර්ය සේනක රාජපක්ෂ (Co-I) ආචාර්ය ලිලානි කරුණානායක(Co-I) මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (Co-I)	විවිධ උග්‍ර තත්ත්වයන්හි ලෙප්ටොස්පිරෝසිස් රෝගීන්ගෙන් වෙන්කර ගත් *Leptospira* වල ප්‍රවේණි දර්ශ සහ මස්තූ දර්ශ ලක්ෂණ විභාගය	ජාතික පර්යේෂණ සභාව	NRC-17-098	(අරමුදල් NRC විසින් හසුරුවනු ලැබේ)
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (PI) **ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන (Co-PI)**	ශ්‍රී ලංකාවේ වෙළඳපොළේ ඖෂධීය ශාක සාර සැකැස්මක ප්‍රතිශක්ති උත්තේජක ක්‍රියාකාරීත්වය සහ පාදක වන ප්‍රතිශක්ති යාන්ත්‍රණයන් පිළිබඳ අධ්‍යයනය	විශ්වවිද්‍යාල- කර්මාන්තය අතර සහයෝගිත අධ්‍යයනය: IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය සහ ලින්ක් නැචුරල්ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්		(අරමුදල ලින්ක් ආයතනය විසින් හසුරුවනු ලැබේ)
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (PI) මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (Co-I) මහාචාර්ය සේනක රාජපක්ෂ (Co-I) .	ලෙප්ටොස්පයිරෝසිස් (මී උණ) සඳහා ප්‍රතිදේහජනක පාදක රෝග විනිශ්චය කරන පරීක්ෂාවක් ස්ථාපනය කිරීම	ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය	CRP/LKA17-01 – කොන්ත්‍රාත් අංක. CRP/18/008	3,053,151.00
ආචාර්ය රුවන්දි රණසිංහ (PI) මහාචාර්ය රාජ් සෝමදේව (Co-I) **මහාචාර්ය කේ.එච්.තෙන්නකෝන් (Co-I)** **මහාචාර්ය ඊ.එච්. කරුණානායක (Co-I)**	ශ්‍රී ලංකාවේ ආදි ජනතාවගේ අණුක මානව විද්‍යාව සඳහා අන්තර් දෘෂ්ටිය : උඩුපියන්ගල සහ අළුගල්ගේ ගුහාවල පුරාවිද්‍යාත්මක අටසැකිලි අවශේෂවල පුරාණ මානව mtDNA සහ අණුක ලිංග විශ්ලේෂණය	ජාතික පර්යේෂණ සභාව	NRC-17-042	අරමුදල් NRC විසින් හසුරුවනු ලැබේ



ආචාර්ය එම්.ඒ.පී.සී. පියතිලක (PI) **මහාචාර්ය කේ.එච්.තෙන්නකෝන් (Co-I)** **ආචාර්ය සමීර ආර්. සමරකෝන් (Co-I)** **ආචාර්ය රුවන්දි රණසිංහ (Co-I)**	ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළවල ඇති මුහුදු සාර්ව ඇල්ගී වල (මුහුදු පැළෑටි) අණුක වංශ ප්‍රවේණිය සහ මුඛ පිළිකා සඳහා මුහුදු සාර්ව ඇල්ගීවලින් ප්‍රති පිළිකා සංයෝග වෙන් කිරීම	ජාතික පර්යේෂණ සභාව (NRC)	NRC Grant No 17-074	ප්‍රධාන විමර්ශකගේ ආයතනය විසින් අරමුදල් හසුරුවනු ලැබේ.
ආචාර්ය නීලිකා මලවිගේ (PI) **ආචාර්ය සමීර සමරකෝන් (Co-I)** **මහාචාර්ය කේ.එච්. තෙන්නකෝන් (Co-I)**	ඩෙංගු ආසාදනයේ ව්‍යාධිජනකතාවේදී ඩෙංගු NS1 හි කාර්ය භාරය නිශ්චය කිරීම. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවෙන්.	ජාතික පර්යේෂණ සභාව	NRC-15-014	ප්‍රධාන විමර්ශකගේ ආයතනය විසින් අරමුදල් හසුරුවනු ලැබේ.
ආචාර්ය හසිත තිසේරා (PI) **මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (Co-PI)** **ආචාර්ය ඕ. වී. ඩී. එස්. ජේ. වීරසේන (Co-PI)** **ආචාර්ය සිසිර පතිරණ (Co-PI)** **ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (Co-PI)** සකුන්තලා ජානකී මිය - විමර්ෂක සහ PhD අභ්‍යාසලාභී	Aedes මදුරුවන් තුල ඩෙංගු serotypes අවකලන හඳුනා ගැනීම සඳහා පිරිවැය ඵලදායී, නව්‍ය සමීක්ෂණ මෙවලමක් ලෙස colourimetric reverse transcription loop mediated isothermal amplificcation assay සංවර්ධනය කිරීම.	ජාතික පර්යේෂණ සභාව	NRC-19-065	අරමුදල් NRC විසින් හසුරුවනු ලැබේ
ආචාර්ය සුදේශිනි හේවගේ (PI) මහාචාර්ය රොහාන් සිරිවර්ධන (Co-PI) **මහාචාර්ය කමනී තෙන්නකෝන් (Co-PI)** මහාචාර්ය මදුනිල් නිරිඇල්ල (Co-PI) **ආචාර්ය සුමාධී ද සිල්වා (Co-PI)**	මධ්‍යසාර නොවන ස්ටීටෝහෙපටයිටිස් (steatohepatitis (NASH)) ආශ්‍රිත සිරෝසිස් වල හෙපටෝ සෛල පිළිකා (hepatocellular carcinoma (HCC)) සඳහා පුරෝකථන සලකුණු සඳහා ජාන විශ්ලේෂණය	ජාතික පර්යේෂණ සභාව	NRC-19-030	අරමුදල් NRC විසින් හසුරුවනු ලැබේ
2020 දී පර්යේෂණ ප්‍රදානයන්ගෙන් ලැබුණු සහ ලබාගත හැකි මුළු අරමුදල්				**7,850,304.00**



වගුව 4: 2020 වසරේදී පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද ආචාර්ය උපාධි (PhD) නිබන්ධන

සිසුවාගේ නම	ස්ත්‍රී/ පුරුෂ	ඇතුළත් වූ වර්ෂය	පරීක්ෂණය සඳහා නිබන්ධනය ඉදිරිපත් කළ වර්ෂය	උපාධි වැඩසටහන	ආචාර්ය උපාධි නිබන්ධනයේ මාතෘකාව	උපාධිය පිරිනැමූ වර්ෂය
ආර්. වයි. බරගමආරච්චි මිය	ස්ත්‍රී	2014	2019.10.28	PhD/ IBMBB	ශ්‍රී ලංකාවේ කෘමිනාශක ක්‍රියාකාරීත්වය සහිත Bt ඒකලනවල අණුක සහ ජෛවරසායනික ලක්ෂණ විභාගය.against *Plutella xylostella* and *Cnaphlocrosis medinalis*	2020
ඩී. එල්. පේශල ගුණසේකර මයා	පුරුෂ	2015	2020.07.01	PhD/ IBMBB	*Apis dorsata* සහ *Vespa affinis (*ගණය: *hymenoptera)* විෂෙහි ප්‍රතිශක්ති රසායනික ලක්ෂණ විභාගය සහ අදාල බටහිර විශේෂ වල විෂ සමග ඒවායේ හරස් ක්‍රියාකාරීත්වය	2020
වාහිනිප්‍රියා මනෝහරන් මිය	ස්ත්‍රී	2015	2020.11.24	PhD/ IBMBB	ශ්‍රී ලංකා රෝගීන් කාණ්ඩයක තෝරාගත් පිළිකාවල TP53 ප්‍රවේණි අණුවේ දෛහික විකෘතිතා විශ්ලේෂණය	පරීක්ෂා කෙරෙමින් පවතී



වගුව 5: විද්‍යාපති නිබන්ධන: අණුක ජීවවිද්‍යා – 2020 දී භාරදෙනලද හා 2020 දී පිරිනමන ලද උපාධි

සුචි අංකය	සිසුවාගේ නම	නිබන්ධන මාතෘකාව	අධීක්ෂකයන් / සම අධීක්ෂකයන්	උපාධිය පිරිනැමූ වර්ෂය
MLS/18/001	ඩෙනිස් කේ. මුතෝනි මයා	හයිපොක්සික් තත්වයේ වැඩුණු පියයුරු පිළිකා කඳ සෛල වලට X සංයෝගයේ ප්‍රතිඵල	ආචාර්ය සමීර ආර්. සමරකෝන්, ආචාර්ය පූර්ණා පියතිලක	2020
MLS/18/003	ඒ ඒ ජයවික්‍රම මිය	පිළිකා ප්‍රාථමික සෛල ඉලක්ක කර ගත හැකි පිළිකා නාශක ඖෂධ පරීක්ෂා කිරීම සඳහා වාර්තාකර ජාන පරීක්ෂණයක් සංවර්ධනය කිරීම	ආචාර්ය සමීර ආර්. සමරකෝන්, ආචාර්ය කණිෂ්ක සේනාතිලක	2020
MLS/18/005	ඩී ටී මහලියනගේ මිය	මෙතිලෙනෙටෙට්‍රාහයිඩ්‍රොෆොලේට් නිශ්පාදනයේ (MTHFR) ජානයේ තෝරාගත් විචල්‍ය සඳහා ශ්‍රී ලංකාවේ හෝමොසිස්ටිනියුරියා සහිත දරුවන්ගේ අධ්‍යයනය	මහාචාර්ය නිමල් පුණ්‍යසිරි, ආචාර්ය සුමාධි ද සිල්වා, වෛද්‍ය ඉරේෂා ජාසිංගේ	2020
MLS/18/006	එෆ් එන් නූහා මිය	හුදකලා වර්ධන හෝමෝන ඌනතාවයෙන් පෙළෙන දරුවන් දෙදෙනෙකු තුළ හඳුනාගෙන ඇති සම්පූර්ණ *GH1* ජාන මැකීයාමේ නිශ්චිත කඩඉම් හඳුනා ගැනීම	ආචාර්ය සුදේශිනී හේවගේ, මහාචාර්ය ශම්‍යා ද සිල්වා ආචාර්ය තර්මිනි සුන්දරලිංගම්	2020
MLS/18/009	එම් එච් එන් ජේ සමරසිංහ මිය	Cytathionine beta-synthase (*CBS*) ජානයේ තෝරාගත් ප්‍රභේද සඳහා ශ්‍රී ලංකාවේ හෝමොසිස්ටිනියුරියා සහිත ළමුන් කණ්ඩායමත් පිළිබඳ අධ්‍යයනයක්	ආචාර්ය සුමාධි ද සිල්වා, මහාචාර්ය නිමල් පුණ්‍යසිරි, වෛද්‍ය ඉරේෂා ජාසිංගේ	2020
MLS/18/010	එස් ඒ එස් එම් සමරසිංහ මිය	හුදකලා වර්ධන හෝමෝන ඌනතාවයෙන් පෙළෙන දරුවකු තුළ හඳුනාගෙන ඇති *LHX4* ජාන මැකීයාමේ නිශ්චිත ලක්ෂණ තහවුරුකර ගැනීම	මහාචාර්ය කේ.එස්.එච් ද සිල්වා, ආචාර්ය සුදේශිනී හේවගේ, ආචාර්ය තර්මිනි සුන්දරලිංගම්	2020
MLS/18/011	කේ පී ටී වී සිල්වා මිය	පියයුරු පිළිකා කඳ සෛල වලට එරෙහිව නව ඖෂධ හඳුනා ගැනීම සඳහා *in silico* හා *in vitro* පරීක්ෂාව	ආචාර්ය කණිෂ්ක සේනාතිලක ආචාර්ය සමීර සමරකෝන්	පරීක්ෂා කෙරෙමින් පවතී.



වගුව 6: විද්‍යාපති නිබන්ධන: සෛලීය හා අණුක ප්‍රතිශක්තිවේදය- 2020 දී භාරදෙනලද හා 2020 උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි පිරිනමන ලද

සුචි අංකය	සිසුවාගේ නම	පර්යේෂණ මාතෘකාව	අධීක්ෂකවරු	උපාධිය පිරිනැමූ වර්ෂය
CMI-16-005	නජුම්දීන් මොහොමඩ් කියාස් මයා	ලංකාවේ රෝගීන්ගෙන් වෙන්කර ගත් *Burkholderia pseudomallei* හි ඇති lipopolysaccharide ලිපිඩ වර්ග හඳුනා ගැනීම පිළිබඳ අධ්‍යයනය	වෛද්‍ය ඉනෝකා කොරයා ආචාර්ය නර්මදා ප්‍රනාන්දු මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති	2020
CMI-17-004	වත්සලා දිසානායක මහත්මිය	*Leptospira* සහ ප්‍රතිදේහජනක ප්‍රතිශක්තිකරණයෙන් පසු මීයන්ගේ ප්‍රතිදේහ ප්‍රතිචාර හා පරිතාන ලිම්පොසයිට උපගනනයන් හි වෙනස්කම් පිළිබඳ මූලික අධ්‍යයනයක්	මහාචාර්ය සුනිල් ප්‍රේමවංස වෛද්‍ය රජීව ද සිල්වා මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති	2020
CMI-18-001	ඩබ්. ජී.කේ. අනුරාධ මයා	ශ්‍රී ලංකාවේ *Leptospira* spp හි බහුලව පවතින සෙරෝවර් වල ප්‍රතිදේහජනක පැතිකඩ සංසන්දනය කිරීම	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති ආචාර්ය නර්මදා ප්‍රනාන්දු	සම්පූර්ණයි. උපාධිය පිරිනමා නැත
CMI-18-002	වයි බී එස් එන් ද කොස්තා මිය	*Enterobius vermicularis* බිත්තරවල ප්‍රතිදේහජනකවල ගති ලක්ෂණ හඳුනා ගැනීම	මහාචාර්ය ෂාමිනී ගුණවර්ධන ආචාර්ය එස් එල් පතිරණ	2020
CMI-18-004	අයි ඩී ජේ එච් ඉද්දගොඩ මිය	*Cocos nucifera, Artocarpus heterophyllus, Boerhavia diffusa* හා *Moringa oleifera* වල ආසාත්මිකතා ඇති කරන අසාත්මිකතාකාරක හඳුනා ගැනීම	වෛද්‍ය ධනුෂ්කා දසනායක වෛද්‍ය රජීව ද සිල්වා වෛද්‍ය නීලිකා මලවිගේ ආචාර්ය පේෂල ගුණසේකර	2020
CMI-18-005	ටී එම් රෂෙන්කා පීරිස් මිය	ශ්‍රී ලංකාවේ කුඹි විෂට ආසාත්මිකතාවන් පෙන්වන රෝගීන් ගේ, *Apis dorsata* සහ *Vespa affinis* විෂ සංඝටක වල හරස් ප්‍රතික්‍රියාකාරී ප්‍රතිදේහ පිළිබඳ අධ්‍යයන	වෛද්‍ය රජීව ද සිල්වා වෛද්‍ය ධනුෂ්කා දසනායක මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති ආචාර්ය පේෂල ගුණසේකර	සම්පූර්ණයි. උපාධිය පිරිනමා නැත.
CMI-18-006	ජේ සී තම්බිරාජා මයා	ප්‍රතිශක්ති ඌනතාවයන්ගෙන් පෙළෙන රෝගීන්ගේ ගැන්සික්ලෝවියර් ප්‍රතිරෝධී (ganciclovir resistance) UL97 ජානයේ විකෘතිතා හඳුනා ගැනීමේ මූලික අධ්‍යයනය	වෛද්‍ය ජූඩ් ජයමහ වරුණි රත්නායක මිය ආචාර්ය නර්මදා ප්‍රනාන්දු	2020
CMI-18-007	කේ වී සී විජේගුණරත්න මිය	පරිණත මානව බැසෝෆිල්ස් (KU812) මත ඩෙංගු සෙරෝටයිප් 4 හි බලපෑම හා ඩෙංගු වෛරසය ආසාදනය වූ බේසොෆිල් (*basophils*) මත ශාක නිස්සාරන සහ ඖෂධ මිශ්‍රණයන්ගේ ස්ථායීකරණ බලපෑම	ආචාර්ය නර්මදා ප්‍රනාන්දු මහාචාර්ය සුනිල් ප්‍රේමවංස මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති	2020



වගුව 7: 2020 උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනමන ලද දර්ශනසූරී (PhD) උපාධි

සිසුවාගේ නම	ස්ත්‍රී පුරුෂ බව	ඇතුළත් වූ වර්ෂය	උපාධි වැඩසටහන	නිබන්ධන / පර්යේෂණ මාතෘකාව	උපාධිය වලංගු වන දිනය
ආර් වයි බරගමආරච්චි මිය	ස්ත්‍රී	2014	PhD/ IBMBB	ශ්‍රී ලංකාවේ කෘමිනාශක ක්‍රියාකාරීත්වය සහිත Bt ඒකලනවල අණුක සහ ජෛවරසායනික ලක්ෂණ විභාගය.	2019.10.28
ඩී.එල්. පේෂල ගුණසේකර මයා	පුරුෂ	2015	PhD/ IBMBB	*Apis dorsata* සහ *Vespa affinis (*ගණය: *hymenoptera)* විෂෙහි ප්‍රතිශක්ති රසායනික ලක්ෂණ විභාගය සහ අදාල බටහිර විශේෂ වල විෂ සමග ඒවායේ හරස් ක්‍රියාකාරීත්වය	2020.07.01

වගුව 8 (අ): 2020 උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනමන ලද විද්‍යාපති උපාධි/ ප.උ. ඩිප්ලෝමා

සිසුවාගේ නම	ස්ත්‍රී පුරුෂ බව	ඇතුළත් වූ වර්ෂය	පිරිනමන ලද උපාධිය	SLQF මට්ටම	උපාධිය වලංගු වන දිනය
නාදියා මාරියම් අම්ජාද් මිය	ස්ත්‍රී	2019	අණුක ජීවවිද්‍යා විද්‍යාපති	9	2020.03.01

වගුව 8 (ආ): 2020 උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනමන ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමා

සිසුවාගේ නම	ස්ත්‍රී පුරුෂ බව	ඇතුළත් වූ වර්ෂය	පිරිනමන ලද උපාධිය/ ඩිප්ලෝමාව	SLQF මට්ටම	උපාධිය වලංගු වන දිනය
එෆ් එන් මොහොමඩ් නිසාර් මිය	ස්ත්‍රී	2019	සෛලීය හා අණුක ප්‍රතිශක්තිවේදය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	8	2020.03.01

වගුව 9: පර්යේෂණ සහායකයන්

මහාචාර්ය මාරි ඇලන්	මහාචාර්ය, ප්‍රවේණිවේද සහ ව්‍යාධිවේද, උප්සලා විශ්වවිද්‍යාලය, ස්වීඩනය
මහාචාර්ය ගෝරන් ඇන්ඩර්සන්	මහාචාර්ය, ස්වීඩන කෘෂිකාර්මික විශ්වවිද්‍යාලය, ස්වීඩනය
මහාචාර්ය ප්‍රීතිකා අඟුණවෙල	හිටපු ව්‍යාධිවේද මහාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය එරික් රඩ්ලොෆ් බොන්ග්කැම්	මහාචාර්ය, ස්වීඩන් කෘෂිකාර්මික විශ්වවිද්‍යාලය, ස්වීඩනය
මහාචාර්ය ඉක්බාල් චෞද්රි	අධ්‍යක්ෂ, HEJ පර්යේෂණ ආයතනය, කරච්චි විශ්වවිද්‍යාලය, පකිස්තානය
මහාචාර්ය රනිල් දසනායක	රසායන විද්‍යා මහාචාර්ය, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය දිලිප් ද සිල්වා	කාබනික රසායන විද්‍යා මහාචාර්ය (විශ්‍රාමික), විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ජනක ද සිල්වා	වෛද්‍ය විද්‍යා මහාචාර්ය, වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය ශම්‍යා ද සිල්වා	ළමා රෝග මහාචාර්ය, ළමාරෝග අ.ඇ. කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ටියුලි ද සිල්වා	සම්මානිත මහාචාර්ය, ලින්ක් නැවුරල් ප්‍රඩක්ට්ස් (පෞද්.) සමාගම
මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු	පරපෝෂිතවේදය පිළිබඳ මහාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ශාමිනී ගුණවර්ධන	පරපෝෂිතවේදය පිළිබඳ මහාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය සරෝජ් ජයසිංහ	සායනික වෛද්‍ය විද්‍යා මහාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය නිෂා කෝට්ටෙආරච්චි	ජෛව තාක්ෂණය පිළිබඳ මහාචාර්ය, වයඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය නීද්‍රා කරුණාරත්න	ජෛවරසායනය පිළිබඳ මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය වේරංජා කරුණාරත්න	රසායන විද්‍යා මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය නීලිකා මලවිගේ	අධ්‍යක්ෂ, ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මහාචාර්ය කීතිසන් නත්කුනාම්	ප්‍රතිශක්තිවේදය පිළිබඳ මහාචාර්ය, නිව් ඉංග්ලන්ඩ් වි.වි.ඔස්ට්‍රේලියාව
මහාචාර්ය ඇන්ඩ්‍රියස් නිට්ෂේ	වෛරස් විද්‍යා මහාචාර්ය, රොබට් කොක් ආයතනය, ජර්මනිය
මහාචාර්ය ඇන්ඩaa ගුයෙන්	අණුක ජෛවවේදය පිළිබඳ මහාචාර්ය, සිටි වි.වි, නිව්යෝක්, ඇ.එ.ජ.
මහාචාර්ය මදුනිල් අනුක් නිරිඇල්ල	ආමාශ අන්ත්‍ර විද්‍යා මහාචාර්ය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය සුනිල් ප්‍රේමවංස	සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඇලිසියෝ පැපිනි	අධ්‍යක්ෂ, සර්ම කලාපීය ඖෂධාගාරය, ෆ්ලෝරන්ස් වි.වි., ඉතාලිය
මහාචාර්ය සේනක රාජපක්ෂ	අධ්‍යක්ෂ PGIM, සායනික වෛද්‍ය විද්‍යා මහාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ශ්‍රී රාජීව්	පශු වෛද්‍ය විද්‍යා මහාචාර්ය, St Kitts විශ්වවිද්‍යාලය බ.ඉ.කොා
මහාචාර්ය මානසා රාඝවන්	සහය මහාචාර්ය, මානව ජාන අ.ඇ, චිකාගෝ වි.වි., ඇ.එ.ජ.
මහාචාර්ය ඩබ්ලිව්. ඩී. රත්නසූරිය	සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය සුරංජිත් සෙනවිරත්න	ප්‍රතිශක්තිවේදය පිළිබඳ මහාචාර්ය, රෝයල් ප්‍රී රෝහල සහ ප්‍රතිශක්ති ඌනතා මධ්‍යස්ථානය, ලන්ඩන් වි.වි., එ.රා.
මහාචාර්ය ඇලෙසැන්ද්‍රෝ සෙටී	ප්‍රතිශක්තිවේදය පිළිබඳ මහාචාර්ය, අසාත්මිකතා හා ප්‍රතිශක්තිවේදය පිළිබඳ ලා ජොලා ආයතනය, ඇ.එ.ජ.
මහාචාර්ය රොහාන් සිරිවර්ධන	ආමාශ ආන්ත්‍ර විද්‍යාව සහ රක්තපාත සැත්කම් පිළිබඳ මහාචාර්ය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය රාජ් සෝමදේව	පුරා විද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කැළණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය කේ. තංගරාජ්	අධ්‍යක්ෂ, ඩීඑන්ඒ ඇඟිලි සලකුණු හා රෝග නිර්ණය මධ්‍යස්ථානය (CDFD), හයිද්‍රාබාද්. ජේෂ්ඨ ප්‍රධාන විද්‍යාඥ, සෛලීය හා අණුක ජීව විද්‍යා මධ්‍යස්ථානය (CCMB), හයිද්‍රාබාද්, ඉන්දියාව

මහාචාර්ය ශ්‍යාමා වීරකෝන්	උද්භිද විද්‍යා මහාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මහාචාර්ය රාජිත වික්‍රමසිංහ	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය
ආචාර්ය අච්චුත් අධිකාරි	සහාය මහාචාර්ය, HEJ රසායන විද්‍යා ආයතනය, පකිස්ථානය
ආචාර්ය නවෝදා අතපත්තු	ළමා අන්තරාසර්ග විද්‍යා විශේෂඥ උපදේශක, LRH
වෛද්‍ය ඉනෝකා කොරයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය දිල්ෂානි දිසානායක	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය දිලන්ති වරාවිටගේ	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය සෙල්වලක්ස්මි වෙල්වේන්දන්	කාර්මික තාක්ෂණ ආයතනය
වෛද්‍ය ධනුෂ්කා දසනායක	විශේෂඥ ප්‍රතිශක්තිකරණවේදී, ශික්ෂණ රෝහල, මහනුවර
ආචාර්ය දර්ශන් ද සිල්වා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන
වෛද්‍ය කණිෂ්ක ද සිල්වා	ගණ්ඩවේදී ශල්‍ය වෛද්‍ය විශේෂඥ, ජාතික පිළිකා ආයතනය
වෛද්‍ය රජීව ද සිල්වා	විශේෂඥ ප්‍රතිශක්තිකරණවේදී, වෛද්‍ය පර්යේෂණ ආයතනය
ආචාර්ය එන්. දෙවිප්‍රිය	SASTRA විශ්වවිද්‍යාලය, ඉන්දියාව
ආචාර්ය කුමුදු ප්‍රනාන්දු	හිටපු අධ්‍යක්ෂ, කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, පේරාදෙණිය වි.වි.
වෛද්‍ය ගීතානි ගලගොඩ	වෛරස අධ්‍යයන විශේෂඥ වෛද්‍ය, ලංකා හොස්පිට්ල්
ආචාර්ය දිනාරා ගුණසේකර	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය
ආචාර්ය පේශල ගුණසේකර	පර්යේෂණ විද්‍යාඥ, KDU
ආචාර්ය නදීක ජනගේ	වෛරස අධ්‍යයන විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය පර්යේෂණ ආයතනය, කොළඹ 8
වෛද්‍ය ඉරේෂා ජාසිංගේ	රසායනික ව්‍යාධි විද්‍යා විශේෂඥ වෛද්‍ය,LRH
ආචාර්ය සූඩ් ජයමහ	වෛරස අධ්‍යයන විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය පර්යේෂණ ආයතනය
වෛද්‍ය ලිලානි කරුණානායක	ක්ෂුද්‍රජීව විද්‍යා විශේෂඥ වෛද්‍ය , වෛද්‍ය පර්යේෂණ ආයතනය
ආචාර්ය සුරංග මානිල්ගම	MO, සෞඛ්‍ය අමාත්‍යාංශය
වෛද්‍ය රෝහිත මූතුගල	වෛරස අධ්‍යයන විශේෂඥ වෛද්‍ය, සෞඛ්‍ය අමාත්‍යාංශය
වෛද්‍ය ධනංජා නාමලී	සෞඛ්‍ය අමාත්‍යාංශය
ආචාර්ය ඉනෝකා පෙරේරා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සත්ව විද්‍යා අ.අ., කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය ජී. ඒ. සිරිමල් ප්‍රේමකුමාර	අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික තාක්ෂණ ආයතනය
වෛද්‍ය ගයනී ප්‍රේමවංශ	විශේෂඥ වෛද්‍ය, උතුරු කොළඹ ශික්ෂණ රෝහල, රාගම
ආචාර්ය රිසින්ත ප්‍රේමරත්න	විද්‍යාඥ, WHO-SEARO, WHO
ආචාර්ය නිරාජ් රායි	“C” විද්‍යාඥ, ඉන්දියාවේ බර්බල් ශානි භූ විද්‍යා ආයතනය
ආචාර්ය රාධිකා සමරසේකර	අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික තාක්ෂණ ආයතනය
ආචාර්ය අසිත සිරිවර්ධන	විද්‍යාඥ, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය
වෛද්‍ය සාරංග සුමතිපාල	MO, සෞඛ්‍ය අමාත්‍යාංශය
ආචාර්ය හසිත තිසේරා	සෞඛ්‍ය අමාත්‍යාංශය
ආචාර්ය වී වඩිවෙල්	SASTRA වි.වි. , ඉන්දියාව
ඩී. කොට්ටවආරච්චි මයා	පර්යේෂණ නිලධාරී, තේ පර්යේෂණ ආයතනය, තලවකැලේ
යූ.කේ. ගලප්පත්ති	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලය
මෙන්ඩිස් වික්‍රමසිංහ මයා	සභාපති, ශ්‍රී ලංකා උරගවිද්‍යා සංගමය

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(සංඛ්‍යා ආසන්නම රුපියලට ගලපා ඇත.)

	සටහන	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම වත්කම්			
බැංකු ශේෂ	සටහන - 02	18,028,530	18,888,707
වෙනත් ලැබිය යුතු දෑ	සටහන - 03	4,857,466	3,865,110
අත්තිකාරම්	සටහන - 04	13,425	929,981
කාර්ය මණ්ඩල ණය	සටහන - 05	1,247,337	760,890
ආයෝජන	සටහන - 06	18,842,393	20,193,759
රසායන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ		3,690,480	6,797,539
		46,679,631	**51,435,986**
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	සටහන - 07		
ගොඩනැගිලි		35,067,394	40,922,625
මෝටර් වාහන		3,093,002	3,608,502
පුස්තකාල පොත් සහ වාර සඟරා		1,133,572	1,888,393
රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ		27,057,471	38,062,771
පරිගනක		6,245,773	7,856,195
කාර්යාල භාණ්ඩ හා උපකරණ		13,329,847	14,936,558
කාර්ය මණ්ඩල ණය	සටහන - 05	2,101,498	2,613,079
ආයෝජන	සටහන - 06	34,173,243	31,382,498
		122,201,800	**141,270,623**
මුළු වත්කම්		**168,881,430**	**192,706,609**
බැරකම්			
ජංගම බැරකම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	සටහන-09.01	634,799	-
ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු		66,412	66,412
ආපසු ගෙවන රසායනාගාර තැන්පතු		4,474,573	4,024,573
උපචිත වියදම් සහ අනෙකුත් ගෙවීම්	සටහන -08	6,822,089	2,626,019
		11,997,873	**6,717,004**
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	සටහන -09	30,222,309	20,469,854
විගණන ගාස්තු ප්‍රතිපාදන		1,288,517	1,176,517
පර්යේෂණ ප්‍රදානයන්	සටහන -10	7,710,013	9,661,438
විලම්බිත ආදායම	සටහන -11	1,031,227	6,815,051
		40,252,066	**38,122,860**
මුළු බැරකම්		**52,249,939**	**44,839,864**
ශුද්ධ වත්කම්		**116,631,492**	**147,866,774**

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ඉතිරිය)

	සටහන	2020 රු.	2019 රු.
<u>කොටස් / ශුද්ධ වත්කම්</u>			
<u>ප්‍රාග්ධනය</u>			
වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන	සටහන -20	(8,906,970)	10,357,788
වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන		6,958,503	11,668,759
ත්‍යාග සහ පරිත්‍යාග		122,247,858	46,271,334
		120,299,391	68,297,881
<u>සමුච්චිත අරමුදල</u>			
තබා ගන්නා ලද ඉපැයුම් ගිණුම		(66,662,886)	16,484,059
ප්‍රත්‍යාගණන අතිරික්තය/(හිඟය)		38,564,539	38,564,539
		(28,098,347)	55,048,597
<u>සීමිත අරමුදල්</u>			
ආයතන සංවර්ධන අරමුදල		8,323,415	8,392,714
පරිත්‍යාග අරමුදල		3,221,903	3,221,903
වත්කම් ප්‍රතිස්ථාපන අරමුදල		12,885,130	12,905,649
		24,430,448	24,520,266
මුළු කොටස් / ශුද්ධ වත්කම්		**116,631,492**	**147,866,744**

සකස් කරන ලද්දේ සහ සහතික කළේ

.....	.....
නි. මූල්‍යාධිකාරී	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

අංක 6 සිට 10 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 11 සිට 15 පිටුවල දැක්වෙන අනෙකුත් සටහන් මේ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසක් වේ. මේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

.....	.....
මණ්ඩල සාමාජික	අධ්‍යක්ෂ / මණ්ඩල සාමාජික

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

		2020	2019
		රු.	රු.
ආදායම්			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය		95,100,000	77,500,000
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රජයේ ප්‍රදානය		2,824,714	4,027,952
ස්ථාවර වත්කම් ක්‍රමක්ෂය		24,789,600	17,929,943
පර්යේෂණ ප්‍රදානයන්	සටහන – 12	4,861,593	14,612,233
උත්පාදිත ආදායම	සටහන – 13	15,962,443	11,984,811
පොලී ආදායම		5,556,852	7,195,588
වෙනත් ආදායම්	සටහන - 14	262,592	360,808
		149,357,793	**133,611,335**
අඩුකළා : වියදම්			
පෞද්ගලික වැටුප් හා චේතන	සටහන - 15	84,463,850	78,108,109
ප්‍රවාහන		64,892	144,406
සැපයුම්	සටහන - 16	13,030,002	9,543,309
නඩත්තු වියදම්	සටහන - 17	4,298,646	5,864,027
කොන්ත්‍රාත් සේවා	සටහන - 18	14,693,792	18,226,387
වෙනත් පුනරාවර්තන වියදම්	සටහන - 19	2,969,905	5,703,855
පාරිතෝෂික		10,387,254	13,188,782
ක්ෂය		26,630,815	18,978,785
		156,539,156	**149,757,660**
වියදමට වඩා ආදායමේ අතිරික්කය/ හිඟය		**(7,181,363)**	**(16,146,325)**



ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		රු.	රු.
වර්ෂයේ හිඟය			(7,181,363)
එකතුකළා:	**අරමුදල් සංචලනයක් නැති අයිතම සඳහා ගැලපීම**		
	පාරිතෝෂික ප්‍රතිපාදන	10,387,254	
	විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	400,000	
	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා ලැබුණු රජයේ ප්‍රදාන	(2,824,714)	
	ස්ථාවර වත්කම් ක්‍රමක්ෂය කිරීම	(24,789,600)	
	ක්ෂයවීම	26,630,815	
	වත්කම් බැහැර කිරීමෙන් ලද පාඩුව	144,575	
	පොළී ආදායම	(5,556,852)	
	රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ	12,261,979	
	ඇවර කරන ලද හානි	(153,140)	
අඩුකළා:	ගෙවන ලද විගණන ගාස්තු	(288,000)	
	රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ මිලදී ගැනීම	(9,154,919)	
	කාරක ප්‍රාග්ධන ගාස්තුවලට පෙර මෙහෙයුම් හිඟය	**7,057,397**	
	ලැබිය යුතු මුදල් වැඩිවීම	(933,620)	
	ගෙවිය යුතු මුදල් වැඩිවීම	5,280,869	11,404,646
මූල්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ			4,223,283
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහයන්			
	පොලී ආදායම	1,873,109	
	මුදල් වෙළෙඳපොළ පොළිය	1,106,268	
	ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	(5,423,002)	
	ආයෝජනවල අඩුවීම	1,515,934	
	බැහැර කිරීම් විකිණීමෙන් ආදායම්	30,000	(897,691)
මූල්‍ය සම්පාදන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහයන්			
	ආයතන සංවර්ධන අරමුදල	40,000	
	විලම්බිත ආදායම	(5,783,824)	
	වත්කම් ප්‍රතිශ්ඨාපන අරමුදල	(20,520)	
	පර්යේෂණ ප්‍රදානයන්	(1,951,425)	
	ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය	3,530,000	(4,185,769)
මුදල් හා සමාන දේවල ශුද්ධ වැඩිවීම			**(860,177)**
	කාලසීමාව ආරම්භයේදී මුදල් සහ මුදල්වලට සමාන දෑ		18,888,707
	කාලසීමාව අවසානයේදී මුදල් සහ මුදල්වලට සමාන දෑ		**18,028,530**



2020/12/31 දිනෙන් අවසන් වූ වර්ෂයේ කොටස් / ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල රු.	වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය රු.	ආයතන සංවර්ධන අරමුදල රු.	උපපාදන අරමුදල රු.	වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.	වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.	ත්‍යාග හා පරිත්‍යාග රු.	ප්‍රත්‍යාගණන සංචිතය රු.	එකතුව රු.
2019 දෙසැ. 31 දිනට ශේෂය	**16,484,059**	**12,905,649**	**8,392,714**	**3,221,903**	**10,357,788**	**11,668,759**	**46,271,334**	**38,564,539**	**147,866,745**
කාලසීමාව සඳහා අතිරික්ත/ හිඟ	(7,181,363)								(7,181,363)
ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානය						3,530,000			3,530,000
වර්ෂය තුළ මිලදී ගැනීම්		(20,520)			5,415,542	(5,415,542)			(20,520)
සීමිත අරමුදලට මාරු කිරීම			40,000						40,000
සුභසාධක අරමුදලට මාරු කිරීම									-
සීමිත අරමුදල් සඳහා පොළිය									-
පර්යේෂණ අරමුදලට මාරු කිරීම්	(48,558)								(48,558)
උපචිත පොලී ආදායම									-
වර්ෂය තුළ වැය කරන ලද/ වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදානය									-
පුනරුත්ථාපනයට මාරු කිරීම						(2,824,714)			(2,824,714)
ආදායමට මාරු කිරීම්									-
විශේෂිත අභ්‍යන්තර මාරුකිරීම්වල වැඩිවීම									-
මාරු කිරීම්	25,000						75,976,524		76,001,524
ක්‍රමක්ෂය ගැලපුම්	(75,942,024)		(109,299)		(24,680,300)				(100,731,622)
2020 දෙසැ. 31 දිනට ශේෂය	**(66,662,886)**	**12,885,129**	**8,323,415**	**3,221,903**	**(8,906,970)**	**6,958,503**	**122,247,858**	**38,564,539**	**116,631,492**

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

සටහන - 01

1. මූලික ගිණුම් ප්‍රතිපත්ති

1. වාර්තා කරන ආයතනය

අංක 1825/25 දරන ආඥා පනත යටතේ සංස්ථාපිත IBMBB ආයතනය පිළිබඳව 2003 අප්‍රේල් 23 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ප්‍රධාන පරිපාලන ආයතනය පිහිටා ඇත්තේ කොළඹ 03, කුමාරතුංග මුනිදාස මාවතේ අංක 90 දරන ස්ථානයේ ය. IBMBB හි මූල්‍ය ප්‍රකාශය පිළියෙල කර ඇත්තේ 2020.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහාය.

2. මූලික ගිණුම් ප්‍රතිපත්ති

2.1. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් තැබීමේ ඓතිහාසික පිරිවැය පදනම මත ය. යොදා ගනු ලැබ ඇති සියලුම ගිණුම් ප්‍රතිපත්ති පූර්ව වර්ෂයේ ප්‍රතිපත්තිවලට අනුරූප වන ලෙස යොදා ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී, ප්‍රවර්තන වර්ෂයේ සංඛ්‍යා ඉදිරිපත් කිරීමේදී වෙනස්කම් සනාථ කිරීම සඳහා ගලපනු ලැබ ඇත.

ක්‍රියාත්මක වන සහ පිළියෙල කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ.

2.2. විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සියල්ල ගිණුම්ගත කර ඇත්තේ ගනුදෙනු සිදු වූ අවස්ථාවේදී පැවැති විනිමය අනුපාත අනුව ය. එවැනි ගනුදෙනු පියවීමෙන් සහ විදේශ ව්‍යවහාර මුදල්වලින් මූලික වශයෙන් සිදු වන මූල්‍ය වත්කම්වලින් හා බැරකම්වලින් ඇති වන ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශනයේදී ගණන් ගනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් මූලික වශයෙන් සිදු වන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍ර දිනට පවත්නා විනිමය අනුපාත අනුව පරිවර්තනය කරනු ලැබේ.

2.3. වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම්

2.3.1. දේපළ, පිරියත සහ උපකරණ (PPE)

කොළඹ විශ්වවිද්‍යාලය විසින් ලබාදුන් තොරතුරු අනුව ගොඩනැගිල්ල අත්පත් කරගත් දිනය 2007. 01.01 වන අතර මෙය 2020 ජනවාරි 01 වන දින සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. කොළඹ විශ්වවිද්‍යාලය විසින් IBMBB වෙත නීත්‍යානුකූල අයිතිය පවරනු ලැබ නැති නිසා ඉඩමේ සහ ගොඩනැගිල්ලක වටිනාකම දේපළ, පිරියත හා උපකරණවලට ඇතුළත් වී නැත.

දේපළ, රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණවලට ඇතුළත් වන්නේ රජයේ ප්‍රදානයන්, පර්යේෂණ ප්‍රදානයන්, අභ්‍යන්තර වශයෙන් උත්පාදිත අරමුදල් හා පරිත්‍යාගවලින් මිලදී ගත් අයිතමයන්ය.

දේපළ, පිරියත සහ උපකරණ වාර්තා කරනු ලබන්නේ ඒවායේ කවර හෝ ආනුෂංගික වියදම් ද ඇතුළුව මිලදී ගැනීමේ පිරිවැයට ය. වත්කම් ප්‍රකාශ කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය වීම අඩු කොට පිරිවැයට ය. ප්‍රදානයන් වශයෙන් ලැබුණු වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට අගය කරනු ලැබ ඇත.

2.3.2. හානිකරණය

වත්කමක පවත්වාගෙන යෑමේ ප්‍රමාණය එයින් ලබාගත හැකි ප්‍රමාණයට වඩා ම ලියා අඩු කරනු ලබන අතර එවැනි අඩු කිරීමක් වියදමක් වශයෙන් වඩා ම ගණන් ගනු ලැබේ.

2.3.3. ක්‍රමක්ෂය

ආදායම් ප්‍රකාශයේදී ක්‍රමක්ෂය පිළිගනු ලබන්නේ වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය තුළ සෘජු රේඛීය පදනමක් මතය.

2.3.4. බැහැර කිරීමේදී ලාභය හෝ පාඩුව

බැහැර කිරීමේදී ලාභ සහ පාඩු නිගමනය කරනු ලබන්නේ ලැබෙන ප්‍රමාණය පවත්වාගෙන යෑමේ ප්‍රමාණය සමඟ සැසඳීමෙනි. ඒවා ආදායම් ප්‍රකාශයට ඇතුළත් වේ.

2.3.5. පසුව ඇතිවන පිරිවැය

පසුව ඇතිවන පිරිවැය වත්කමේ පවත්වාගෙන යෑමේ ප්‍රමාණයට ඇතුළත් කරනු ලැබේ. නැතහොත්, අයිතමවල අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබීමට හැකියාවක් ඇත්නම් සහ අයිතමවල පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකිනම් පමණක්, සුදුසු පරිදි වෙන ම වත්කමක් වශයෙන් ඇතුළත් කරනු ලැබේ. අනෙකුත් සියලු ම අලුත්වැඩියාවන් හා නඩත්තු කිරීම්, ඒවා සිදු වන මූල්‍ය කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශනයෙන් අඩු කරනු ලැබේ.

2.3.6. ක්ෂය වීම

මිලදී ගත් දිනයන් දන්නා වත්කම්වල ක්ෂය වීම දක්වනු ලබන්නේ සම්පූර්ණ කරන ලද හෝ මිලදී ගත් දිනයේ සිට එවැනි වත්කම් භාවිත කරනු ලැබූ මාස ගණනට සමානුපාතිකවය. මිලදී ගත් නියම දිනය නොදන්නා වත්කම් සම්බන්ධයෙන් ඒවා මිලදී ගනු ලැබූ සම්පූර්ණ වර්ෂයට ක්ෂය වීම ගණන් ගනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයේදී වත්කම්වල මාස ගණනට සමානුපාතිකව විකිණීමේ / බැහැර කිරීමේ වර්ෂය තුළ ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

සියලු ම දේපළවල සහ උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන් තුළ පිරිවැය කපා හැරීම සඳහා සෘජු රේඛීය පදනමක් මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතවලින් ආදායමෙන් ක්ෂයවීම අඩු කරනු ලැබේ :



ක්ෂය කිරීමේ අනුපාත

- ගොඩනැගිලි - වර්ෂයකට 5%
- වාහන - වර්ෂයකට 10%
- වැද්දුම් සහ සවිකිරීම් - වර්ෂයකට 10%
- කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ - වර්ෂයකට 10%
- පරිගණක - වර්ෂයකට 20%
- රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ - වර්ෂයකට 20%
- පුස්තකාල පොත් සහ වාරසඟරා - වර්ෂයකට 20%

2.3.7. තොගය

තොගය, වඩා අඩු පිරිවැයට අගය කිරීම හෝ උපලබ්ධ කළ හැකි ශුද්ධ අගයට ඇස්තමේන්තු කිරීම හෝ සිදුකරනු ලැබේ. ශුද්ධ උපලබ්ධ කළ හැකි අගය යනු තොගවල තිබෙන අලෙවි කළ හැකි අගයෙන් උපලබ්ධවීමේ පිරිවැය සහ/හෝ උත්පාදන පිරිවැය අඩු කිරීමෙන් පසු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී තොගය අලෙවි කළ හැකි මිලය.

ගබඩා වල තොග මිල ගණන් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් පදනම මත තක්සේරු කර ඇත.

2.3.8. ලැබියයුතු දෑ

ලැබිය යුතු දේ ඒවායේ ඇස්තමේන්තුගත උපලබ්ධිවීමේ ප්‍රමාණයන් මත සඳහන් වේ.

2.3.9. මුදල් හා මුදල්වල සාම්‍යයන්

